ISSN 2950-6999

# e නිර්මාණී MAGAZINE

VOLUME 1 | ISSUE 1 | JULY 2022

## මෙවර කලාපය ආදරණීය පියවරුන් වෙනුවෙන් පිදෙන වගයි



Students

Teachers

Education Officers

කවි ගී චිත්‍ර නිසඳැස් පෝස්ටර්

Image - Designed by Freepik

Distance Learning mission Sabaragamuwa Provincial Department of Education

Volume One - © 2022 Department of Education Sabaragamuwa

# Editorial Board


*Guidence and Instructions-*

**Mr. Sepala Kuruppuarachchi**
Provincial Director of Education
Sabaragamuwa Province

**Mr. Lakmal Eranda Kumara**
Deputy Director of Education
Sabaragamuwa Province

*Supervision*

**Mr. S.P. Jesupillai**
Assistant Director of Education
Sabaragamuwa Province

*Editor-in-Chief*

**Mr. Janaka Pushpakumara**
Sri Lanka Teacher Service
Kahawatta Central College
Kahawatta

*Co-Editor*

**Mrs. H.M.A. Sumithra Herath Menike**
Sri Lanka Teacher Service
ITDLH
Balangoda

*Editors*

**Mr. H.M. Wijewardana** - Rambuka Maha Vidyalaya
**Mrs. P. Sirilani Fonseka**- ITDLH Balangoda
**Mr. B.L. Sarath Bogahapitiya** -ITDLH Godakawela
**Mr. H.S.N. Ranjith** - ITDLH Kolonna
**Mr. G.R.M.J. Thilakarathne** - ITDLH Mawanella
**Mrs. M.R.F. Rizana Razick** - KG/MW/ Baduriya Central College
**Mr. M.B. Manjula Prabhath Jayarathne** - ITDLH Balangoda
**Mrs. H.M. Neluka Gunathilaka** -ITDLH Balangoda
**Mr. W.K.T.C. Amarasiri** - ITDLH Kolonna
**Mrs K.K. Irosha Udayangani** -ITDLH Balangoda
**Miss W.D.K. Madhushika** - Atalugama Edu. Center
**Miss Y.O. Amarasinghe** - R/Kahawatta Central College RNCOE Internee

*Technical Editor*

**Mr. A.M. Rajah** Education Research Center Atalugama




# පෙරවදන

නිර්මාණශීලීත්වය පුබුදු කිරීම මිනිස්කම අවදි කරන සුවිශේෂී මාවතට පිවිසීම සටහන් කරයි. **සබරගමු පළාත් දුරස්ථ අධ්‍යාපන මෙහෙවර ඊ-නැණපියස** විසින් එළිදක්වන නිර්මාණී එවන් කුසලතා පූර්ණ මගට පිළිපන් දරුවන්, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පති වරුන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන් ආදී සහෘදයන්ගේ නිර්මාණ සමුච්චයකි. විවිධ දුෂ්කරතාවයන්ට ලක්මව මුහුණ දෙමින් සිටින මෙවන් අවධියක අභියෝගයන්ට නොබියව මුහුණ දෙමින් මෙවන් විශ්වසනීය කාර්යයකට නිවැරදි දිශානතිය විවෘත කිරීමට කටයුතු කළ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ලක්මාල් එරන්ද කුමාර මහතාටත්, ස්වකීය අත්දැකීම් තුළින් පරිණතව නිවැරදිව ශාස්ත්‍රීය නිර්මාණාත්මක පසුබිමක රැඳෙමින් මග පෙන්වන සබරගමු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සේපාල කුරුප්පුආරච්චි මහතාටත්, විෂය බාහිර ක්‍රියාකාරකම් වලින් දරු පරපුර පෝෂණය කිරීමට දිරි දෙමින් මෙම ප්‍රයත්නයට එක්වූ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.පී. ජේසුපිල්ලේයි මහතාටත් මෙවන් උදාර මෙහෙවරක සාර්ථකත්වයෙහි එල නෙලාගැනීමට සංස්කරණ මෙහෙවර ඉටු කළ ජානක පුෂ්පකුමාර මහතා සුමිත්‍රා හේරත් මහත්මිය ඇතුළු සංස්කාරක මණ්ඩලයටත් මගේ සුහදතාව පිරිනමනු කැමැත්තෙමි.

පාසල් අවධියේ සිටම නිර්මාණකරණයට පිවිසීම ප්‍රවීණත්වයට පත් වීමේ ස්වර්ණමය මාවත සනිටුහන් කරයි. නිර්මාණ සැපයූ දරු දැරියන්ටත්, මග පෙන්වූ ගුරු පරපුරටත් මාගේ සුභාශිංසන පිරිනමන්නේ නිර්මාණ තුළින් ඔවුන් හඳුනා ගැනීමට හැකිවූ බැවිනි.

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් කාව්‍ය නිර්මාණ මෙන්ම පෝස්ටර් තුළින් පිය ගුණ පිළිබඳ ප්‍රදීපස්ථම්භනයෙහි ආලෝක කදම්භ විඳ ගැනීමට දැරූ විශිෂ්ට ප්‍රයත්නයක සමාරම්භයට දායකත්වයක් දීමට ලැබීම පිළිබඳව මම සතුටට පත්වෙමි. ස්වීය අත්දැකීම් ස්පර්ශ කරමින් පිය සෙනෙහස දෙස ආපසු හැරී බැලීමේ කෘතවේදීත්වය මෙන්ම හදවතේ නිපන් සෙනෙහසෙහි දෝංකාරය නිර්මාණ ඇසුරින් නැගෙන රිද්මයයි. ඔබේ හදමල කුසුමක් කොට පිය සෙනෙහස පුදසුනෙහි තබමින් පුදන ලද වන්දනීය නිර්මාණ තුළ පිය සෙනෙහසෙහි සදා අනුස්මරණීය සුවඳ වහනය වන බව කියනු කැමැත්තෙමි.

ලෝකය එක් පිය දිනයක්, මව් දිනයක්, සොයුරු දිනයක් නම් කර ඇතත් අදීන හෙළ සංස්කෘතියේ සෑම දිනයක්ම මෙම උදාර සැමරුම් වන්දනීයව සිහිපත් කරන දින බව අප තේරුම්ගත යුතුය. බුදුසමයෙන් ජනිතව, වර්ධිතව හින්දු,කිතුනු දහමෙන් පෝෂිතව වැඩෙන මනුෂ්‍යත්වයේ විශිෂ්ට වූ සිසිලස පිය සෙනෙහසින් මූර්තිමත් වන නිර්මාණ කිහිපයක්ම අප හදගැඹර කම්පනය කරයි.

සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව පරිගණක ආශ්‍රිත ක්‍රියාකාරකම් වලින්, රටට රජයට පරමාදර්ශ ලබාදුන් තෝතැන්නකි. එතුලින්ම ම සම්මානිත වූ ක්ෂේත්‍රයකි . එවන් පැහැබර බිමක ජනිත නිර්මාණ විවිධ දිශානති ඔස්සේ සාර්ථක පියවර තබමින් ගමන් කරන බවට මා තුළ ඇත්තේ අචල විශ්වාසයකි. කාව්‍යකරණයේ මූලික නීති රීති පිළිබඳ ඉගෙන ගැනීමත්, සම්මානිත සම්භාවනාවට පාත්‍ර වූ සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කිරීමත් අතිශය වැදගත් බව ආධුනික නිර්මාණකරුවන්ට සිහිපත් කරනු කැමැත්තෙමි. කාව්‍ය භාෂාව මැනවින් භාවිත කළ, කාව්‍යෝක්ති වලින් සපිරි නිර්මාණ රැසක් මෙම සමුච්චයේ තිබෙන බව සටහන් කරන්නේ වගකීමකින් යුතුවය.

සත්‍යය අත්දැකීමට මුහුණ දීම, අත්දැකීමේ සත්‍ය තේරුම් ගැනීම, එම සත්‍ය මත පිහිටා පරිකල්පනය කිරීම හා එම පරිකල්පනයෙන් පෝෂිතව නිර්මාණ ඉදිරිපත් කිරීම නිර්මාණකරණයේ මූලික අදියර යි. එම කුසලතාව ප්‍රවර්ධනය කළ යුතුය. "***නිර්මාණ කරන්නීය***" යන අරුතින් සපිරි **නිර්මාණී** බිහිකළ මෙම අංකුර කලාකරුවන් රටට වැඩ සදන නිර්මාණකරුවන් වනතුරු ලක්මව බලාපොරොත්තු සහගතව බලා සිටින්නීය.



**මහාචාර්ය කමල් වලේබොඩ**
**කොළඹ විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍ය අධ්‍යයන අංශයේ හිටපු අංශාධිපති**

# පියාණෙනි

නෙත කඳුලු නොසලා
දහදිය කඳුලු වගුරා
දිවි මගෙහි යස ඉසුරු වඩවා
දුක තුනී කර සතුට රැඳවු
ඔබයි ඒ පියාණන් ...

මුවින් නොබනින
නෙතින් පවසන
බොහෝ වදනින් ඔවා මිණි දී
ගැහැට දුරලා, පහස රැඳවූ
ඔබයි ඒ පියාණන් ...

දිවියට නොදී සහනය
දරු පෙමට කර දිවිය දහනය
සිහිනෙන් ද දරු පෙමට කැපවී
දිවිය ඔපවත් කරන දිරි දී
ඔබයි ඒ පියාණන් ...

පියාණෙනි ඔබ දිවිය දන් දුන්
දරුවන්ගෙ හිත නැඟෙන හැඟුමන්
බලනු මැන, එය සිතින් විඳිමින්
කඳුලු නොහෙළා ඉන්න සතුටින් ...

*ජාත්‍යන්තර පියවරුන්ගේ දිනය වෙනුවෙන්*
*"නිර්මාණී" මාර්ගගත සඟරාව වෙත*
*පිය ගුණ ගැයූ සැමට සුබ පතමි ..*



**සේපාල කුරුප්පු ආරච්චි**
**සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ**




# The utmost confidence and dearly trust

පියවරු සෑම විටම
තම දරුවන්
සතුටින් තැබීමට වගබලා ගනිති.
නමුත් ශ්‍රේෂ්ඨ පියවරු
ඔවුන් නැති වී බොහෝ
කලකට පසු වුවද තම
දරුවන්ගේ හදවත් තුළ
සදාතනික මතකයන් ජනිත කරති.
අඳුරුතම රාත්‍රියක් පවා
දහවලක් බවට පත්
කිරීමට එවන් ශ්‍රේෂ්ඨ
පියවරුන්ට පුළුවන්.
නිර්මාණී මාර්ගගත සඟරාව
එවන් ශ්‍රේෂ්ඨ පියවරුන්ට
උපහාරයක්ම වේවා!



කේ. ලක්මාල් එරන්ද කුමාර
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
(සංවර්ධන)
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ගැටන්ගම, රත්නපුර

සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ අදහසක් අනුව,
ජාත්‍යන්තර පියවරුන්ගේ දිනය වෙනුවෙන් නිර්මාණය වෙන නිර්මාණී
සඟරාවට දායක වීමට ලැබීම මා ලද භාග්‍යයක්. මෙම සඟරාව
නිර්මාණය කිරීමේ පුවත දැන ගත් දා පටන්, නිර්මාණ දෙසීයක් පමණ
අපට එවූ ආදරණීය දූ දරුවන්ට අපගේ ස්තුතිය පිරිනමන්න අප
කැමැතියි. ලේඛන කලාව, තමුන්ගේ හැකියාව වර්ධනය කිරීමට
පමණක් නොව, තමුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් ලෙස
යොදා ගන්නට, අනෙක් අයවත් වෙනස් කිරීමට, ඒ අයගේ ජීවිත
පැවැත්ම යහපත් අතට හරවන්නට හොඳ මාධ්‍යයක් හැටියට
මා දකිනවා.

විශේෂයෙන් නිවසේම රැඳී සිටින මෙවන් වකවානුවේ මෙවැනි
නිර්මාණයක් ඇසුරෙන් දූ දරුවන්ගේ හැකියා ප්‍රදර්ශනය කිරීමට
ලැබීම අප කාගේත් භාග්‍යයක්. මෙම කර්තව්‍යය ඉටු කරන්නට
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ලක්මාල් එරන්ද කුමාර මැතිතුමා
ගත් උත්සාහය අතිශයින් අගය කරමි.

එවගේම මෙම සඟරාවට සම්බන්ධ වන ඊ-නැණපියස කණ්ඩායමේ
සුමිත්‍රා ගුරුතුමිය හා ජානක ගුරුතුමා යන දෙදෙනාගේ කාර්යභාරය
අතිශයින්ම අගය කරනවා මේ නිර්මාණය කරන්න දායක වුණු ඒ අයටත්
මගේ ස්තුතිය මම පුද කරනවා.

හැමදාම මෙවැනි නිර්මාණ ඉදිරිපත් කරමින් ඔබේ හැකියාව ද වර්ධනය
කරගනිමින් ලෝකයට යම් ආලෝකයක් එකතුකරන්නට වෙහෙසෙන
ලෙස ලේඛන කලාවට සම්බන්ධ සියලු දෙනාට මම ආරාධනා කරනවා.

*ස්තුතියි.!*



*එස්.පී. ජේසුපිල්ලෙයි*
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ගැටන්ගම, රත්නපුර

# தினமென்று கொண்டாடுவதில் தவறேதுமில்லை



தினமென்று கொண்டாடுவதில்
உடன்பாடில்லை
தினசரி கொண்டாட வேண்டியதால்
தந்தையர் தினமென்று
கொண்டாடுவதில் உடன்பாடில்லை
தினமென்று கொண்டாடுவதில்
தவறேதுமில்லை
தினமும் கொண்டாடுபவர்களென்றால்
தந்தையை
தினமும் கொண்டாடுபவர்களென்றால்

தாய்க்கு கர்ப்பறை என்றால்
தந்தைக்கு குடும்பம்
தாய் சுமக்கிறாள் என்றால்
தந்தை தாங்குகிறான்
தாயின் வயிற்றறை என்றால்
தந்தையின் தோள்கள்
சூரியனிற்கும் சந்திரனிற்கும் ஏது ஒப்பீடு

தாயன்பு என்றால்
தந்தையின் தலைமை
தாயின் உணர்வுகளென்றால்
தந்தையின் கனவுகள்
தாயின் நடத்தைகள் என்றால்
தந்தையின் ஆளுமை
சூரியனிற்கும் சந்திரனிற்கும் ஏது ஒப்பீடு

தினமென்று கொண்டாடுவதில்
தவறேதுமில்லை
தினமும் கொண்டாடுபவர்களென்றால்
தந்தையை
தினமும் கொண்டாடுபவர்களென்றால்



**Mr. M. T. M. Ansaf**
**Assistant Director of Education**
(Planning, ICT and Data Management)
**Department of Education Sabaragamuwa**

ස්වාමීනි! පුත්‍ර ප්‍රේමය සිවිය සිඳියි. සිවිය සිඳ සම සිඳියි.
සම සිඳ මස් සිඳියි. මස් සිඳ නහර සිඳියි.
නහර සිඳ ඇට සිඳියි. ඇට සිඳ ඇට මිදුලු තුළට පිවිස සිටියි.
නැතහොත් කිඳා බැස සිටියි.

(සුදොවුන් රජු -විසින් බුදුරජාණන් වහන්සේට)

**එවන් වූ දාරක ප්‍රේමයක් සහිත**
**පියවරුන් වෙනුවෙන්**
**නිර්මාණී පළමු වෙළුම වෙන් කළා සේම**
**පියගුණ සමරමින් කවි, ගී,**
**සිතුවම්, සිතුවිලි අපවෙත එවූ**
**ඔබ සියලු දෙනාටත්**
**ඒවා කියවා රසවිඳීමට**
**මෙහි පැමිණි සියලු දෙනාටත්**
**නිර්මාණී මාර්ගගත සාර සංග්‍රහය**
**ගෞරවයෙන් යුතුව පුද කරමි.**



ජානක පුෂ්පකුමාර
කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය
ප්‍රධාන සංස්කාරක
නිර්මාණී මාර්ගගත සාර සංග්‍රහය 2022 ජූලි

සබරගමු පළාතේ ලේඛක ලේඛිකාවන්ගේ
නිර්මාණ හැකියාව ඔප්නංවාලීමේ අරමුණ ඇතිව සහ
නිර්මාණී පළමු කලාපයේ නිර්මාණ කරුවන්
දිරිගැන්වීම පිණිස
තේමාවට අදාළ සියලු නිර්මාණ
මෙම සඟරාවට එක් කිරීමට තීරණය කළ බැවින්
නිර්මාණශීලීත්වය
විවිධ මට්ටම් වල තිබිය හැකි බව
සහෘද පාඨකයන් වෙත
ගෞරවයෙන්
දන්වා සිටිමි.

# Content Summary

- *Teachers' Poems and Free Verses*
- *Education Officers' Poems and Free Verses*
- *Students' Poems and Free Verses*
- *Sinhala English and Tamil medium Poems and Free Verses*
- *Students' and Teachers' posters*
- *Students' Drawings and Paitings*
- *Reviews*



ISSN 2950-6999
9 772950 699009

e නිර්මාණී Magazine

1

# උරුමයක නිමාව

කඩා හැලෙනා රැයෙහි පිනිබිඳු
සෙමෙනි තුරුමත පතිත වන්නේ
රටා මවමින් මලේ රැඳෙමින්
උදේ හිරු දැක බබළවන්නේ

දරා ළතැවුල් නගා හසරැල්
ගතේ දහබිඳු වගුරවන්නේ
නැතේ වෙහෙසක් නිහඬ දැසින්
අපේ දුක්ගිනි නිවාලන්නේ

බොරලු පොළවේ ගැටෙන පා යුග
වසා මිරිවැඩි නැත පතන්නේ
දෙනෝදාහක් සිටින ලොව වෙත
යන්න මගේ පා සරසවන්නේ

ඉරී පොඩි වුණු එකම දිවසළු
දමා තම ගත වසා ගන්නේ
නැතේ සුසිනිදු සේද පටසළු
සිහිනෙකුදුවත් නුඹ පතන්නේ

රසින් සපිරුණු නේක මසවුළු
කවර ගොනු කර රැගෙන එන්නේ
කහට වතුරෙන් කුස තෙමුවත්
නැතේ ඒවයෙ රස බලන්නේ

සිටියමුත් ගෙයි නැතුව වාගේයි
හිස් අහස දෙස නෙත් යොමන්නේ
දිරා යන පිරි සිරුර දුටුවිට
අහෝ! මාගේ සිත දවාලන්නේ

දැත වෙව්ලා වාරු නැති කල
ලණු ඇඳම නිති බඳාගන්නේ
බොර පැහැති ඇස් තදින් වසලා
තනිය මට දී නුඹ නිදන්නේ

දෙපා පොඩි මගේ රිදෙන හන්දා
තබා කර මත සතුට හින්දා
මතක නම් ඒ පාර නුඹ හට
ඇතේ සුදු කොඩි දෙපස රන්දා

සවන් නො ඇසේ දැස නො පෙනේ
මුවත් ගොළුවී සිටින හින්දා
කරට බර නෑ නුඹේ දේහය
එපා හැඬුමට කඳුළු ගංගා

ගමේ කෙළවර පාළු සොහොනේ
කොනක නුඹ තනි කරන හන්දා
සොබා දහමට වුණි ය අමතක
පියාණෙනි මම දෙපා වැන්දා

*ශ්‍රී ලංකා ගුරුසේවය 1 ශ්‍රේණිය*
*ඒ.එම්. සුසිලා අත්තනායක*
*ර/හිඳුරංගල විද්‍යාලය*

2

# පියාණෙනි ඔබේ ගුණ කියා නිම කළ නොහැක

දිනූ දා පටන් මා
ලොකු මහත් කරන්නට
ඔබ හෙළු දා බිංදු
වුණා මුතු කැට අදට

යනෙන තැනකම සැම
කරන කියනා සියල්
සොයා බලමින් නිබඳ
අපව රැක ගති පෙමින්

කිසිම විටක දී බොරුව
සොරකමට නම් ඉඩක්
නො ලැබුණි ය සමාවක්
ඔබෙන් අප කිසිවෙකු ට

හතර වන විට සවස
මල් පහන් සකස්කර
බුදු පුදට සැවොම අප
එක් කරපු හැටි අගෙයි

ඔබ එදා කියා දුන්
සෙත් පිරිත් ගාථා ද
අදත් මගේ මතකයේ
රැඳී ඇත පියාණෙනි

පෝය දින උපෝසථ
සීලයේ පිහිටමින්
කියා දුන් බණ කතා
දිවිය අප සරු කළා

බෝධි පූජා තබා
ලෙඩුන් සුවපත් කළා
ගිහි පිරිත් දේශනා
වලින් සිත් සැනසුවා

දහම් පොත් කියවද්දී
නැගෙන මහදට ගැටලු
සිහි වෙන්නේ ඔබ තමයි
දයාබර පියාණෙනි

ණයෙන් නැති බියක් නැති
උතුම් ජීවිත සවිය
තුළින් අද මා දකිමි
දියුණුවේ රුවන් මග

පියාණෙනි ඔබේ ගුණ
කියා නිම කළ නොහැක
බුදුන් වැඳ නිරතුරුව
පතමි ඔබහට නිවන

**ආචාරිණී පී.කේ.කේ. ජයවීර මිය**
**කෑ/දෙහි/අටුළුගම්වෙල ප්‍රා.වි.**

3



*යූ. ඩී. සෙසදි මින්දුනී විමලසේන,*
*ර/ ඇහැළියගොඩ ප්‍රාථමික විදුහල,*
*2 ශ්‍රේණිය*




Volume One - © 2022 Department of education Sabaragamuwa

4

# ගිරි හිස සරි බර හිසින් දරා....

නො පෙනෙන ගැඹුර'ති වැව් දිය කඳ සේ
සෙනෙහස සඟවා-සෙනෙහෙ පිදූ ඔබ
මගේ දයාබර පියාණනී......

තුරුණු විය දියකර දහඩිය කලනා....
රූ සිරි මා වත කමලෙහි තවරා....
පියාණනේ.......
ඔබේ සතුට මා දෙනෙතින් සොයනා...
ඔබට අහිමි හෙට මා රජ කරනා....

දුක් ගිනි සඟවා මදහස අතරේ...
සැනසුම රඳවා පුළුලුර තලයේ....
පියාණනේ....
සැනසුම් පවනින් මා සිත නිවනා....
සෙවණැල්ලක් සේ මා හා රැඳෙනා....

T.G.G.C.අමරසිංහ
කෑ/දෙහි /දික්ඇල්ලකන්ද කනිෂ්ඨ විද්‍යාලය

5

# පීතු පාදං නමාමි

වදිමු පා යුග බැතියෙනි....//
කෙතරම් සැඩ රළු කුණාටු ආවත්
මහමෙරුව හද නො සැලෙන්නේ
අවුවැසි කුණාටු බාධක හමුවේ
සැමදා එක ලෙස පවතින්නේ....//
කිසිවිට නො සැලෙන
මහමෙරුව නම්
නුඹයි පියාණෙ'නි මගෙ දිවියේ
අනන්ත බාධා දුක්ගිනි අතරේ
මා රැක ගත්තේ නිරන්තරේ....//
පීතු පාදං නමාමී
වදිමු පා යුග බැතියෙනි....//
දහසක් කරදර ඔබෙ සිතේ තිබුණත්
නෑ කිසිවිට නුඹ පෙන්වූයේ
යහපතින්ම දිවි ගෙවන්න දියණිය
පමණයි ඔබ මට පැවසූයේ...///
පීතු පාදං නමාමී
වදිමු පා යුග බැතියෙනි....//

**W. Y. S. N. ප්‍රේමතිලක**
**කෑ /දෙහි /හත්කෑල ක. වි.**

6

පුංචි දවස්වල නින්දට යද්දී
ඔබේ ඇකය සුර යහනක් විය මට
පියාණනී ඔබ මගෙ ළඟ ඉද්දී
ඔබයි මගේ රජු මුළු ලොව පරදන...

ජීවන මං පෙත සෙමෙන් ගෙවෙද්දී
මගෙ ලොව හෙළි කළ හිරු කිරණ යි ඔබ
දිවිගමනේ බර මට නො දැනෙන්ට
කුසගින්නේ දා බිඳු හෙළුවේ ඔබ

මැණිකක් රකිනා නා රජු විලසින්
බිහිවූ දා සිට මා සුරැකූ ඔබ
මෙතේ බුදුන් දැක නිවන් දකීවා
සසර දුකින් මිදිලා සැනසුම ලැබ...

**W.I.පද්මිණී**
**කෑ/කෑගලු බාලිකා විද්‍යාලය**

7




**පී. නෙතුෂි සෞම්‍යා**
**ර/වතුයාය ශ්‍රී සුමන විද්‍යාලය**
**6 ශ්‍රේණිය**




Volume One - © 2022 Department of education Sabaragamuwa

8

අපෙ කුරුලු කූඩුවේ සැප නැතැයි කියමිනා
අම්ම අප සියල්ලන් හැරදමා පියඹුවා
පොඩි පැටව් මගෙ පණ යි කියමිනේ අඩ අඩා
පියතුමන් අපව ඇස් දෙක වගේ රැක්කා

උදේ සිට වෙහෙසෙමින් දුක් කඳුලු වගුරලා
හම්බකල සොච්චමින් අප පෝෂණය කළා
කුසට හරි හමන් බත් කටක් වත් නොදීලා
වතුර උගුරින්, දෙකකින් හාමතේ ගතකලා

අපෙ කුරුලු කූඩුවේ..........

ඉගෙන ගෙන රැකියාව කරන දූ පුතුන්ලා
දෙස බලා වගුරුවයි තුටු කඳුලු සැමදිනා
බුදුන් දෙසූ අමා දම් සසිලසෙන් නැහැවිලා
සසර කෙළවර දකින් අප්පච්චි සැනසිලා //

By J.K.W.L ජයවීර මිය - ර/ශාන්ත ලූකස් විද්‍යාලය

9

නො සිඳෙන ගඟුලකි නිරන්තරේ...
නො පෙනෙන සෙනෙහස
පිය තුරුළේ....
සමකළ හැකි වෙද....
මහමෙර කුල වුව....
පිතු සෙනෙහේ ගලනා....

නො දැනෙන සියුමැලි
කරගැට ඇතේ....
නො හඬන කිසිවිට ජීවන
ගමනේ....
දසමස කුස නොව.....
දිවියම උර මත.....
නිති දහඩිය හෙළනා.....

නො කියන මුව තුල,
පොපියන ඇසේ...
නොඇලෙන දිවියම ජීවන උයනේ....
මනු ලොව සුරිඳුනි,
බෝසත් ගුණ ඇති,
මතු නිවනම ලබනා....!!!

A.G. දීපිකා
දිල්රුක්ෂි ගමගේ
කෑ/දෙහි/ගෝනගල
ම.වි.
ගෝනගල
රුවන්වැල්ල

10

## වඩු තාත්තා

නුඹෙ දැත ඒ මුදු
පහස
දැනී මටසිළුටු වුණ
යතුකැටය
නියන හෙම
තවත් වඩු මඩුවේ
වැඩ....

එදා මෙන්
වෙහෙසෙමින්
නිදි වරන දින
නැතත්
ගියොත් ගේ
පිටුපසට
ඇසෙයි 'ටොක්'
'ටොක්' හඬක්

කැඳැල්ලක්
තනන්නට
එකල ගත්
වෙර විරිය
නො කිච්චත් නුඹ
දිනෙක
මවුන් සඟවයි ද
එය

කැණිමඬල
තනන්නට
ලී ගෙනෙන්නට
ගිය ද
දෙකම්මුල් ඉදී
මෙමින්
හැඳුණේ දෙයියන්ගේ
ලෙඩ

පිරුවට ඔතාගෙන
දෙකම්මුල්
වසාගෙන
මහා වැස්සේ
තෙමීගෙන
ගියේ'ලු නුඹ දිරිය
ගෙන

දිවා කල ලී කඳන්
සමග කරනා සටන්
අපට වැකුණේ
සවන්
නින්දෙ කළ
කෙඳිරියන්

කිරි දතින් මුව
මඬල
සරසාන සිනාසුණ
ඇඟිලි උරමින්
නොදැන
දුන්නා'ලු කරදරය

තෙදිනක් ම නිදිවරා
ඇඟිලි රෙදිවල
ඔතා
දසන් පෙළ
රැකබලා
ගන්න නුඹ
වෙහෙසුණා

සොය සොයා
කාසි පොදි
අරපරෙස්සම් කළා
වැටි වැටී යන විටදී
නො මසුරුව
පුදකළා

පිරූ පින් බලෙන්
පෙර
මනුසත් ව ඉපදුණා
දරූ සෙනේ
පරයන්නට
නිවනටත් බැරි
වුණා

පිය ගුණය නිහඬ
මෙහෙයක්
ලොවට ඉටුකළා
මවුන්
මෙන් පෙන්නුවා නම්
එයත් අගයනා

ජීවිතේ කිසි බියක්
නො ගෙන ජයවෙත
ගියා
යෝධ සෙවණැල්ල
නුඹ
අත් නොහැර
පැමිණෙනා

වඩු මඩුව ඉසිඹුලන
දිනක් එන්නට එපා
නුඹ නොදුටුවොත්
එතුළ
හද නතර වෙයි
සදා.....

ආර්. ඒ.චිත්‍රාංගනී
රණවක




eනිර්මාණී MAGAZINE
Distance Learning mission Sabaragamuwa Provincial Department of Education
Volume One - © 2022 Department of education Sabaragamuwa




P.H.Tharani Rochana Samarathunga
Kg/Bandaranayaka National School
Grade-6

12

# නිවන් දොර හැර එතෙර කරවම්

දසමසක් කුස තුළ        නොදැරුවත්
රුහිරු කිරි වී ගලා        නොගියත්
ළයේ උණුසුම දැනේ        තවමත්
පියාණෙනි ඔබෙ සුවඳ        සමගත්

නංගිවත් මාවත්        රකින්නට
දුන්න බර පැන මගේ        අම්මට
තාම මතකයි අනේ        අපහට
කෙසේ ගෙවමු ද ණය හනිකට

සිප් සතරෙහි        මහාතෙරටම
ගමන් කරනට දුන්න        දිරියම
අපතේ නොහැරිය දරුවො        දෙන්නම
මහඟු තිළිණෙකි අනේ        ලොවටම

ගුරුවරිය වී නැගිණි        සතුටින
බුදුන් මගේ වැඩි මමත් නිදුකින
පියාණෙනි ඔබෙ සතුටු කඳුලින
අපි අපේ ජීවිතයේ        සැනසෙන

වින්ද දුක් කඳ නුඹට        බරනම්
දෙන්න ඒ උණු කඳුළු        ගන්නම්
නිවන් මඟ වෙත දොර හරින්නම්
අපට කලියෙන් එතෙර කරනෙම්

ජේ.කේ.ඩබ්ලිව්.එල්.ජයවීර
ර/ශාන්ත ලූකස් විද්‍යාලය

13

# තරහ නෑ ඉන්න ඔබ තරුවක් වෙලා අර ගගනතේ..

පිය සෙනෙහස ගැන පදවැල් ගොතන්න දුටිමි ඇරයුමක් නිශායම
ඔබ ගැන පදවැල් ලියන්න කිව්වම මම නොලියා ඉන්නේ කෝම
සඳ කිරණක් සේ පිවිතුරු සෙනෙහස ඔබෙන් ලද හැමදා        උරුම
දිනයක් ඇවැසිද ඔබේ ගුණ වැනුමට ඔබමයි සිත තුළ        හැමදාම

වැටුණු විට පොඩි දෙපා පැටලී හිතින් හැඬු වග        දන්නවා
ජයක් ලද විට මගේ දිවියේ තුටින් කඳුළක්        සලනවා
ගිලන් වූ කල හිසත් සිඹිමින් ළඟින් උන් හැටී        මැවෙනවා
තාත්තෙ නුඹ පිදු සෙනෙහස මහමෙරක් සේ        දැනෙනවා

රසමසවුළුත් හැකි ලෙසින් දී මුවඟ හසරැල්        බලාන
කෙළි කවට දඟ වැඩක් උහුලන් කෝම උන්නේ        දරාන
රැකුවෙ නිති මා මිණිකැටය මෙන් ඔබේ ඇකයේ        හොවාන
මව පමණ දැයි ඔබත් බුදු වෙයි මගේ ආදර        පියාණ

දුකත් සැපතත් සමව ගත යුතු බව පසක් කළෙ        ඔබමය
හොඳ නරක නම් මෙයයි තුරුලට ගෙන කියූ හැටි        මතකය
පැසසුමුත් තරවටුත් මැද මා යහමගට ගත්        අරුමය
වදනකින් වත් හිත නොරිදවූ ඔබයි මා මුල්        ප්‍රේමය

අයනු ආයනු කියා මට අත්පොත් තැබූ දා        මතකද
ගුරු මවකි අද රජුන් තනනා තාත්තේ        දන්නවා..ද
ඔබේ හීනය සැබෑවක් කළ පුංචි දූ ගැන        සතුටුද
පහන් සිල වී එළිය දෙන්නම් ඔබ බලන්        ඉන්නවා..ද

හනික දෙව් ලෝකෙට වඩින්නට හිතුණෙ ඇයි මගේ        තාත්තේ
දුකක් දැනුණෙ නැද්ද යන විට රැගෙන දිවියේ        වසන්තේ
එකම දවසක් ඇවිත් යනවද බලන් ඉන්නම්        අනන්තේ
තරහ නෑ මං ඉන්න ඔබ තරුවක් වෙලා අර        ගගනතේ

දිලිනි රංගිකා මාපා
කෑ/රාජකීය විද්‍යාලය,කෑගල්ල

14

මහා පෙමක් සිත දරා දුන්නු        නොමසුරු
මහ මෙරක් ලෙසින් අප පිටුපසින්        මුර කෙරු
මහා බරක් අත දරන් නැගිටින්න        වෙර දැරු
මහ සඳක් සිසිල දුන් ගුණෙන් පිරි        පියවරු

මුදුන් මුල මෙන් ගසක මුළු පවුලේ        බර දැරු
මනු වෙසින් නිවෙස්වල වැඩ හිඳින        දෙව්වරු
අප නමින් පිය සෙනෙහේ ඩා බිඳෙන්        දියකෙරු
නිහඬවම හදවතින් දිරි දුන්නේ        පියවරු

දිවි පුරා අප නමින් තම සිහින        කැපකෙරු
විඩාවන් සඟවමින් අප සිතැඟි        ඉටුකෙරු
කුස දරා ලේ කිරට හැරෙව්වත්        මව්වරු
ගොළු හදින් ඉහුළුවේ අපේ බරයි        පියවරු

ජය ගන්න මුළු ලොවක් දිරිය වී        නොමසුරු
මුතු ලෙසින් රුහිරු බිංදු අප නමින්        දියකෙරු
දිය බිඳෙන් කුස පුරන් අපේ බත        සරිකෙරු
නඟනු බැහැ කවියකට විදි ගැහැට        පියවරු

නිවා දුක් කඳුළු මැද අප ලොවේ        ගනඳුරු
වලාවක් ඉරා ගෙන එළිය දුන්        දිනිසුරු
ගුලාවක් තනා දෙන දිවි මගේ        අමඩුරු
නිමාවක් නොමැත ගුණ කදම්භයෙ        පියවරු

ජී.ඩබ්. සුනිල් දයා මයා
ර/රත්නපුර මහින්ද විද්‍යාලය






Volume One - © 2022 Department of education Sabaragamuwa




B.A.SAVINU RANULAKA WIJEWARDANA
Grade 2-R/Eheliyagoda primary colleg



Volume One - © 2022 Department of education Sabaragamuwa

16

# ආදරෙයි තාත්තේ

මවකට මුවා වී රැකවරණය දුන්නු
හදවතේ උතුරනා ළෙන්ගතුකම් හැංගු
මහමෙර තරම් සෙනෙහස පපු මත රැන්දූ
පෙන්නුවේ යකා විතරයි මතු පිට උන්නු

දහඩිය නුඹේ පැල මත මල් පුබුදන්න
ගත්තා වෙර විරි මහ මෙර උහුලන්න
කුසගිනි දරා අපේ බඩ කට පුරවන්න
පාරමී පිරුවෙ නෑ දවසක බුදුවෙන්න

ඉඹලා නෑ මුහුණ දන්නා කාලෙක නම්
රවල බැලුවා පොඩි වරදක් වූවා නම්
සරුකර ගන්න ජීවිතය ට ඔවා - දම්
දුන්නෙ අපට ඔහු ජීවිතයට පැතුම්


කේ.බී. ප්‍රියන්ත මනෝජ්
කෑ/දෙහි/ආනන්ද කීර්ති මහා විද්‍යාලය
බුලත්කොහුපිටිය


18

**මෙහෙවර නිමයි........**

මව් කිරි සුවඳ දරු මුවගේ රැඳුණේය
මගේ සෙනෙහස ද ඒ අසලම තිබුණේය
මව් දරු සැමට රැකවරණය සැදුණේ ය
මගේ සෙනෙහස නිසා දරුවන් රැකුනේ ය

කුඹුරට ගොසින් බත සරි කෙරුවේ නුඹට
ලඟ රැක සටන් දිවි සව් දුන්නේ නුඹට
මව පිටුපසින් සිට රැකවරණය සතුට
ලැබ දුන් නිසයි නුඹලා හැදුනේ යසට

නිවනට යන තෙක්ම සසරෙහි නොකර පව
කරදර පැමිණියත් නොගනිමි හිතට සොව
බුදු වන්නට පෙරුම් පුරනා නුඹගේ මව
සහයට සිටිමි දිරි වඩමින් ගමනේ බව

ගුණ නැණ සපිරි දරුවන් හැදුවා යසට
කිසි අඩුවක් නොමැත සැනසුම ඇනේ මට
පින් රැස් කළෙමි ඉන් සිත තුල ඇත සතුට
මෙහෙවර නිමයි දරුවෙනි සමුදෙන්න මට


එච්.ඩී.එම්.ඩී. දිසානායක
ඇහැලියගොඩ ප්‍රථමික විද්‍යාලය



Sabaragamuwa Education
Management Information System
http://www.semis.lk/


17

## ලකල් දිවි මග පියාණෙනි නුබ මගෙම වේවා සදහට...!

සුනිල පෙරඹර සුදු වලාතුර අනත තෙද බල පතුරන
නිමල දිනකර රුවන් මුදු රැස දහ කරයි එහෙ මෙහි පැන
ලකළ පැහැසර කුසුම් ගොමු මත රඟන සමනල බිඟු වන
උදුල සිරිසර තුහින මුතු කැට මතින් නිබඳව පිබිදිණ...

පිබිද දිය තවරමින් මුව මත සිනා මල් දී පැහැබර
සමිද පිය බුදු තෙපුල් අසමින් ගුවනෙ විසිවෙන සිරිසර
ඇමද ගෙය කඩිමුඩියේ ඉදෙනා බතට අඩුවැඩි සරිකර
නිබද සිය ගත සවිය දුන්නා පියතුමා ආදර බර

කව කවා පිරි කුසට තවමත් කටයි සනහස පා ළය
දුව දුවා දිරි දෙමින් අම්මට යෙහෙන් පාමින් ආලය
සරසවා කිරි කොකුන් මෙන් අප කරට ගෙන පොත් බෑගය
පෑගුවා කිරි කිරි නදින් පියතුමා පාපැදි බාගය...

නොපා අත කිසිවෙකුට කිසි කල යෙහෙන් දිවිමග ගෙවනට
දෙපා වෙත දුන් වාරු අමිලයි සත්තමයි ජීවිතයට
සපා කන විසකුරු සතුන්ගෙන් විගස මිදිලා යන්නට
උපා දුන් හැටි තවම මතකයි පියාණෙනි පින් ඔබ හට..

දිනෙක කිසිදා නොදී පහරක් හෙළපු බැල්මට ඉඳහිට
විටෙක වැටුණත් බිමට කඳුළක් යළිත් නැඟුණා උකුළට
ලොවක නෙක බස් කතා කිය කිය රැයෙහි කැව් බත් ගුළියට
මෙරක මහ රස නහර ඉල්පිණි හාදු දුන්නා නලලට...

ගොහොරු කලලෙහි සුපිපි නෙළුමට ආදරෙයි මුළු ලෝකය
අයුරු පැවසූ සිතග රැව් දෙයි ගෙවී යන සඳ කාලය
සොයුරු හා මා සුරැක මැනවින් ගෙලෙහි පැළඳු මාලය
මහරු හැඟුමන් නිතින පුබුදයි සිහිව නුඹ පෑ ආලය...

ගෙයින් බට විට රසැති අහරක් කැවෙ නෑ අප වෙත නොදී
දුවන් ආවා කඩෙන් හෝ ගෙන හමන මඳ නල මෙන් ඇදී
ගතින් වෑහෙන දහදියේ රස දැනුණු සඳ දිවගට හුදී
පෙමින් මා නුඹ සුවඳ වින්දා මතකදෝ තුරුලට වැදී

නොකර අග හිඟ කිසිදු කලෙක දී රඳා හදවත යහ ගුණ
විවර කරමින් රුවන් ද්වාරය දෙවා මැනවින් සිප් නැණ
පවර සනහස තිළිණ දෙවමින් අහිංසක ලෙස හිනැහුණ
රුහිර නුඹගේ කිරි නොවූයේ කිමද අරුමය කිව මැන..

තුදුස් වසරක් පුරා පෙවූ සිප් මතින් සරසවියට එදා
සහස් පැතුමන් මතින් මා පිය නැගූ සඳ පියපත් විදා
වෙසෙස් කඳුලක් සඟවා ගන්නට නුඹ දැරූ තැත මා බඳා
දහස් වර මැවී මැවී සිහිවෙයි පියාණෙනි අදරැති සදා...!

නිසල් නුබ ගැබ හිරුද සඳ වී දෙමින් ආලෝකය මට
විසල් ලොව මා රජෙක් කරනට නුඹෙ දිවියම කැප කොට
කුසල් පිරු බල මහිමයෙන් නුඹ යන්න මතු අම නිවනට
ලකල් දිවිමග පියාණෙනි නුඹ මගෙම වේවා සදහට....




ආර්.ඒ.සී.සී.රාමනායක
ශ්‍රී ලංකා ගුරු සේවය
ර/නිවි/කලවාන ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය




Volume One - © 2022 Department of education Sabaragamuwa

19




V. Imaya Savindi Bandara
Kg/ Kegalu Balika Vidyalaya
Grade 9

20




21




W.K. Jinuki Amaya Weerasekara
R/ Fergusion High School
Grade 3

G. Lingeshwaran
Houpe Tamil Vidyalaya
Grade 7

22

දස මාසයක් ඔබ මා කුස නොදැරූ ව ට
ඔබෙ දිවියම කැප කළා මා ලොකු කරන්න ට
වෙර වෑයම් කළා මා උගතෙකු කරන්න ට
ඉණිමං තනා දුන්නා මට පිය නගන්න ට

පොත පත අකුරු කරමින් ඉදිරියටම යන්න
නිරතුරු මගේ පිටුපස සිට නුඹ දුන්න
යහ ගුණ දම් අගෙයි මට ඉහළට යන්න
ලොව ජයගෙන නුඹෙ දිරි දියණිය වන්න

ලෝකෙම උතුම් යහපත් දියණියක වෙලා
පියවර තබන හැටි නුඹ මට මතක් කළා
දිනෙන් දිනම වැඩෙනා මා දෙස බලලා
සිනාසුණා නුඹ තුටු කඳුලැලි සලලා

රෝ දුක් ඇවිත් නුඹ වට කර සිටින්නේ
එනමුදු නුඹ නොවේ ඒවට සැලෙන්නේ
මහ මෙරු පර්වතය මෙන් උඹ නොසැලෙන්නේ
සැමදා මගේ ලොව රජු වී වැජඹෙන්නේ

ඩබ්. වයි. එස්. එන්. ප්‍රේමතිලක - කෑ/දෙහි/ හත්කැල ක.වි.

23

## පියාණනි

සදාදර පියාණනි
අසම සම වූ
ගුණ කඳ ඔබගේ
කියා නිමක් කළ
නොහැක හදේ

හොවාගෙන මා
ඔබේ උරයේ
ගෙවා ජීවන
ගමන සසරේ
එක් කරන් ආවා...//

මුවැත්තිය සේ
ඝෝර වනයේ
සැරිසරන කල්හි
සදා පිහිටට සිටියෙ ඔබමයි
පියාණනි දිරි දී

සසර අතහැර
යන දිනේ ඔබ
නිවන්පුර දොර
ඇරේවා පතමි...//

ගයානි ලසන්තා
ර/මාරපන මහා විද්‍යාලය




24

අසිරි මල් හැම නොපිපුණත්....
කව් ගීත නිති නොගැයුවත්.....
අඩු නැතුව ගැලුවා සෙනෙහේ...
පීතු පාදං නමාමී.........

දිනකරම වී රශ්මි විහිදා,
තරුපතිම වී සිසිල බෙදුවා......
සිය දහස් වග මගක් තැනුවා.....
පීතු පාදං නමාමී.........

කිරට නොහැරුණු ලෙයම පපුතුර.....
නිතිම හැඬුවා නොපෙනුණත්....
දෙවි බඹුන්ටත් එපිට වටිනා....
පීතු පාදං නමාමී.........

ලකම තෙත් කළ
කුරිරු ලොව තුළ.......
නිසල කළ අපේ, සෙනෙහේ ගඟුලත..
තුන්තරා බෝ සෙවණේ සැනහේ....
පීතු පාදං නමාමී.........!!!!!

A.G.D.D. ගමගේ
කෑ/දෙහි / ගෝනගල ම.වි.
ගෝනගල,රුවන්වැල්ල







25
DAD
Thank you for all
that you are and all
that you have done
Happy
FATHER'S
Day
2022
M.B. Manjula Prabath Jayarathna
Teacher ITDLH - Balangoda


INTERACTIVE LESSON
Next Generation Teaching- Learning
Visit and try at
Innovative Learning Model
www.enenapiyasa.lk

26

## හිරු ඔබයි මගේ ලොවේ

*සැතපුණා ඔබේ ළයේ*
*උණුසුමෙන් පිරී ගිය*
*එළිය විය මගෙ ලොවම*
*හිරු නිසා ඔබ මගේ...*

*සීතලේ වෙව්ලමින්*
*නිදි වරා දුම්රියේ*
*කාසි සෙව්වේ නුඹයි*
*අපව රජ කරනු වස්...*

*තේජසින් වැජඹුණා*
*හස්ති රාජෙකු විලස*
*හිස නොමා කිසිවෙකුට*
*ගුරු කළා අප තිදෙන...*

*ජීවයේ සැඳැසම*
*ගෙවන්නට නුවර සිට*
*පැමිණියා රුවන් පුර*
*ලොකු දෝණි මා නිසා....*

*සමුගන්න දිවි මගෙන්*
*මෙලොව එළි දුටු දිනම*
*තේරුවේ කෙලෙස ඔබ*
*දශක හතකට පසුව....*

*අප්පච්චි මගේ පිං*
*වඩින්නම් ඔබෙ දෙපා*
*පුදන්නම් ඔබෙ නාමෙ*
*ඔබ නිසා හිරු මගේ....*

එන්.පී. ලංකා ගලහවෙල
විද්‍යා ගුරු
තිරිවානාකැටිය විදුහල
රත්නපුර.

27

## අප්පච්චී එනතුරු

තාම අහස අඳුරු වෙලා ..
විදුලි ඉරක්වත් නැති හැටි...
සඳ පායන්නට
බැරි තරමට...
වලාකුළින් සඳ වැසිලා..

එළිපත්තේ...ඇඳි අරන්...
සිත් අහසේ නිමග්නවී...
නුඹෙ හඬ සවනට එන තුරු
...
නිදි වරනෙමි.. කඳුළැලි..
සඟවා..

හිමිදිරියේ ..සිදාදියට
නුඹ පියමැන.. හුදකලාව ...
හිරු අවරේ සැඟව යද්දී....
දවසේ මෙහෙවර නිම
කර.....
ගනදුර තුරුළට අරගෙන..
සයින් පිරුණු කුස ඔද්දල්..
අසුනක් නැති..පා යුග...
රිදෙනා වග නම්....
මහමෙර තරමට දැනේවි...
සුසුම් ගොඩක් කරපින්නා...
සෙනෙහස් නෙත් යුග
දල්වා....නුඹ එනතුරු ..
ගෙයි පිළ උඩ ඉකි ගැසේවි..

දාහය නෑ නිවී ගියේ..
අප්පච්චියේ.... සුවඳ නුඹේ
දැනෙනා තුරු.
තිස්තුන්
කෝටියක් දෙවියෝ
නුඹ රැකදේවා.....

එල්.එම්.පවිත්‍රා ප්‍රියංගනීද සිල්වා
විදුහල්පති
ර/ ඇහැලියගොඩ ප්‍රාථමික
විද්‍යාලය

28

## පිය සමර ....

මුල් වරට එදින
සිප්හලට වදින
පියෙකි පසුපසින
පුටුවකුත් රැගෙන

දුක තළා මිටි න
ඇණ තබා තදින
කඳුළු බී සොඳින
හැදුව දරු පෙමින

මැටි පොළවෙ නිතින
ඇන තබා හිඳින
ඔහු අකුරු පිණිස
උරුම කළ මටම

විදුමවුන් තුළින
දිවි ලබා ඉතින
තනිව එන ගමන
අත්වැලකි මිදුණ

දනන් නෙක ලෙසින
මගෙ සරණ පතන
ඉටු කරමි සොඳින
පියාණන් නමින

මුදු පවන සිඹින
මේ සුසුදු අසුන
මට සපථ කරන
ඒ මතක දසුන.....

ඩබ්. අයි. වීරකෝන්
කෑ/ පුවක්දෙණිය ක.වි.




Volume One - © 2022 Department of education Sabaragamuwa

# Happy Father's Day

**You Are The First Person I Think Of When I Have A Question About Something Or When I Just Need Some Support And Good Advice. Thank You For Always Being There For Me , I Love My Dad.**



R/GANKANDA CENTRAL COLLEGE |UDULA RASHMIKA SATHARASINGHE|(10-D)

ඊ නැණපියස සෙල්ලම් මිදුල
எமது ஒன்லைன் விளையாட்டு முற்றம்

https://www.enenapiyasa.lk/assets/kids/index.html



30

## සුවහසක් දැයේ පියවරුණි, උපහාරයක්ම වේවා !

ගතෙහි රුධිර බිඳු ජීවය සදවා
මව් ඇකයේ පෝෂණය දරන්නට
ප්‍රාණය දුන් නුඹ ගුණ ගී ගයනට
උගත් වදන් මට මදි පියතුමනී...

දා බිඳු හෙළලා දිව රෑ වෙහෙසී
ලොවක් තනන්න දරුවන් හදලා
දුන් ඒ පින් ඇති
බුදුන් දකින්නට පියතුමනී...

කුස ගිනි නිවලා අප සනසවලා
රැකවරණය දුන් අගය වඩන්නට
දොහොත් මුදුන් දී
වඳිනෙමි පියතුමනී...

නිවසේ ශක්තිය උරමත දරලා
කුටුම්බයේ අරුණලු ගෙන ආ නුඹ
වියපත් වූ දා දෙපා සවිය ළඟ
උර දෙන්නම් මම පියතුමනී...

සුනේත්‍රා මාලනි වඩුගේ
ර/විද්‍යාකර මහා විද්‍යාලය




31

## අප්පච්චි

තිත්ත කළුවර අරන් ගෙට
එන

හද්දා පිටිසර ඉල් මහේ

පුන් සඳයි මගේ ලොවට පෑයූ

පින්බර ම හදවත කොනේ

ලඳලු පත් පිණි ගසා නැගිටින

අවාරේ වට වැහි වගේ

බලෙන් මී මල් පිබිදුවේ නැත

කලට මල් පූදින මහේ

කළුවරේ අත-පත ගගාහෝ

ගෙදර ආවත් ගොම්මනේ

ඔබේ පා යුග සිඹින විට මට

සුවඳ උතුරයි ජීවිතේ

කප්පරක් මගේ හිතේ ගුලි වී

තවම නොකියූ ආදරේ

දරාගන්නට බැරිව ඉකිලම්

මගේ පණ නල ජීවිතේ

කර උඩින් ඔබ ඇත
නොපෙනී

ගියත් පාවෙන මීදුමේ

පපුව ගැහෙනා වාර ගානේ

පුතේ කියනා හඬ ඇසේ

ලියනගේ හිමාලි අප්සරා
රත්නපුර මිහිඳු විද්‍යාලය

32

## පියාණන්ට සෙනෙහසින්

දස මස කුස නොදැරුවත් හදවතෙහි දැරූ
මෙලොවට බිහි වූ දා සිට ගත වෙහෙස පිරූ
රැකවරණය සදා මා යහමගට කෙරූ
පියතුම දෙපා නමදිමි නිති කරමි ගරු

සුදු ලේ කිරට කර පෙව්වත් මැණි මගේ
දහදිය හෙලුවේ ඒ හා සම සිතින් වගේ
නැණගුණ දෙමින් කළ ඔවදන් සිහියෙ නැගේ
මා ගුරු මවකි ඒ ඔබ ශක්තියෙනි හැඟේ

දිරියෙන් පෙරට යන්නට වීරිය දුන්නා
කඳුළැලි නෙතට නොඑනට සෙනෙහස පෙන්නා
යහ මඟ එකළු කරනට නිති වෙහෙසෙන්නා
නිමකළ නොහැක පිය ගුණ ගයමින් එන්නා

ගං දිය ගැඹුරු බව නිතරම සිහි ගන්න
යන මග වැටකඩුලු බාධක ඇත ඔන්න
විවිධයි විෂම ලොව යහතින් වැජඹෙන්න
ගුරු හරුකම් දුන්නෙ දීවියම ජයගන්න

ආයුෂ බලය ලැබ දී නිති සුරැකේවා
රෝ බිය කිසි විටෙක ඔබ වෙත නොමයේවා
පියතුමා මගේ දිගුකල් තව වැජඹේවා
මතු අත් භවෙත් නුඹ මගෙ පියතුම වේවා

එම්. එම්. ධම්මිකා කුමාරී සෝමරත්න
ර/ගල්ලෑල්ල මහා විදුහල







e නිර්මාණී MAGAZINE
Distance Learning mission Sabaragamuwa Provincial Department of Education
Volume One - © 2022 Department of education Sabaragamuwa

33

*Yesterday today and always my beautiful friend is my dad that's why I called him as* ***Apii***

*Whenever I miss you, I go through our pictures that have the fondest of the memories.*
*It allows me to stay assured and be calm that my super dad is with me, in my heart.*

*Even though I'm married now I know you are the only man who is worried about my everything* ***Apii*** *!*

*And I love to hear from people*
*"**Oh, you got yours Daddy's round face!**"*
*"**Wow super cool you look like your Appachchi!**"*
*It's my happiness that's why I don't want to be so beautiful as my mom*



34

# මගේ ඇස් දෙකට ආදරෙන්

ගොඩක් අප්පච්චිල වගේ
හැමදාම මූණ ඉම්බෙ නැතුවට
මම නිදා ගත්තම
මූණ ඉබින්න ඇති නොදැනෙන්න..
මගෙ පණ
ඒ තමයි මගෙ අප්පච්චි..
පළවෙනි ආදරේ වුණ
අම්මටත් වඩා
චූටි මැණිකෙට තමයි
ආදරේම මං..
පිටට නොපෙන්වපු
දින පොතක හිර කරපු
මගෙ දකුණු ඇහැ..
හැමදාටම මගෙ අප්පච්චි (අපී)
ලෝකෙ කළෙවරම හිටියත්
මගෙ හුස්ම, මට ජීවිතේ දුන්න
මගෙ දකුණැස, මගෙ පණ මම බලා ගන්නවා..
හැම පුංචි දේම මතකයි අපී,
හැම ආත්මෙම අම්මයි අප්පච්චිගෙ මැණික මම
විතරයි
වෙන අය එක්ක බෙදාගන්න බෑ
හැම ආත්මෙම අපි තුන් දෙනා  ත්‍රීවිල් එකක් වෙමු
මම ඉස්සරහ රෝදෙ
ගොඩක් ආදරෙයි මම
ඇස් දෙක වගෙ රකින්නම්..





**ආර්.ඒ.ඩී.අයි. රූපසිංහ**
**ර/ ඇඹි/ පනාමුර මහා විද්‍යාලය**




I ♥ DAD



Volume One - © 2022 Department of education Sabaragamuwa




**Oshadhi Tharuka**

Kagalu balika vidyalaya
Grade-8

**Dad holds our hands for a little while and hold our hearts forever!**



36

## සසරේ තවමත් තනියම

ලොකු දෝණි campus ගිය,
දිසාපති ලූ ය මැදරට.
ඇගේ මහතුන් පිටරට.
හරිම වෙහෙසයි ඇඟපත,
මලේ අඩියක් ගහමුද.
තිබ්බ උකසට ඕවිට
මගුල ලොකුවට ගන්නට.
යලේ අස්වද්දන්නට
වෙන්නෙ අඳයට නේ බොල.
ලොක්කි ආ බව දැනුනම,
ගෑනි ඉල්ලුවෙ කොරලියා
ඇන්න ඇවිදින් තෙල් දමා
දසමසක් දොල සින්දුවා.
යමයා ඇවිදින් හවසක
ඉඹුල පෙන්නුවා නගින්ට
හැමදාම ගස් බඩගෑ මට
ඒක කජ්ජකි අම්ම ප...

දෝණිලා, අම්මලා, නඟාලා
යවාලා තුසිතය වෙත
නගිනවා කටු ඉඹුල ඔහු තව
හොරෙන් දහදිය පිහ පිහ

*P.G.M. මාධවී කාංචනමාලා විමලසිරි*
*විද්‍යාව උපගුරු*
*රෝ/ නිවි/ ගබ්බෙල ම.වි.*

37

## අප්පච්චී

කඳු කපා හැලෙන සීතට
ඇඟේ ඇනි අනී දැවටී
හිතත් රිද්දන හී ගඩු මල
දාඩිය පිපෙනකොට
පරවෙලා බිම වැටුනට
අප්පච්චී දුක දැනුනද
ඒ ගැන හිතලම
ඉරත් අහසට නැග්ගද
බදු වගේ ඇඟේ එල්ලී
කූඩැල්ලො ලේ බොනකොට
ජීවිතේ තරං උස
රබර් ගස වට වන්දනාවෙදි
දෙපතුල් නුඹේ රිදුනද
ඒ ගැන හිතලම
නිදිකුම්බ පාවඩව බිම
වැව්නද
තරු රටා ඇඳි අහස
මැටි බිත්තියට ඉහලා
කුඹුරකම මඩ ඇති බිම
එළන වැරහැලි පදුරට
රෑ කරුවලත් ඇරගෙන
කුසගින්න ගෙට එනකොට
කඳුලැල් ගලා හැලුනද
අහසටත් දුක හිතිලම
අනෝරා කඳුළු වැටුනද
බැරි බර කරේ අරගෙන
ජීවන හපුතලේ යනකොට
පාං බාගෙට පොරකන
හීං උන්ගේ කෙඳිරිය
කනට කටු අනිනකොට
අපිට පායන ඉර ගැන
හීන කෝටියක් මැවුනද
ඒ ගැන හිතලම
හදේ කිරිපැණි ගැන
කතන්දර මැව්නද

*ඩබ්.කේ.ඩබ්.කේ. විජේරත්න*
*ශ්‍රී ලංකා ගුරු සේවය 2.2*
*කෑ/දෙහි/වෙලන්ගල්ල ක.වි.*
*ගැටහැත්ත*

38

## තාත්තේ .........

දෙපා රළු වී දැතේ කර ගැට
නිබඳ මම දකිමි
සියුමැලිව නැති දෑති කුමටද
වරෙක මට සිතුනි

දහඩියෙන් ඇඟ තෙත් වෙලා
යන
අයුරු මම දුටිමි
වියලි වී ගිය තොල් පටින්
යුතු
රුව ද මට පෙනුනි

මෙලෙස දුක්විඳ වෙහෙසෙනු
ඇයි
හැමවිටම සිතුනි
මගේ බර ඔබ උරහිසේ
ඇති බවක් නොමදැනුනි

වාරු නොමැතිව දුබල වී ගිය
සිරුර මට පෙනුනි
මා නමින් ඔබ වැහැරිලා
ගොස්
අතැයි මට දැනුනි

වාව ගනු බැරි දුකක් ඇවිදින්
මහද ඉකි ගැසුණි
උරමතින් ඔබ රැගෙන මම
සියවසක් සැරිසරමි

**ඊ. ජී. ගයානි ලසන්තා කුමාරි**
**ර/මාරපන මහා විද්‍යාලය**



39

# පිය සෙනෙහේ

දිවසකරගේ ඔවදනින්
තුසරකරගේ සෙනෙහසින්
ඔවාමුතුදම්
කිරුළ පළඳා
බලා හිඳිනා පියතුමන්

හෙලා දහදිය රත්තරන්
ගෙනා ආහාර ඉස්තරම්
මහමෙරක් සේ
උසුලනා දුක්
මැදින් හිනැහෙන පියතුමන්

දූ පුතුන්ගේ මාවතේ
තියුණු කටු ඇති වෙලාවේ
දෙපතුලට දී
සිනා නගනා
මගේ ආදර පියතුමන්

සයුර පුරවා දුක දොවා
සිනාමල් කැට අතුරුවා
කිරි නුදුන් මුත්
සුවඳ පතුරා
සිතින් වැළපෙන පියතුමන්

අම්මා සමගින් සුරතලේ
දකින දා සිට සැනසුනේ
ඇත ඉදිමින්
සිතට ළංවී
සෙනේ පුදනා පියතුමන්

ඔබේ ගුණ ගී ගායනා
පන්හිදේ ඇත පැටලිලා
දෝත් මුදුනේ තබා
වඳිනෙමු
බුදුන් දැකුමට සෙත් පතා

ඩබ්. ඒ. ශිරෝමි වීරක්කොඩි
(සිංහල විෂය භාර)
කෑ/දෙහි/ගෝනගල ම. වි.
ගෝනගල

40

# මහමෙරකි ඔබ

සිංහබාහු කල,
ඔබ සිංහයා වී,
මස්, ලේ, ඇට, ඇටමිදුළු පසා
කරගෙන යන,
දරු සෙනේ අයදින්න ඇති
ඒ ගැන නොසිතා මා
සිංහබාහු ලෙස
මගේ උරුමයන් සොයා යන්න
ඇති
එදා-මෙදා තුර
මා යන ගමනේ
සතර දිශා ජය ගෙන එනතුරු,
බලා සිටින්නට
ඔබට නොහැකි වෙන්න ඇති.
ඔබේ සෙනේ ගඟ ඔබත් සමග
වියලෙන්න ඇති.
මගේ දරුවන් ළඟ නැති කළ
සිංහයාගේ දුක වඩාත් හොඳින්
දැනේ.
එදාටත් වඩා ඔබ අවැසි කල,
මහමෙරක් වී කොහේ හෝ හිඳ
මා දෙස බලනු මැන!

කේ. වී. ඩී. ප්‍රියදර්ශනී,
උපගුරු,
ශාන්ත ලූක්ස් විද්‍යාලය,




Volume One - © 2022 Department of education Sabaragamuwa

# දියණියකට තවත් පියෙකු මෙන් නොව කෙනෙක්



දස මසක් කුස නොදැරුවත් නුඹ
රුහිරු කිරි කර නොපෙව්වත්
මහ මෙරක් බර උසුලමින්
දිවිය සරි කරනට අපගේ
රුහිරු දහඩිය හෙලා,
**හිරුටත් හොරෙන් නුඹ අවදි වෙලා**

දෙපාවල සවිය පාපැදිය මත තබා
ඇවිදින් ඔබ සෙව්වේ කහවනු
ඔබගේ දිවියේ පහසුවට නොව
නිවන්ටයි අප සැමගේ කුසගිනි,
දහවලේ ගිම් නිවන්නටත්
මහ වැස්සේ නොතෙමී ඉන්ටත්
**ඉඩක් නැහැ ඔබෙ හිතට ලැබුණේ**

හිරු නිදන්නට කලියෙන්
පනං හතරක් සොයා ගන්නට
වෙහෙසුණා ඔබ හැමදිනේ,
අතට ගත බත් පතින්
අනා මසවුළු සමග
මුවෙහි තබමින් අපගේ
**පසුයි නුඹ කුස පුරව ගත්තේ**

නුඹේ පෙම දරුවන්ට දැක්වූ
තාම මතකයි පියාණෙනි මට,
නුඹේ සෙනෙහස
වියෝවූ දිනේ නුඹ
කඩාවැටුනා ජීවිතයම මගේ
දැනුණි මා හදට එදිනේ
**දියණියකට තවත් පියෙකු මෙන් නොව කෙනෙක්**

ඩබ්.කේ. පුෂ්පිකා මිය
ර/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය

නිර්මාණී
e-magazine



42

තාත්තේ,, නුඹ හුස්ම ගන්නා සද්දේ ඉඳහිට ඇහෙනවා...
නිතර ඇහුවේ නැති වුණත් මට නුඹේ දුක්ගිනි පේනවා...
කරවෙලා පිට රැලි වැටෙන තුරු රස්නෙ හදවත දවනවා...
ඉරි තැළුණු යටිපතුල් අස්සේ වේදනාවන් දැනෙනවා...

පුරන් කුඹුරක සාර අස්වනු නුඹේ දෑතින් නෙළනවා...
අරන් අත් දෙක සිඹින්නම් මම තාත්තේ දුක හිතෙනවා
අපේ හිස මත ඔටුනු පලඳා නුඹත් නිහඬව ඉන්නවා
මහමේරු සෙවණැල්ල සේ නුඹ අප වටා වැට බඳිනවා...

නුඹ කියාදුන් ජීවිතේ මං හැම වෙලාවෙම විඳිනවා
මට කලින් නුඹ මගේ ජීවන ගමන මුල සිට වියනවා...
තාත්තා යන නමට අරුතක් අනේ මං තව හොයනවා...
රජෙක් නොව සක්විති රජෙකු ලෙස ඔබ මගේ ළඟ ඉන්නවා...

හදේ පිදූ සෙනෙහසට කවිකම් අකුරු අස්සේ හොයනවා...
කොහිද උපමා නුඹේ සෙනෙහස ලේ නහරවල තියෙනවා
තනා දූවරු ගෙයින් පිටමං කරන් සුසුමන් හෙළනවා...
තාත්තේ... නුඹ ඉටු දෙවිඳුමයි දෑත් බැඳ මං වඳිනවා...

**කල්පනී වීරකෝන්**
**ජේසු බිළිඳාගේ කන්‍යාරාම ජාතික පාසල**



43

ඩහදියෙන් නිවාලූ මගේ සරතැස
සුසුම්කින් තවාලූ මගේ විඩාව
කඳුලකින් වසාලූ මගේ සිත් තැවුල
ඔබයි සැමදා පියාණනි මගේ නිවන...

කුඩා කල ගුරු පියෙකි නුඹ මට
දැනුම ගබඩා පිරී ඉතිරුණු
ළමා කල මට උගතෙක් විය
අසා දැනගත් බොහෝ දේ පිරු
තරුණ විය ආ මගේ දිවියට
පෙර ගමන්කරු ඔබය මහ යුරු
සරසවිය වෙත පිටත් වූ පසු
මගේ ගමනේ ඔබය ගුරු තරු...

මහ වියතුන් සමග රැඳී මට
ඔබම විය සුවිශේෂ වියතා
ලොව දිනන්නට හෙට දකින්නට
නුවන පෑදූ මහා මිනිසා
කිසිදු දවසක නොදන්නා වූ
කිසිම කරුණක් නොවුණු උගතා
පාසලේ දෙක පන්තියට ගොස්
ගමන නැවතූ
මගේ තාත්තා


ජී.වී. වසන්ති
ගුරු සේවය
ශ්‍රී දේවරක්ඛිත ප්‍රාථමික විද්‍යාලය


44

නොපිරුවද පෙරුමන්
දස මසක්
නොඑරුණද ළමැදෙහි
කිරි බිඳක්
අඩු නැතිව දෝතින් පුරා නුඹ
ගෙන ආවේ සෙනෙහෙ ගඟක්

සඳක් වූ මවු දයාවේ
ඉරක් වී උණුසුම් කළේ
නැති නමුදු මුව සිනාවේ
ඔබයි ලෝකය මගෙ ලොවේ

උකුළ තල ඉඩ නොදුන්නයි
කොපුල් තල සිප නොගන්නයි
ගව් ගණන් දුර පෙන්නුවයි
ඒ ද සෙනෙහස මහමෙරයි.

සවිය දුන් දෑතින් පුදා
පිය ගුණම පුදනෙමි සදා
මතු මතු ද සසරෙහි පුරා
පතමි ඔබෙ දුව වෙමි කියා.


ඩබ්.එච්.අයි.කේ. දිසානායක
රාජකීය විද්‍යාලය
කෑගල්ල




ලොවට නොපෙන්වන..... ළයෙහි නිබන්ධන...... සෙනෙහස

"ඒ තාත්තා"

"කිසිම දිනක ආදරේ කියා නැත....
තුරුලට ගෙන හිස අතගා නළවා නැත....
කුසගිනි දැනී මා හඬවා නැත....
ඒ..... තාත්තා.....
මතු බුදු වන මවට මිස මා ඔහුට ගී ගයා නැත.....
නමුදු කිසිදා ඔහු මා සමග අමනාප වී නැත.....
ඔහු සතුටින්ද, දුකින්ද, මා කිසිදා දැන
සිටියේ නැත...
හැඟීම් විරහිත මිනිසෙකු සේ මා ඔහු දැක ඇත.....
ඒ..... තාත්තා....
නොපෙනෙන දෙවියන්ට මිස මා ඔහුට මල් පහන්
පුදා නැත.......
පසුපස හිඳිමින් මා රකිනා බව ම මා හට
පොරොන්දු දී නැත.....
නමුදු මෙතුවක් මා රැකි බලවේගය අද මා
හඳුනාගෙන ඇත.....
ඒ.... තාත්තා.....
මිල මුදලින් පොහොසත් නැත.....
සෙනෙහසින් මහමෙරක් වන්ව ඇත....
දියණියක වූ මා රැකි යුරු
අදහාගත නොහැකිව ඇත.....
එවන් ශක්තිමත් මිනිසෙකු මා
කිසිදා දැක නැත.....
දනිමි එක් දෙයක්.....
ලොවට නොපෙන්වන.... ළයෙහි නිබන්ධන......
සෙනෙහස...... ඒ තාත්තා......."

**ආර්. එල්. වෙරංගා හර්ෂණී රත්නායක (සංගීත ගුරුතුමිය)**
**කෑ/දෙහි/ ආනන්දකීර්ති ම.වි.,තුන්බාගේ**



## මිය නොගිය තාත්තා

වේට්ටිය තරව හැඳ හැඩ බැලූ තාත්තා
දෙපැත්තෙන් බේදා හිස රැලි තැබූ තාත්තා
හොඳට සෝදා මැදපු ඇඳුම් ඇඳි තාත්තා
අපේ ලොවට රජ කෙනෙකු වූ අපේ තාත්තා

දෑත බරටම අරන් ගෙදර ආ තාත්තා
දොළට අප රැගෙන ගොස් නාවාපු තාත්තා
ඉරටු මිටි පහර දී වරද සෑදූ තාත්තා
පැරණි රස කතා පැවසූ අපේ තාත්තා

කිසිවෙකුට හිතේ රිදෙන වචන නොකී තාත්තා
කිසිවෙකුගෙ කිසි යමක් නොඉල්ලූ තාත්තා
අසූ විය සපිරුණ කෙළින් උන් තාත්තා
දරුන් මුණුබුරන් වෙත සෙනෙහස පිදූ තාත්තා

මල් අරන් ගමේ පන්සල් නොගිය තාත්තා
නොවැරදීම ගෙදර බුදු පහන තැබූ තාත්තා
මහා පින්කම් කරන් නම නොතැබූ තාත්තා
සම සිතින් සැමට සැලකූ මගේ තාත්තා

මිදුල පොල් අතු රටාවෙන් ඇමදූ තාත්තා
ගේ මකුළුදැල් කඩා අතුගාපු තාත්තා
දවල් දොළහට කලින් නාගත්ත තාත්තා
ගතින් මෙන් සිතෙන් තරුණ වූ මගේ තාත්තා

සුරතලුන් වුව දරුන් සේ වැඩූ තාත්තා
කිසිදාක සතෙකුගේ පණ නොනැසූ තාත්තා
පිඟානක් පුරා රස බත් දුන්නු තාත්තා
පපුතුරේ සඟවාගෙන සුවය විඳි තාත්තා

දුක සැප ද සම සිතින් විඳ දැරූ තාත්තා
මහ හඬින් සිනාසී පැන විසඳූ තාත්තා
මහ ගෙදර හැර නොයමි සපථ කළ තාත්තා
නා රජකු සේ පැරණි ගේ සුරැකි තාත්තා

ඉස්තෝප්පුවේ පුටුවෙ මග බැලූ තාත්තා
අපේ ඇස ගැටෙන විට සිනාසුනු තාත්තා
ආපසු යනෙන විට මග බැලූ තාත්තා
කිසිදාක කිසිවක්ම නොඉල්ලූ තාත්තා

පරපුරක ගරු නම්බු සුරැකී අපේ තාත්තා
අභිමානයෙන් සදා කල් ගෙවපු තාත්තා
මරුට මුව සිනහවෙන් මුහුණ දුන් තාත්තා
අපට නොකියා අපෙන් වෙන්ව ගිය තාත්තා

නිවන් පුර දොරටු ළඟ කල් බලන තාත්තා
මහ ගෙදර සිවු රියනෙ නිදෙන අපේ තාත්තා
මතුද නුග රුකක් වී සෙවණ දෙන තාත්තා
නුඹයි සැමදා අපේ මිය නොගිය තාත්තා

**K.G.ප්‍රියංකා කුමුදුනී**
**ර/ ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය**

## ගොවි අප්පච්චී

වෙල් යාය ම පුරන් වෙලා
කොක්කු රෑන කොහේ ගිහින්දෝ
ගොවි රජවරු අතහැර ගොස්
පුරන් වෙච්ච වෙල්යායේ
අප්පච්චී අද රජ වීදෝ

වේලක් හැර වේලක් කන
මගෙ කුසගිනි නිවන්න හිතිලාදෝ
මග තොට යන අය හෙළනා
සිනහ බැලුම් නුදුටුව සේ
කොක් රෑනට කෙම් බිම් තැනුවාදෝ

ඔබේ ගතේ පිපෙනා මල්
මගේ නෙතින් කඳුළු මල් සැලේ
ඔබෙ නිවහල් බව සිතන්න
වැඩ අබිමන් ඇති වියතුන්
කවදා පිං බිම බිහිවේදෝ

එම්.ඩී.ආර්.මුණසිංහ
ගුරු උපදේශක (සිංහල)
බළන්ගොඩ අධ්‍යාපන කලාපය




Volume One - © 2022 Department of education Sabaragamuwa

48

## තාත්තා

දැන් නිදාගන්නව

කොහොම හරි හිත හදාගෙන

හෙට උදේම ලියනව

තාත්ත ගැන මගේ කවිය

,දුවේ අන්න ආතා
එනව............"

තාත්ත හීනයක් දැකල

දැන් ආයෙත් නිදාගන්න

ඔය හීනය මට දීලා

ලොකු උනාම මට හැකිවෙයි

තාත්ත අද දැක්ක හීනෙ

ඒ වගේම මට දකින්න

මගේ දරුවන් සමගින්

පී.එම්.ජී. බණ්ඩාර
ගුරු උපදේශක(සිංහල)
ර/ආනන්ද මෛත්‍රය ම.ම.වි.
බළන්ගොඩ




Volume One - © 2022 Department of education Sabaragamuwa

# සිරිපතුල නුඹයි මට...

සමන් ගිර පාමුලදි තියන් කර මතින්
මුදුන් කඳු යායටම සෙනෙහෙ බර දරන්
මවන් දේවතා එළි රැයේ හරි මැදින්
සුරන් නිදි සුයාමෙත් නුඹ හිටියා ළඟින්

වලාකුළු වියන් මල් පබළු දළු හිනා
තාත්තේ ඉගිලුණත් පැටවු පොඩි ළමා
කාන්තාරේ පවා දිය බිඳිති තනා
දයාවෙන් දිවි රැකපු නෙතක් නැහැ නිමා

වාන් දමනා රැහේ වදන් රළු දැනී
සාංසාරික කඳුළු ඇස් අගින් අනී
යාන්තම් කියාගෙන නොවූ බව තනී
තාත්තා  උරහිසට වාරු කොට ගනී



දුර්ගයේ මාන්සිය හෙමින් නිවි නිවී
සිහින් තැනිතලා ඉම ගිමන් මළු ලිහී
හීන්සැරයෙන් ඇවිත් ඇසින් දුක මනී
මුනිවතිනි දරු කුරුලු ඒත් හිත දනී

පහන් කන්දක් වෙලා ආලෝක ඇසිනී
වේදනා කප්පරක් නිවන බුදු රැසිනී
නෙළා වනපස මලින් වඳිම් සෙනෙහසිනී
සිරිපතුල නුඹයි මට...සංසාර උසිනි



ශෂිකලා ජයමාන්නගේ
ර/නිවි/හඹුපේ නාවලකන්ද මහා විද්‍යාලය

50

ආර්. සුදම් සස්විදු රාජපක්ෂ
කෑගල්ල
6- ශ්‍රේණිය



51

# තිරය පිටුපස

දිය මත පිබිදී හිනැහෙන
නෙළුම් මලේ සුවඳ වින්ද
කිසිවකු සිතුවද නැවති
කලලෙහි වේදනා කන්ද

සිඳු කුස පීරා ගෙනැවිත්
මුතු ඇටයක ගෙල පැලැන්ද
දුටුවෙද එහි අගයම මිස
බෙල්ලගෙ අවසන්ම නින්ද

නෙක පැහැ ගෙන හැඩවැඩදා
දේදුන්නකි අහසෙ ඇන්ද
කිරණ නොදුන්නොත් හිරු දෙවි
ඒ ලොව විසිතුරු කොයින්ද

මව්වරු මතු බුදු වන බව
නොනැඟුනෙ කාගේ මුවින්ද
පියවරු නැතිනම් ඔවුනට
විවරණ ලැබුණේ කොහෙන්ද

පරණගම ආරියපාල
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (බලංගොඩ)

52

# රත්තරං අප්පච්චී

ඔබ සෙනෙහස ඕා බිඳු වූවේ
ඔබේ දෑත් යුග කරගැට පිරුණේ
සිනහා මවන්නයි
මා කුස පුරවන්නයි අප්පච්චි

ගනඳුර දුරලා
නැණස පාදලා
ලොවම දිනන්නට මාවත පෙන්වා
ඈතට වී නුබ සතුට සැමරුවේ
නෙතඟ ගැලූ තුටු කඳුළු සඟවලා

පතිනිය වී මා
කුල ගෙට ගිය දින
මා අතගෙන මා හිමි අතට තැබුවේ
දිවිරුම් ගෙන මා සදා රකින ලෙස
අද මෙන් මතකයි අප්පච්චි...

මා දිවි මඬලේ යෝධ සවිය නුඹ
නැත අන් කිසිවෙකු සම කරනු
නිති සෙවණැල්ලයි මා පසුපස එන
දුක මෙන් සතුට ද එකටම විදින
වෙසතුරු නුඹමයි සසර පුරාවට
මගෙ රත්තරං අප්පච්චි...

ඩබ්.එච්.එන්.එච් දයානන්ද
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (නිවිතිගල)



# අප්පච්චිට ආදරෙන්

53

දෙපයට වාරු ගන්නට
දෙඅතින් මා අල්ලා
හාත්පස ඇවිද්ද වූ නුඹට...

සිප් සතර ජයගන්නට
විදූ පියසට රැගෙන මා
පියමැන්න වූ නුඹට...

සරසවිය වෙත පිවිස
අනාගත සිහිනය කඩඉම
ජය ගන්නට සවිය වූ නුඹට
පතන්නෙමි එකදූ පැතුමක්
වේවායි මගේම පියාණන්
වන්නට මේ සසර පුරා
**නුඹම...**

***එන්.වී.ඩී.එම් සමරකෝන්,***
***කලාප අධ්‍යාපන කාර්යාලය,***
***මාවනැල්ල.***

# පියාණනි මේ ලෝකයේ සොඳුරුතම රුව නුඹයි

54

*අමතක කළ නොහැකිම*
*මතකයට එන විට දෑසට කඳුළු නංවන*
*සිත් පහන් කරවන*
*සොඳුරුම රුව........ මගේ තාත්තා*

*දෑස් පියවෙන විට*
*නිදි දෑස් අරක් ගෙන*
*සිත පුරා සැරිසරන*
*මා සමග කතා කරන*
*ඒ සොඳුරු කටහඬ........ මගේ තාත්තාගෙ*

*තව එක් වරක් දැක ගන්නට*
*ඒ සිනා මුව සමග*
*මගේ ගේ දොරකඩට*
*සෙනසුරාදා දිනට පැමිණෙනව නම් ඔබ*
*මා දකින ලස්සනම රුව..... මගේ තාත්තාගෙ*

*එච්.කේ.එල්.බී. ලක්මාලි*

# මයේ අප්පච්චී

55

කරුණා පෙරදැරිව හදවතින් හිනැහුණ
මට මහ විරුවෙක්ය දිවි අඹරේ දිදුලන
තෙදවන් බවින් සොමි ගුණයෙන් ඔද වැඩුන
අරුතක් වීය මගෙ දිවි මගට අපමණ

පින්බර මුහුණ පියතුම, අමතකව නොයේ
රසබර වදන් කවි,සිව්පද මතයකට නැගේ
හෙළි කළ මගේ අභිමානෙන් ගමනෙ යෙදේ
නොමියෙන සිහිවටනයකි මා පියතුමා ඔබයි අගේ

නිරතුරු ඔබේ තෙද ගුණ සිහි කරන්නෙමි
ඒ ගුණ මතින් මා ජීවය ලබන්නෙමී
සංසාරයේ ඔබ සොයමින් සරන්නෙමි
හැම භවයකම මා පියතුම පතන්නෙමී

**ජී.ආර්.ටී.ඩී.එම්.කපුකන්ද,**
නි.අ.අ(සෞන්දර්ය),
කලාප අධ්‍යාපන කාර්යාලය,
මාවනැල්ල.

55

55 අ

# අප්පච්චී

කුමක් නම් කරන්න ද
නුඹ නොමැති දිනෙක මං
වාලුකාවක් වේවි හදවතම
අප්පච්චි මං කෙලෙස හිතන්නද...
ඇවිදිද්දි වැටි වැටී
දෝත පා සිනාසී දිරි දිදී
නුඹ නොවෙද ඇවිදින්න යොමු කළේ...
අම්මාගේ රුහිරු කිරි බිඳු වෙද්දි
නුඹේ දහදියයි මල් පිබිදුවේ...
පොත පතින් ජය අරන් පිය මනින ජීවිතේ
රුදු ගැහැට කම් කටොලු එක විලස විඳින්නෙමි...
පන්නරය ලබාදුන් නුඹේ දිරිය වදනකින්
අදත් මා යළි යළිත් නැඟෙන්නෙමි
බිඳවැටී මොහොතකින් යළි කඳුළ පිස දමා
ඔබේ වියපත් දෙනෙත් බලන්නෙමි...
පුතේ මිස කිසි දිනෙක දුවේ යැයි නොකියූ නුඹ
අප තැනූ යේ පුතුන් විලසම ය...
ලෝකයම ජය ගන්න නුඹට හැකි යැයි කියා
එදා නුඹ කියා දී... ලබාදුන් වීරියට
ණයගැතියි අප්පච්චි... නොහැක එය
ගෙවන්නට...
නුඹේ අවසඟව ගිය දෙපා දකිද්දී
හදවතින් ඉකිගසමි...
යළි නැඟී සිනහ වෙමි...
ඔබේ සැන්දෑ සමය ගෙවෙද්දී...
මුණුපුරන් වටකරන් හිඳිද්දී...
***ඔබ රජෙකි අප්පච්චි අපේ ලොව...***
දිනා දුන් ලෝකයම අප වෙතට...



**පී.ජී.ආර්.එස්. මාධවී වෙලගෙදර**
**නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ**

# අප්පච්චී

සුදු පිරුවටය මල් වැටේ එල්ලී
බුදු කුටිය පුරා පර මල් විසිරී
මුනි ගුණ ගී ගැයුම් නැවතී
මද පවන මුමුනයි තනි කමට ඉඩදී

වෙල් දෙණි පිට දෙපා ගැටුණු පෙර දා සිහිවේ
සිව් සිය ගව් දුර පිය මැන නේක විඩා අතරේ
එලා පලස මල් වැටේ සිටන් දිව වලා තීරයේ
ඇත මැකෙන්නේ ගලේ පන්සලේ හඬ සණ්ටාවේ

සෙනෙහස් මාලිගා මළුවේ ඇද අකුරු අහුලාලා
වී පැලට සිව් රියන මුරට වැට මායිම් පාලා
කළුවර විජිතේ අරුනලු සිඳ දේදුන්න පෙන්නාලා
පිය සටහන් මත පිය තබමී, රන් තරුව පායාලා

ඩබ්ලිව්.යූ. රංජිත්
කලාප අධ්‍යාපන කාර්යාලය
බලංගොඩ.




Volume One - © 2022 Department of education Sabaragamuwa

# இருந்தபோது

தெரியவில்லை
இறந்த பின்பு அறிந்தென்ன
இதயம் எங்கும் நிறைந்தவரே- மீள உதயமாகும் நாள் வருமோ

பஞ்சு மெத்தை உன் நெஞ்சு
நான் அயர்ந்து உறங்கிட்டேன்
பஞ்சம் வந்து போது கூட நீ அயர்ந்து கண்டதில்லை

என் வாழ்வின் மாவீரன் என்னப்பன் நீதானே
என் மகிழ்ச்சியே உந்தன் எண்ணமென்பதை அறிவேன்

வியர்வை எல்லாம் சிந்திட்டாய்
எனக்காக அனுதினமும் என் உயர்வு எல்லாம் சிந்தித்தாய்
எனக்காக அனுதினமும்.

எனக்கென்றோர்
இடமதனை
எவ்விடமும் உருவாக்க எனக்குள்ளே இயங்குகின்றாய்
என் தெய்வமே தந்தாய். பீதியை ஒழித்திட்டாய் மீதியை நான் படைத்தேன்
நீதியை நிலை நாட்ட மோதியே பார்த்திட்டேன்.

"பணிவாக நடந்திடையா துணிவாக வாழ்ந்திடையா மகிழ்ச்சிக்குக்
குறைவிராது
முயற்சிக்குத் தடை யிராது" என்றாய்.

**S.P.Jesuppillai,**
**ADE, Sabaragamuwa.**




Volume One - © 2022 Department of education Sabaragamuwa

# Favorite person

**F**avorite person
**A**ntivirus for bad things
**T**ough on wrong works
**H**ard worker at all the time
**E**ncouraging at any time
**R**evolution maker in me

**F**uture maker of mine

**A**ttractive speaker of mine

**T**eller of good stories

**H**ighest point of my view
**E**xecutive person of my life

**R**eal hero of mine.

**By S.P.Jesuppillai**
**ADE, Sabaragamuwa.**

# මගේ විරුවා

සැනසීම නුඹදුන්නේ වැනසීම නොම
දන්නේ පිවිසීම නුඹ දුන්නෙ
පසුබැම නෑ එන්නේ

දහඩියට නොදුන්නේ විරාමයක්
එනිසාම ලැබ දුන්නේ සුයාමයක්
සැම තැන්හි බැබලෙන්න නොවී බියක්
ඔබ ඉන්නේ ළඟටම වී දී දිරියක්

ඔබයි මගේ විරුවා
අගෙයි ඔබේ "කෙරුවා" නිතර නිදි
වැරුවා
සතර උස්ම කෙරුවා.

**S.P.Jesuppillai,**
**ADE, Sabaragamuwa**






Volume One - © 2022 Department of education Sabaragamuwa

# அப்பா,

அகிலத்தில் நான் கண்ட அன்பின் ஊற்று.

கண்ணுக்குள் மணி போல் கடமையோடு காத்த தெய்வம்.

சிலகாலம் உங்கள் உறவு, சீக்கிரமாய் சிதைந்தது.

பறவைகள் நான் பறக்க சிறகொடிந்தது.

அப்பாவின் வெற்றிடம் அகலமாகி ஆழமானது.

பல சோதனைகள் சூழ்ந்து
சாதனைகள் பிரசவம் ஆனது.

ஒன்றல்ல இரண்டல்ல ஓராயிரம் நினைவுகள்.

அடி மனதை வருட அனைத்தும் ரணமானது.

அப்பா,
இல்லாத அருமை தெரிகிறது.

அதை
உணர்கின்றேன்.

அதனால்
வலிக்கின்றது.

அப்போது அழுகின்றேன்.

**I miss you appa.**

*තාත්තේ ඔබ දුරස් ව ගොස් ඔබ නැති බව මට දැනෙනවා , මට රිදෙනවා, මට ඇඬෙනවා.  I miss you තාත්තෙ*

**Mrs. s.manoharan ADE**
Tamil unit
Department of Education,
Sabaragamawa.



# නුඹේ හුස්ම පොද වටින්නෙ මට අප්පච්චි

තරුවක් වුණු ගෙදර බුදුන්
හීනෙනවත් නොපෙනෙනකොට
නුඹේ තුරුල හරි උණුහුම්
**මගෙ අප්පච්චි**

කවදාවත් හිස් උනෙ නැති
අපේ අටුවෙ දුව පනිනා
මී රෑනට බඩගිනිලු
**මගෙ අප්පච්චි**

මගේ ලෝකෙ ඉර දෙය්යෝ
ලණු පැදුරේ තනිවෙනකොට
මගේ කඳුළ හංගන්නම්
**මගෙ අප්පච්චි**

වැරදිලාලු පය වැදුණේ
තනි අලියත් වැලපුණාලු
ඊයෙ හවහ ඒ දෙවැටේ
**මගෙ අප්පච්චි**

ගල්කුරට සමුදෙන්නේ
හිතුවක්කාරෙට නෙමෙයිලු
නැගිට්ටාම යළි යන්නම්
**මගෙ අප්පච්චි**

මං වැහුවට වැහෙන්නෙ නැති
හිස්තැනකින් එබිබලා
තරුකැට නුඹ කෝ අහනව
**මගෙ අප්පච්චි**

කැලෑ කොළේ බඩගාලා
නුඹ කුසගිනි පුරවන්නම්
මගෙ දැනට රිදෙන්නෙ නෑ
**මගෙ අප්පච්චි**

සිදාදියේ මහත්තයෙක්
නුඹ බලන්න හෙට එනවා
හිත හයියෙන් පණ රැකපන්
**මගෙ අප්පච්චි**

රජ්ජුරුවෝ වාගේ නුඹ
වෙල් එළියේ ආයේමත්
වතුර බඳියි මං දන්නව
**මගෙ අප්පච්චි**

ජීවිතයේ සන්තකේම
උකස් කරන් රැකගන්නම්
නුඹේ හුස්ම පොද වටින්නෙ
**මට අප්පච්චි**

එච්.එම්.නෙලුකා ගුණතිලක
**ර/කරගස්තලාව මහා විද්‍යාලය**
**බෙලිහුල්ඔය**






Volume One - © 2022 Department of education Sabaragamuwa

සායමක් නැති හීන අඳුරක පාට තැවරූ සිත්තරා
සීත හිමයක උණුහුමින් මුළු හිතම රැකගත් දිවිතුරා
පාර වැරදුණ ළපටි හිතකට මං තනා දිරි දුන් සදා
ආදරේ නුඹෙ අරුත දැණුනේ මගේ ළඟ නුඹ නැති නිසා

ජීවිතේ බර තනිව ඉහිලුව නැතිව නෙත කඳුලක් පවා
තනාදැණුනේ මට එදා ඒ බර වින්දෙ නුඹ තනියෙන් නිසා
මහමෙරක් වගෙ ගෙදර බුදුනට දුන්නු දිරි නුඹ නිති එදා
නාම සුවඳයි හිතේ පතුළක නොමියෙනා සෙනෙහෙන් මෙදා

පින් පිරී නුඹෙ හීන ඉතිරුව ලොවට තැනු මං එළිවෙලා
මං මගේ ලොව දිනාගත්තෙමි අත නුඹේ අල්ලන් මෙදා
පියුම් යායක හිනාවෙන්නට එදාවගෙ හුරතල් වෙලා
හිතින් ළඟකට දුවන් එනකොට නුඹේ කෙහෙරැලි සුදු වෙලා..

එච්.එම්.නෙලූකා ගුණතිලක
ර/කරගස්තලාව මහා විද්‍යාලය
බෙලිහුල්ඔය





බී. දහම් අමයුරු නෙලුමින්ද
ර/කහවත්ත ප්‍රාථමික විද්‍යාලය
4 ශ්‍රේණිය D

62 (අ)

# තාත්තා

කළු පාට නැමි මිට කුඩය
ඇතුලු දොර පලුවට ම සවි වෙලා
වැලි රුඳුණු බොර පැහැ මිරිවැඩි සහල
එක්තැන් වෙලා
නිල් පාට ඉරි වැටුනු සුදු පැහැ සාලුවක්
පුටු ඇන්දේ තනිවෙලා
වැතිරෙන්න නෙත් අහිමි උපැස් යුවලත්
නොසෙල්වී දුකින් සිටි බලා...

හිරු මංගල්‍යයට මුළු රටම සැරසුනත්
දසත පුරාවට කොවුල් නද පැතිරුනත්
මද සුළඟේ එරබදු මල් පිපී සැලුනත්
ගෙදර නැති නැවුම් සුවඳක් ගම පුරා පැතිරුණත්
දැනෙනවා තාත්තේ
නුඹ නොමැති කළ
ම හිතට මහා පාළුවක්

තෙල් බිඳක් දැත මත තවරාන
නමදින කළ නුඹේ දෙපා
'තුරුණුවනේ සරණයි...'
ඇසෙන නැසෙන හඬින් කොඳුරන
රතු දැස් අග දිදුලන කඳුලක්
ඔහේ නිදැල්ලේ විත්
මා උර මත වැතිරෙන
ඒ කඳුළු බිඳුවක සිහිලස නම්
යළි කවරදාකවත් නොලැබෙන...

පොල් රුප්පාව ළඟ කැන්ද ගහ පාමුල
සිව් රියනක සැතපෙන
නුඹ හැදූ නිවහනේ
කැවුම් කිරිබත් නොඉදෙන
මෙදා නැකතට
කිරි නොවේ දුකම ඉහිරෙන...

*(නිමිත්ත - අප්‍රේල් 9 වන දිනක තාත්තා වියෝ විය)*

මහින්ද බණ්ඩාර විජයරත්න
කලාප අධ්‍යාපන කාර්යාලය - මාවනැල්ල

62

# පිය සෙනෙහස

ග්ලැසියරයක් වගෙයි
මිදී ඝනකමට
ඔබ මොබ පාවෙන....
හැපුණු හැපුණු කල
බිඳී විසිරෙන...
චංචල ව.... නලියන....
සෙනෙහසේ මහා සුනිල දිය දහර
වසා පැතිරුණු.....

(නිමිත්ත - සයුරේ පාවෙන ග්ලැසියර මුහුදු මට්ටමෙන් ඉහළට දර්ශනය වන්නේ සුළු කොටසක් බව කියැවේ. ඉන් 3/4 කට වඩා වැඩි ප්‍රමාණයක් ජල මට්ටමෙන් පහත කොටසේ අපට දර්ශනය නොවන අයුරින් පිහිටා ඇත. මව්වරුන් මෙන් නොව පියවරුන් තම දරුවන් කෙරෙහි දක්වන සෙනෙහස දෘශ්‍යමාන වනවාට වඩා හිත පත්ලේ රඳවාගෙන ඇති ප්‍රමාණයක් අප්‍රමාණය.)

මහින්ද බණ්ඩාර විජේරත්න
කලාප අධ්‍යාපන කාර්යාලය - මාවනැල්ල






Mandara methsadi wijesiri
R/ferguson High school
Grade -7

www.eneapiyasa.lk
pioneer of the online distance education in Sri Lanka






# පිය රජුණේ

දස මස කුස හිඳ මා බිහි නොකළාට
මව් සේ දුක් වින්දා නුඹ මහමෙර උසට
සක්විති කිරුළු පලඳන්න පැටවුන්ගේ හිසට
විඳි දුක ගැන මෙලෙස කවිකම් කුමට

සැර වැර කෝටු ගෙයි මැද සාලේ තිබුණාට
ඒ වැර කෝටු කිසිදින මගේ දැතට නොපැවට
නුඹෙ එක බැල්මෙන් මා මුව ගොළු කළා බියට
ඒ සෙනෙහස මා හොඳ මිනිසෙකු කළා ලක්මවට

බැරි බර ඇද්දා නුඹෙ ඔය දැතට
අඩුවක් නැතිව ආවත් ලොකු පොඩි කරගැට
ඒ හැම දුකක්ම නුඹ කැටි කළා සතුටකට
දුක ලියාගත්තේ නුඹනම් සින්නක්කරට

රස බොජුන් දුන්නේ සැමදාම දරුවන්ට
නුඹ කුස පිරුණේ නැහැ නොවේ නේද තුන්වේලකට
මගේ එක පැතුම ඔබ මතු බුදු වන්ට
ඒ බුදු දවස මා රාහුල පුතු වන්ට

A.W.C. නයෝමි පියරත්න
සබරගමුව පළාත් අධ්‍යාපන
දෙපාර්තමේන්තුව

# මගේ ලොව දිවිකුසුම ඔබයි ඔබමයි තරුපති



තාත්තා අප්පච්චි යැයි දරුවෝ අමතති
සතර බ්‍රහ්ම විහරණ දැක දරුවෝ සැනසෙති
දිවි සයුරේ නැව පැදයන පියතුම නැව්පති
මගේ ලොව දිවි කුසුම ඔබයි ඔබමයි තරුපති

දස මහ යෝධයෙකුගෙ බල ගත තුළ රැඳවනා
ඔබ ළය මත මනු ගුණ දම් ඇති බව වැටහුණා
ඉන්ද්‍රකීලයකි අප හට දිරි ඔද වඩවනා
දරු ලොව හිරු සඳු ඔබමයි පියතුම අදරිනා

මවකගේ සෙනෙහස අතරින් මහමෙර පරයනා
රැකවරණය දී දරුනට දසබල පරදනා
ගතේ දිරිය රන් කහවණු ලෙසිනේ හරවනා
ඔබයි මගේ දිවියේ තුරු සිසිළස ගෙන එනා

මවකගේ ලේ කිරට යොමුව දරුනට පෙව්වා
පියෙකුගේ ලේ ඩහබිඳු ලෙස මිහිමත සැලුවා
දරුනගේ ලේ මනුදම් රස මුසු කොට හරවා
මවකගේ පියෙකුගෙ ලේ බිඳු දරුවන් වැඩුවා

දැතේ බල වීරිය දී අප ඇඩි කළ පියා
ලෝකේ හොඳ නරක කියා යහ මාවත සොයා
නිරන්තරේ හැඟුම්බරේ ගුණයෙන් පිරි නියා
මෙතේ බුදුන් පා මුල දී නිවන් දකින් පියා

ජේ.ඒ.එන්. ජයසිංහ
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප අධ්‍යාපන කාර්යාලය
දෙහිඕවිට.




Good Luck to Nirmanee e-mag

67




# Onadi Nesha Damsuwi

## Whiz-Kids AMI Montessori



68

## තාත්තේ ඔබයි මගෙ ජීවන පහන

*උදුවප් මහේ සඳ ඇති සීතල රැයක*
*ලැබුවා ඔබ පිය පදවිය මගෙ පිනට*
*කන්දක් උසට පිය ගුණ කැටි වූ හදක*
*පණනල වුණේඔබෙ දරුවන් හැමදාම*

*බුදුන් ලෙසට මට හැමදා පිහිට වුණ*
*පින් කඳ ඔබයි මගෙ හද සුවපත් කරන*
*කෙටි වෙන්නට සසර නිති පෙරුමන් පුරන*
*තාත්තේ ඔබයි මගෙ ජීවන පහන*

*ඔබ නොදුටුව ලොවක සිරි අප හට පෙන්වා*
*සැනසෙනවා ඔබ මනුසත් ගුණය දරා*
*මගෙ දරුවන් ද සක්විති කරන්නට මතුදා*
*පෙරුම් පුරනවා මට සවියක් වෙමින් මෙදා*

*වාරු නැතත් දුර යන්නට එදා වගේ*
*විඩා නිවෙයි ඔබෙ ආදර වරුසාවේ*
*තවමත් බලා ඉමි ඔබ එන මඟ පෙරවාගේ*
*නැළවෙන්නට නොවේ දැවටෙන්නට ඔබ සෙවණේ.*

**W.K.I. නිලුක්ෂි ගුණවර්ධන (නි.අ.අ)**
**කලාප අධ්‍යාපන කර්යාලය ඇඹිලිපිටිය.**

69

## *තාත්තා*

සවියත් නුඹ නිසා වැටි වැටි නැගිටින්න
දිවියත් හැකි වුනා නොබියව ජයගන්න
සිතුවත් පියාණෙනි ගුණ කඳ පවසන්න
අකුරුත් මදියි හෝඩියේ එය කියවන්න

එසවිය සිතින් මහ මෙරටත් වැඩිය බර
සැකසිය දිවිය නිති ඔවදන් වලින් හර
විමසිය දනුම පොත පතෙහිද වරින් වර
පුතු විය නුඹේ කළ පිනකට සසරෙ පෙර

යොමුකළ නියම මාවතටම හැම කලට
හදතුළ රැඳුන විරුවා නුඹ මගෙ ලොවට
සම කළ නමුදු කාලය අපි රන් වලට
මිල කළ නොහැක පිය සෙනෙහස කිසි දෙයට

බැන්නා වුවද සගවා ගුණ කරුණා දයා
දුන්නා නිබඳ දිවි ගමනට අරුත සොයා
පෙන්නා දුන්න හින්දා හොඳ නරක කියා
දින්නා දිවිය දරුවන් යහ මගම ගියා

අපමණ ගැහැට දිරි ගෙන ඉවසමින් දරා
කොපමණ සිතින් හැඩුවද නුඹ අපට හොරා
මතු දින නිවන් මග වෙත පිය නගන තුරා
හමුවන මැනවි පියතුම මට සසර පුරා

**එල්.ආර්. වෙදගේ**
**කලාප අධ්‍යාපන කාර්යාලය**
**ඇඹිලිපිටිය.**





70

J.A. Subartha Sithumini Jayawicrama
Grade 10- Ferguson High School

71

# ආදරණීය තාත්තේ

දුක් අත කම්කටුලු ඔහු අත
දරාගෙන
ඒ බව අපට
නොදැනෙන්නට තියාගෙන
සැම දවසකම අපෙ දුක් දරා
ගෙන
බඩගිනි නිවයි අපෙ තාත්තා
හැමදාම

රැකියාවකට ගොස් ඔහු හැම
පැමිණෙනවා
ඒ දුක දරාගෙන ඔහු හැම
වැලපෙනවා
ඒ බව අපට සඟවා ඔහු
හිනහෙනවා
අපෙ තාත්තා රජකෙයි මට
වැටහෙනවා

අතමිට මුදල් නැති වුවත්
ඔහු ළඟම
ඒ බව මට නොපෙන්වයි
ඔහු හැමදාම
ඉල්ලන දෙයක් අරගෙන දී
ඔහු අපට
අපව සතුටු කරවයි ඔහු
හැමදාම

පෙර අත් භවයක දී ඔහු
මගේ තාත්තා වී
ඉන්නට ඇතැයි මට
සිතෙනවා සැම වේලේ
ඊළඟ අත් භවයෙදී ඔහු
මගේ තාත්තා වී
යළි ඉපදේවා යි මගේ ඔහු
තාත්තා වී

L.A.N.N. ලියනආරච්චි
කෑගලු බාලිකා මහා
විද්‍යාලය

72

දවස තිස්සේ හෙළා දාඩිදු
දැතේ කරගැට නොසළකා...
මවන්නයි ඔබ වෙහෙස වන්නේ
මගේ දිවියේ මාළිගා...
සසරෙ කළ පෙර පිනක් හින්දා
ඔබේ දුව වී ඉපදිලා ...
රකිමි සැමදා පියාණනි ඔබ
මගේ ශක්තිය වූ නිසා...

සැබෑ කරනෙමි නුඹේ සිහිනය
දිනෙක මා මේ ලොව දිනා...
පළඳවමි මං නුඹේ හිස මත
ඔටුනු සිහසුනේ හිඳුවලා...
එළඹෙනා හැම දිනය ඔබ හට
දීර්ඝායුෂ හිමි වෙනා...
පතන්නෙමි මං හදපුරා අද
පියවරුන්ගේ දින නිසා

නෙත්මි මිනාලි උදයරත්න
රත්නපුර විද්‍යාරාජ විද්‍යාලය

73

# තාත්තා

උදේ දවල් රෑ යාමය නැති ඔබට
කහට කෝප්පය වුණි දෝ දිවි රසට
ඇවිළෙන දරු සෙනෙහස මහාමෙර උසට
කොතෙක් වදන් දෙම්දෝ පියතුම ඔබට

කවි ගැයුමක් අඩු වුවත් දිවි මඩලේ
රඟදෙන විරුන් ඔබ මාගේ හද දිවියේ
ලෝබකමක් ඇතිවේ මතු බව සිහිවේ
පතනම් පියාණන් වේවා මා හැම සසරේ

ජාතිභේද නොමැතිය පිය සෙනෙහසට
සත්වභේද නොමැතිය දරු රැක ගන්නට
දිනයක් උරුම නැත පියගුණ සමරන්ට
නිති දා දෙපා වඳිනෙමි ගරු කරලන්ට

කුසල්ජිත් සේසර නානායක්කාර
රෑ/ ශාන්ත ලූක්ස් විද්‍යාලය

74

තාත්තා හරිම කරුණාවයි
අපගේ සැපදුක් ද බලයි
ගෙදරට ගෙන එන සතුටට
මගේ සිතේ සතුට පිරෙයි

දහම්දි නවංජනී පතිරණ
රෑ/ හිග්ගස්වත්ත ප්‍රාථමික විද්‍යාලය

75




සෙහස් චාතුර්ය
රෑ/ පොහොරබාව මහා විද්‍යාලය


Volume One - © 2022 Department of education Sabaragamuwa

76

# පිය ගුණ වරුණ!

දවසම වෙහෙසවී රැකියාවෙහි යෙදිලා
සපයයි දරුවනට ආහර වේලක් නිති දා
තම බත් කට ද දරුවන් වෙත පුදලා
වේලක් සපයන්න යයි රැකියාවට පසුදා

මව් සෙනෙහසට නොදෙවෙනි වුණා නොවේ
එලඇති රුකක් වී නිවසට සෙවණ වුණේ
අඩුපාඩුවක් නෑ කිසිදා දැනෙනට දුන්නේ
එනිසයි "පුබ්බචරියා" ලෙස පවසන්නේ

දහඩිය ලේ වගුරු ලෙස පෙරළා පියත් නුඹේ
සැමදා නුඹෙ සතුට පතා රැකියාවට යන්නේ
නුඹ අඳුරෙන් මුදවන්නට නේද පුතේ
සැම දුක් පීඩා විඳ රැකියාවට යන්නේ

දුක් පීඩා විඳ රැකියාවෙහි යෙදිලා
නුඹෙ ඉගෙනීම නිසිලෙස කරවයි සැමදා
මහලු අයෙකු සේ සිරුරම දුබල වෙලා
අත් ලේ කරගැට සඟවයි නුඹගෙන් සැමදා

මව් ගුණ ගැන කවි ලියැවී ඇත මෙලොවේ
පිය ගුණ ගැන කවි එපමණ ලියා නැතේ
එබව සිතා කිසිදා නැත කහට සිතේ
මවට සම තැනක් ගනීය පියා ලොවේ

**අවින්දයා මහේෂි නානායක්කාර**
**ර/ෆර්ගසන් උසස් විද්‍යාලය**

77

# සෙනෙහසේ උල්පත වූ පියාණනි

දහඩිය කඳුළු මුතු කොට කුස ගිනි නිවන
තාත්තේ ඔබයි මගෙ ලෝකේ බුදු රුවන
මහන්සි වී අප හැඩි දැඩි කළ පිනට
වඩා සදෙව් ලොව සැපවිඳ නිවන් දකිනු මැන

රජ කරවන්න දරුවන් පැතුමන් පුරන
කට දහසක් ඇතිව කීවත් නුඹෙ ගුණ නැත නිම
දිරි දී දිනනට හෙට ලොව උදාවන
සතර අපාවල නොවැටී නිවන් දකිනු මැන

ඉපදෙන සසර මග තුළ නිති පුරාවට
දියණිය විලස එන්නම් නුඹ වෙත නිබඳ
පෙම්බර පියකු වී නුඹ පෑ සෙනෙහසට
විවරණ වේවි නියතින් මතු බුදු බවට

**මනූජා කවීෂානී සංජනා වනිගසේකර**
**කැගලු බාලිකා විද්‍යාලය**

78

මගේ ආදර තාත්තා

මැස්සේ තෙමි තෙමී ආ මගේ තාත්තේ
අව්වේ කරවෙවී ආ මගෙ තාත්තේ
නුඹෙ සෙනෙහස දුන්නේ මගෙ තාත්තේ
බුදුසරණයි! මගේ ආදර [illegible] තාත්තේ





සමිත මධුෂික
ර/ නිවි/ කුට්ටිකන්ද විද්‍යාලය


Volume One - © 2022 Department of education Sabaragamuwa

# H.A.Amidu Nimsara
# Grade 6 -Ke/Mahanaga N.S

79






e නිර්මාණී MAGAZINE

# Happy Father's Day

Dad you are my world
**You are the only person,**
**Who work hard for my future**
In my every happy situations,
You are the person behind me
**Dad I can't describe you**
**with words**
In my life
You are my teacher
Leader and guider
**You are the best and**
**The kind person in this world**
You're not consider about your needs
But, every time you are try to fulfil
Our needs dad!
**Dad you are not make me unhappy**
**In any situations**
Without considering about your safe
You are always be alert of our safe dad!
**Dad,**
**You're my king**
**In my life**
***Happy Father's Day dad!***


**M.M. Amana Banu**
**Badhuriya N.S.**
**Mawanella**
**Grade 08**




# මගේ පියාණනි

අහස තරම් ලොකු ගොනු ගොඩක්
ඇත එක් හදවතක තවමත් නොකියන ගොනු ගොඩක්
හදවත තාරකාවක් වගේ කඩා වැටුණා බොහෝ දුරක්
ජීවිතය දරා සිටින අත්තිවාරම කී පියාණන්

සිනහා හරියට ජයග්‍රහණයේ කිරුළයි
දහඩිය හරියට ජයග්‍රහණයේ බලාපොරොත්තුවයි
හැඬුම් හරියට ජයග්‍රහණයේ කඩා වැටීමයි
විඳිමින් මේ සැම ජීවිතයේ කන්ද නැඟුමට හපනෙක් නං
පියාණන් මයි

සහල් ගන්නේ පියාණන් විඳි මහන්සියෙන්නේ
ඒ මහන්සියෙනුයි අපි තවමත් ජීවත් වන්නේ
පියාණන් විඳ මහන්සියි නැතිනම් අපි ජීවත් නොවන්නේ
එහෙයින් සහල් සේදීමට පියාණන්ගේ දහඩිය සුදුසු
වන්නේ

පියාණන් සිටින්නේ ශීත කළ කාමර තුළ නොවේය
පියාණන් පොර බදින්නේ හිරු රශ්මිය සමගය
සැප නොවූ මේ ජීවිත කරත්තය අදින්නේ පියාණන්ය
එහෙත් ලැබෙන පොඩි මුදලින් හරි සතුටු වන්නේ එම
මිනිසාම ය


A. P. යෙනුලි යශාරා
කෑගල්ල










Volume One - © 2022 Department of education Sabaragamuwa

82

දරු පෙම හදේ දරමින් ඔබ මහ උසට
රකිනවා මෙමා අදටත් මගෙ ළඟින් සිට
වෙහෙසෙයි යවන්නට මා ජය ටැඹ වෙතට
දෙවියා නුඹයි මගෙ ලොව සුර පුරෙන් බට

දියකර සෙනෙහෙ නිති ඔබ දා බිඳු ලෙසට
කැපකර ඔබේ මුළු දිවියම මගෙ නමට
සමහර දිනෙක අහරක් නොගෙනම කුසට
රසකර කවන්නේ ඔබ රස බොජුන් මට

ලෙඩ දුක් කිසිත් ඔබහට ඇති නොවේවා
සතුටත් සැනසුමත් නිරතුරු හිමි වේවා
කරදර සියලු බාධක මඟ හැර යේවා
ඉපදෙන හැම භවේ ඔබ මගෙ පිය වේවා

ආර්.ආර්. නිත්‍යා ප්‍රබෝදනී
ජයනෙත්ති
කෑ/ශාන්ත ජෝසප් බා.වි.
13 ශ්‍රේණිය - කලා අංශය



83

# තාත්තා

දස මස කුස නොදැරුවාට
ලේ කිරිකර නොපෙව්වාට
ඔබේ ආදරේ කොතරම්දැයි
කියන්න බෑ මගේ තාත්තේ...

රෑ දහවල් දෙක නොබලා
අප වෙනුවෙන් වෙහෙසීලා
ඔබ කරනා කැපකිරීම්
මිල කරන්න බෑ තාත්තේ...

අද වනතෙක් ඔබේ ආදරේ
පොඩ්ඩක්වත් අඩු නෑ තාත්තේ
කොහොමද මම ණය ගෙවන්නේ
ඔබේ ආදරේ වෙනුවෙන්...

ඉර පායන විට නිල් අහසේ
ඒ ඔබගේ රැස් කඳ තාත්තේ
හඳ හිනැහෙන විට අහස්තල
ඒ ඔබගේ සිසිලස තාත්තේ...

අම්මා වගේ නුඹ
මතු බුදු වෙන්නටම
පතනවා මම හැමදා
තාත්තේ...

සනුකි චනූපා ජයවර්ධන
ර/ ෆර්ගසන් උසස් විදුහල






K.M.Manugi Chiranya Deudini Konara
GRADE 4 -R/Ferguson High School, Ratnapura

85

## පිය සෙනෙහස

මවකට මෙන් හැමවිට
ජීවිතයම කැප කොට
දරු පවුලක් රැකුමට
ඇත සෙනෙහස පියෙකුට

පිය සෙනෙහස ඔපකර
හැම යුතුකම් ඉටුකර
පවුලේ ඇති මුළු බර
කරට ගනී හැම වර

විඳගෙන දුක් කරදර
දහදිය ගත මුසු කර
පියෙකුට කරුණාබර
ඇත සෙනෙහස හැම වර

සෙනෙහස පොදි බැඳගෙන
තම රැකියාවට යන
සවසට නිවසට එන්නේ
නිම නැති පියෙකුගෙ ගුණ


**K.G. අපේක්ෂා පැතුම්ණී ගමගේ**
**ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය**





86

## මගේ ආදරණීය තාත්තේ

දහඩිය කඳුළින් තෙමිලා වැඩ කරනා
නිති අප සුරකීමට කරදර දුක් දරනා
කරදර බාධක හමුවේ නොසැලී සිටිනා
ඔබ පහනක් නිවසට අපි නිති වඳිනා

ටික ටික වතුර අරගෙන මා හට පෙව්ව
දිව රෑ නොබල මා රැක ගන්නට මුල් පිරුව
කඳුළැලි හංගා ඔබ සැම විට සිනාසුණ
පියතුම ඔබ මතු බුදු වේවා මගෙ ඇස් පනාපිට

දහඩිය කඳුළු මුතු කැට වුණු නිසා ලොවේ
දිවි මං තලාවේ ඔබ සැමවිටම සිනාසුණේ
සෙවණැල්ලක් වී මගේ පසුපස නිති සිටියේ
තාත්තෙ වඳිමි පසඟ ම පිහිටා දෙරණේ

මවක් වගේ ඔබ මා හැම විටම දිරිගන්වා
හරි මග නිති යන්නට ඔබ මා හට මගපෙන්වා
කඳුළැලි මගේ නෙතඟින් ගලනා විට සිත් සනසා
ගෙන දෙයි සහනය සිත ට මගේ පියතුමා


**එන්. ඩබ්ලිව්. නිම්ෂි උමයංගනා**
**ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය**


87

## පිය සෙනෙහස

අඩුපාඩු නොම කෙරු
මා හට හොඳින් ඉගැන්නු
වීරයා නුඹයි මගේ
දිවියම එකලු කරවූ

හංගා පපු කොනේ
ආදර සුවඳ දිගේ
දැනුණා මට සෙනේ
තාත්තා නුඹයි මගේ

හිසට ඔටුනු නොපැලඳුවාට
මග දිග පාවාඩ නැති වුණාට
සෙන් පිරිවර නැති වුණාට
රජු යි මගේ ජීවිතයට


**M.G. ගගන දිල්රුක්ෂ**
**ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය**


88

## Father's Love




L.H. Akarsha Chathumini
R/ Gankanda Central College






Volume One - © 2022 Department of education Sabaragamuwa

J.P.SEWMINI BAGYA
KG/KAGALU BALIKA VIDYALAYA



**සියලු බර උසුලා ලෝකය ගොඩ නැඟූ අකුරු තුනක**
**සෙනෙහෙබර නිහඬ මනුෂ්‍යයා**

සුහුඹුල් සිනාවක සෙනෙහස කැටි කරලා
පළවෙනි හාදුවෙන් මගේ කම්මුල් තෙමලා
තුරුලේ තියන් මා ගත උණුහුම් කරලා
අදවන් දිනෙක ඔබ පිය රජෙකුත් වීලා

කරමත තබා අපෙ බර බිම නොවැ ටෙන්න
උර දී අපට ලොව දෙපයින් සිට ගන්න
වත්මන් ජීවිතේ හොඳ මිනිසෙක් වන්න
ඇරඹුම නුඹය පිය රජු ඔබ බුදු වෙන්න

නුඹ හට ඇහැකි අයුරින් අප හට දී සම්පත්
මහමෙර තරම් වූ සෙනෙහස පපුතුරෙහි දරන්
අලුයම දිවා රැය නුඹ හට නැත වෙනසක්
බඩ කට පිරෙන්නට ගත්තේවත් නෑ අහරක්

මම පොඩි වියෙහි මා කළ දඟ වැඩ දැකලා
දුනි අවවාද මා යහමඟ වෙත යවලා
දුන් ඔවදනින් පැරුණ හදවත බිඳලා
කොහි සැඟවුණිද මේ ලොව අපි තනි කරලා

කිසිදා නොගැයුවත් මව මෙන් නැළවිලි ගී
දිවා රෑ නොබලමින් ඔහු දහ දුක් විඳියී
පහනක් වෙමින් අප රැකි බුදු අප්පච්චී
නොඑනා ගමන් ගියෙ ඇයි අපෙ අප්පච්චී

දරුවන්ගේ සැප ගැන සිතා දුක් විඳින
කිසිම සැපක් නොවිඳිමින් අප ගැන සිතන
මහ මෙර සේ දරන් දුක සතුටින් ගෙවිව
කොහි සැඟවුණිද අද අප ඇත මෙහි තනිව

වචනෙන් නොකීවත් ඔබෙ තේජස පෙනුම
නිතරම පැවසුවේ යහ මග යන ලෙසය
එදා මෙන් නුඹට දෙමි මා ගෞරවය
දිනම් ලොවම ඔබ පැතූ විලසට දිනෙක

සඳා ආදරෙන් අප රැකි පියාණනි
ඔබෙ සිහිනය මම ඇත්තක් කරන්නෙමි
දිනෙක ජය ලබා කිරුළක් දරන්නෙමි
එදිනද ඔබෙ ගුණ මා සිහි කරන්නෙමි

මොන දේ හිඟ වුණත් සතුටින් කල් ගෙවුවා
වේදනාව ඉවසන් ඔබ බොහො දුක් වින්දා
හැර දා ගියත් අප අසලම සිටින පියා
මිහිපිට ජීවමාන වූ දෙවියන් තාත්තා

ජූනි දහනවය යනු පියවරු දිනයයි
එදිනට පමණක්ද පිය ගුණ දළුලන්නේ
හැම මොහොතේම අප වෙනුවෙන් කැප වන්නේ
එබැවින් අපද සැමදා සැලකිය යුත්තේ

"සතුට දිය කොට, සෙනෙහෙ මුහු කොට, අපව රැකි ඔබ, දිවි දෙවනි කොට, දෙවැනි බුදුනට නුඹව සම කොට, රකින්නෙමි නුඹ දිවි තුරාවට.
ලොව ජීවත් වෙන සැම පියෙකුටම මෙම කවි පෙළ උපහාරයක්ම වේවා..!! සියලු පියවරුන් චිරාත්කාලීනව වැජඹෙන පියවරුන්ගේ දිනයක් වේවා..!! "

**කේ.ඩී.ආර්. නදීශානි තාරකා දසනායක**
**කෑගල්ල ශාන්ත ජෝසප් බාලිකා මහා විද්‍යාලය**

91

***ජය ශ්‍රී මහා බෝධිය ඔබ වේවා මගේ පිය රජුනේ***

අම්මා සඳක් වූ මගෙ ලොව අහස ඔබයි
රිදී හිරු රැසක් ලෙස මව් හට සහය වුණයි
දහඩිය කඳුලු මුසු කොට මගෙ දිවිය රැකියි
ලොවක් ඉදිරිපිට ඔබ මට රජෙක් වුණියි

දිව රෑ නොබල මා වෙනුවෙන් වෙහෙස වුණී
ලේ කිරි නොවුණද දහඩිය හෙළුණී
නිතරම පැතුවෙ දිනන්නයි ඔබෙ දෝණී
මා වට බැඳි වැටක් ලෙස ඔබ සවියවුණී

රකිනට මාව ලොවක් සමගින් ගැටුණේ
හයියක් වෙමින් මව්නට ඉදිරිය මගෙ තැනුවේ
මිණි මුතු ලෙසින් ඔවදන් දිවියට දුන්නේ
මගෙ දුව රැජිනක් වන්නැයි කියමින්නේ

රන් කොටෙ ලෙස වචනෙන් මා ඇමතුවේ
මහමෙර තරම් දුක් ගිනි ඔබ වින්දේ
සොයුරිට මට දෙන්න ද සැප මේ දිවියේ
ආදරෙයි ඔබ කළ මෙහෙවරට පිය රජුනේ

ඔබ විදි වෙහෙස මෙතෙකැයි කිව නොහැකේ
ඔබ ගුණ ලියන්නට වචනත් මදි මට පියාණනේ
මව් බුදු වන මතු යම් දවසේ
ජය ශ්‍රී මහා බෝධිය ඔබ වේවා මගේ පිය රජුනේ

**G.G. ජීවන්ති දෙව්මිණි ගමගේ**
**ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය**

92




M.B. Menula Sacheth
4 Years old

93

## පිය සෙනෙහස

ගව් යොදුන් දුර ගියත් පිටින් ගිය මංතීරු
වැසි සුළං හෙණ අකුණු වියැළි හදවත සීරු
පවු සෝද සෝදා ම දරුවන්ටම පීරු
බුදු වෙයන් අප්පච්චි මුළු සසරෙ මං තේරු

මොනවයින් අඩුපාඩු නොකළ නමුදු පස්
නොකරන්න හිතන්නැති මහ පොළව හිස්
හොඳවයින් කවියන්ට කවි ලියනු වස්
කොයිතරම් ලස්සනද පියකුගේ ඇස්

පාන්දර තුන වෙද්දි ලිපේ ගිනි ඇවිළුණා
බඩේ බොකු දහලද්දි ඔහු එයට හුරුවුණා
පොඩි පැටවු ලොකු වෙද්දි හිතේ ගිනි මියදුණා
කාලයත් එක්කම හිසේ කෙහෙ සුදුවුණා

සොච්චමක වත්කමට හෙළු දහදිය කඳුළු
වේලිච්ච ඇස් වලට කරනවද ඔබ මුකුළු
ඇල් හාලේ නැතත් ඔහු රැක්කා මල් කැකුළු
එහෙව් පියවරුන් දෙරණ පිපි මිණි පොකුරු

වෙරළෙ හිඳ බල බලා රහට පද ගෙතුවට
නැව්යො මිස මුහුද ගැන කවියො දැන හිටියද
උහුලන්න ලේසි නෑ ඔහු විඳින දුක් කඳ
පියවරුන් අගයන්න එක් දිනක් ඇත්ද?

බැරගම ආරච්චිලාගේ තීක්ෂණා තත්සරණී
ර/ පාතකඩ මධ්‍ය මහා විද්‍යාලය

94

# තාත්තා

ගම්මානයක් රකිනා කඳු පෙළක් වගේ
කාටත් සෙවණ දෙන රුක්ස ගසක් වගේ
රටක් රකින නිල්වන් මහ සයුර වගේ
කරදර වලින් මා රකිනා පියා මගේ

දෙනෙතෙන් කඳුළු ගංගාවක් සඟවගෙන
නොකිව්වට හදවතින් ආදරය පුරවගෙන
දුක් පීඩා කරදර ඔබ ඉවසගෙන
තාත්තේ නුඹ නම් යෝධයෙකි මහ බරක් උසුලන

ඔබ මා කුසයේ නොදැරුවට
ලේ කිරි කර නොපෙව්වට
දුක් මහන්සියෙන් ඇති දැඩි කළාට
පියාණනි ඔබ මහ රජෙකි මට

දුක් කරදර මැදින් මා හැදූ දයාවෙනි
හොඳ දරුවෙක් වෙන්න මට දුන් ඔවාමිනි
සැමටම වඩා සෙනෙහස දුන් පියාණනි
සසරින් එතෙර වී යනු මැන පියාණනි

W.M. තිසරි තිලන්යා බණ්ඩාර
ර/ගන්කන්ද මධ්‍ය විද්‍යාලය

95

ඇවිදින් ටික කලයි මේ පාළු මුසල කාමරෙ වෙතට
තවදින කිහිපයයි ඇත්තේ මරණය ළඟට
සමාවෙයන් රත්තරනේ වධයක් උනා නම් උඹට
වයස හින්දා බෑ දරනට ලෙඩ දුක් දැන් තාත්තාට

පුතේ උඹලා සනීපෙන් ඉන්නවාදැ'යි සිත ගින්දරේ
වෛරයක් නෑ මගෙ පුතේ පිය සෙනෙහෙ ඉතිරේ තව සිතේ
ඇසීමට එක වරක් උඹෙ හඬ සිතී මට පෙර දින රැයේ
කෝල් ගත්තත් මගෙ පුතේ වැඩ කරේ නෑ උඹෙ නොම්බරේ...

**S. සිතාරා සන්දීපනී**
**කෑ/ ශාන්ත ජෝසප් බාලිකා මහා විද්‍යාලය**




Volume One - © 2022 Department of education Sabaragamuwa


K. Senali Iyara Silva
R/Ferguson High School
Grade-6

97

# ආදර මගේ තාත්තා

වරදට දඬුවම් දුන්නද
හද ඇතුළෙහි දුක් සුසුමන් හෙළුව
නිවැරදි මග පෙන්වන්නයි
ඔබ වෙර දැරුව
වරදට තරවටු කළ ද
අහස උසට සෙනෙහස ඇති ඔබ
මගේ ලොවේ හිරු ඔබ මයි
මගේ තාත්තා

හදවතින් ගලනා සෙනෙහස් ගඟුල
පිටතට නොගලනා සෙනෙහස් ගඟුල
අප වෙනුවෙන් ගලනා සෙනෙහස් ගඟුල
කවදා නිමක් නොවනා සෙනෙහස් ගඟුල
ඔබයි මගේ ආදර තාත්තා

කෙතරම් රිදුම් දුන්නද අප හන්දා
නොසැලී සිටි ඔබ මහා මෙර වාගේ
අම්මා හට සෙවණැල්ලක් වී ඔබ උන්නා
ඔබ කොතරම් වෙහෙසුණේද අප හන්දා

ලේ කිරි කර නොපෙව්වාට ජීවිතයට ජීවත්
වෙන්න
කියාදෙන පියෙකුගේ ගුණය ගයන්නට
පදවැල් පවතීද මේ ලෝකේ....
මතු බුදුවන් මගේ තාත්තා ...

**කේ.ඩී. රශ්මිණි පබෝදා**
**ර/නිවි/ මෙත්තාලෝක විද්‍යාලය**
**11 ශ්‍රේණිය**

98

# මගේ තාත්තා

නැළවුනාට හැම මොහොතෙම අම්මගෙ තුරුලේ
දැණුනා මට රැකවරණය තාත්තාගේ පපුවේ
නැති වුණාට හාදු නිතර ඒ රළු දෙතොලේ
පුතේ කියා ඇමතුවාම දැනුනා සෙනෙහේ

මුළු දවසම නැතිව නිවන නුඹ දුක් වින්දේ
අඩුපාඩුව නොවී කිසිත් අපි වින්දේ
අප යහමග යවනු පිණිස හෙළූ දහඩියේ
සුවඳ මෙතෙක් යැයි කියන්න නොහැකිය තාත්තේ

නුඹ එන විට රස මසවුළු රැගෙනයි එන්නේ
ඒ රසයත් අප මුහුණෙනි නුඹ රස බැලුවේ
ඔහුගේ ලොවේ සඳ තරු අපිමලු ඔහු කිව්වේ
සඳ තරු බැබළෙන අයිතිය නුඹටයි තාත්තේ




**K.A.H. තරුෂි සඳමිණි**
**ර/නිවි/ මෙත්තාලෝක විද්‍යාලය**

99




B.Salomi
R/Nivi/Houpe
Tamil
Vidyalaya
Grade 9



මේ ලෝකෙ හැමදාම එකම ලෙස පැවතුණේ
පියාගේ සෙනෙහෙමයි නෑ කිසිත් සම වුණේ
සියලු දේ කැප කරන් දූ පුතුන් සැනසුවේ
පියාණන් විතරමයි සැමදාම මේ ලොවේ

නපුරුකම ලෝකයේ හෙමින් ඔබ පෙන්නුවේ
වැටෙන්නට නොදී මා පසුපසම සැම දිනේ
දිනන්නට හැමදාම මඟ කියන් සැර කලේ
මගේ දිනුම වෙත යන්න බව හෙමින් වැටහුණේ

පියෙක් ලෙස හැමදාම වගකීම ඉටු කළේ
කිසිම දින කියා නැත මහන්සිය මගෙ පුතේ
බිරිඳවත් දරුවනුත් කෙසේ හෝ සැනසුවේ
බුදු වෙන්න ඕනමයි පියා නම් මතුභවේ

විඳි දුක් කියන්නට සමනල කන්ද මදී
කඳුළට දහඩියට මුහුදේ ජලය මදී
තෑගි පුදන්නට මේ ලෝකයත් මදී
පියා බුදු වුණත් මට නම් හිතට මදී

**D.G.D.** නිසංසලා කුමාරි
කෑ/මාව/මාකෙහෙල්වල ක.වි.



## නිවන් පුරට ගිය අප්පච්චී ......

අදත් ඉඳහිට රුව දකිද්දී දෑස තෙත් වෙයි නොදැනිම
ගෙදර සඳු දා හිරු ගියානේ අපෙන් වෙන් වී යන්නම
ගෙදර හිඩැසේ පාළු වත්තට නොඑන්නේදැයි ඇසුවම
අප්පච්චි ඇයි කිසිත් නොකියා යන්නෙ සිහිනෙන් හැමදම

ඔඩොක්කුවේ ඉඳ සරං තොටිල්ලේ තාලෙන් තාලෙට පැද්දෙද්දී
ඔබේ අතීතේ මිහිරි කතන්දර කීවේ මා හට සිනාසිසී
ඔබේ අදරැති වදන් පෙළ දැන් පසක් යටටම සිරවෙවී
ඔබේ තනියට මමත් ඉන්න ද සොහොන් කොත ළඟ වාඩි වී

ඔබේ රුව වැඳ දොරින් එළියට එන්නෙ මා හැම උදාසනේ
දැනෙයි තවමත් ඔබේ සොමි ගුණ හොඳින් මසිතට පියාණනේ
ලොවේ පිපෙනා මලක් පාසා ඔබේ නමට ම පිං පතන්නේ
නිවන් දක්නා ජාති දක්වා ඔබම වේවා මගේ පියාණනේ

**A.R.G.** චාමලී කාව්‍යා ජයසුන්දර
කෑ/ශාන්ත ජෝසප් බාලිකා මහා විද්‍යාලය






***The power of a dad in a child's life is unmatched***

103

1
පන්හිඳ අතට ගත් කවි මුත්තන්
ලියූ පිය වරුණට ගොතනෙමි ගෙත්තන්
පියවරුණේ අවසානය එක්නම්
නිවනට පැමිණෙන් මේ ගුණ වරුණෙන්

2
සන්තාපය සිය හිත තුළ නිරතුරු
නමුදු අපට දෙයි සතුටම නිරතුරු
පුබුදන වදනයි ළඟ නිරතුරු
වේදනා දරයි පියතුමා නිරතුරු

3
නැතිබැරිකම් පිය නැඟගත් අහසට
යහගුණ පුරවයි අප සිත තුටු කොට
තද අව්වේ මහ වැස්සේ වැඩකොට
අප කුස පුරවයි කලට වෙලාවට

4
රෑ නින්දේ වේදනා ද විඳින්නේ
කෙඳිරිලි ගෑමෙන් අපට ද දැණුනේ
නින්දෙන් අප වෙත සිහින දකින්නේ
අප රජ කෙරුමට කටොලු විඳින්නේ

5
රූප කාය නැති වුව අව් රස්නෙට
හිස කෙස් ඉදුණද අකාල වෙහෙසට
ඇස් වල වූවද අඩි නිදි මැරුවට
අප ආදරේ නෑ අඩුවක් ඔබ හට

6
කාර් වෑන් නැති වුණත් තාත්තේ
දිව බොජු අප හට නැතත් තාත්තේ
දිව්‍ය මාලිගා නැතත් තාත්තේ
ඔබෙ සෙනෙහස අප මතයි තාත්තේ

7
අපෙ මව් මේ ලොව නොමැති හින්දා
මා පිය වෙස් දෙක ඔබම පැලැන්දා
බඹසර වස් රකිමින් විසූ හින්දා
සහසැස් රකීවා අප පිය රජිඳා

8
දිව්‍ය යහන් වල අප හිඳුවන්නට
සිය පණ මරවයි කඳුලැලි ගොස් යට
ඇල් ජලයෙන් සිය කුසගිනි පිරුණට
අප කුස පුරවයි දිව නිති තුටු කොට

9
පයට පාවහන් නැතත් තාත්තේ
හිසට ඔටුනු නැතත් තාත්තේ
දිව්‍ය ඇඳුම් නොපැලඳුවත් තාත්තේ
මගෙ ලොව මහ රජ ඔබයි තාත්තේ

10
ආසා දේ ඉල්ලා මා ඇඬූ විට
වේදනා දැනුණද ඔබේ හද හට
මා නොදැනුව කළ මේ වරද හට
සමාවෙන්න පිය රජනේ මා හට

11
ඔහුගේ සිහින සැබෑ කරන්නට
කැපවෙමි දිවිය සරා හරලන්නට
දිනයක මා හට හරියන දවසට
ඔහු රජ වෙයි වේදනාව පහ කොට

12
පණවා කෙරුමෙන් වලකින්නට
හොර බොරු වැඩ කෙරුමෙන් වලකින්නට
බඹසර නිරතුරාවම රකින්නට
උපදෙස් දුන්නා සැමදා අප හට

13
සැමදා ඔබ තුළ ධෛරිය වේවා
සිතන පතන සැම දේ ඉටු වේවා
පිං පිරුමට ඔබ හට හැකි වේවා
ඒ පින් බලයෙන් නිවන් දකිත්වා

14
සියලු පියවරුන් හට පවසන්නේ
මත් වතුරෙන් ඔබ දුරුව වසන්නේ
තම දරුවන් සමඟින් සතුටින්නේ
නිරෝගී දිවියක් ගත කරන්නේ

15
මා ගෙතූ කවි පෙළ අවසන් වන්නේ
නොවේ ලොව පිය ගුණ අවසන් වන්නේ
මෙය පිය දිනයේ උපහර වන්නේ
සියලු පියවරුන් නිවන් දකින්නේ



සියලුම ආදරණීය පියවරුණේ ඔබ හට රෝ බියෙන් තොර, සුබම
සුබ පීතෘ දිනයක් වේවායි මා ප්‍රාර්ථනා කරන අතර මා ගෙතූ කවි
පෙළ ඔබ හට උපහාරයක් ම වේවා!

*එස්. පී. අනුෂා ලක්මාලි*
*6 / ඇඹ් / හිරමඩගම මෛත්‍රී මහා විද්‍යාලය*


Volume One - © 2022 Department of education Sabaragamuwa

Nirmanee e-magazine
First Volume - 2022 July



A.V.Naveen Gayantha Aluthwaththa
R/Sivali Central College
Grade-9

105

## අප්පච්චී

මගෙ දිවියට පැයූ හිරු අප්පච්චී
දිව රෑ දෙකේ අප රැකුමට වෙහෙසෙච්චී
කරගැට දැත මගෙ හිත හිරිවට්ටද්දී
දැසින් කඳුළු ඉනුවා ලොව ජයගද්දී

වැරැද්දක් දුටුව විටදී සැර කරලා
මිනිසුන් අතර මිනිසෙක් වන්නට කියලා
සතර දිනා එන විට මම ගෙදර බලා
කඩුල්ල ළඟ ඉන්නවදෝ හිනා වෙලා



W.A.D.P.M. පියුශානි විජේරත්න
ශාන්ත ජෝසප් බාලිකා මහා විද්‍යාලය

106 ## පිය රජුනි මට නුඹව ලෝකයක්

දස මසක් මව් කුසේ රැකි කලලෙ නුඹ නමින්
රැක්මමයි නුඹ පැතුවෙ නුඹේ දිවි පැරදුමෙන්
දුටුවා ඔබ පුංචි දඟකාරියක් සිහිනයෙන්
පිය රාජ කිරුළ නුඹ පැලඳුවේ දස මසින්

දා බිංදු වගුරුවා මුළු දවස නුඹෙ කයින්
වෙහෙස නුඹ නොතැකුවේ අප රැක්ම අරමුණින්
රළුයි නුඹෙ අත් පා ද අව් කට්ටෙ දැවටෙමින්
ඒ සියල් නුඹ වින්දෙ අපරිමිත ස්නේහයෙන්

රැකියාව පිණිස යයි ඔබ පිටව අලුයමින්
ඒත් නුඹ යන්නෙ මා මුහුණ සිඹ සනසමින්
රිදුම් දෙන අත් පාද මගෙන් සඟවා ගමින්
සැන්දෑවෙ මා හොවයි නුඹෙ උරෙහි සුරතලෙන්

කෙමෙන් මා වැඩීමෙන් පිවිසෙත්ම නව ලොවට
නුඹෙ සිතෙත් බියක් ඇති මා යයිද නොමඟකට
පිය සෙනෙහෙ අතැරදා එතෙර යා නොහැක මට
මගෙ ලොවේ පෙම් කුමරු නුඹයි හැමදාම මට

නුඹ ම'නිසා වගුරුවපු සැම දාබිඳුවටම
ගෙවනු බැරි රිසින් මා ණයගැතියි සදහටම
දිනෙක ලොව දිනා ඒ කිරුළ නුඹෙ හිස මතම
පලඳවම් නුඹයි එහි සැබෑ හිමිකරුවාම

නුඹෙ හදේ සොම්නසම සැමවේලෙ මම පතමි
රෝ දුක්ද සියල්ල ම දුරුව යන්නට පතමි
සියල්ල ම පසෙකලා මම නුඹගෙ ළඟ රැඳෙමි
හැකි සැම වෙර දරා නුඹගෙ දිවි රැක ගනිමි

මෙතෙක් කල් ඔඹතුමගෙ එකම සම්පත මමයි
නමුත් මා වැඩුණු පසු මගේ සම්පත නුඹයි
නුඹගෙ සෙත නුඹගෙ සුව සැලසීම අරමුණයි
පිය තුමනි නුඹ ලැබුණෙ මගේ පෙර මහිමෙටයි

මගෙ සෙනෙහෙ ඔබතුමට මහ මෙරක් බව දනිමි
ඉන් මිදී නුඹට දුක් සිහිනෙකින්වත් නොදෙමි
අනගිතම පිය සෙනෙහෙ නුඹ නිසා මම ලදිමි
දියණියක් ලෙස නුඹේ දීඝායු මම පතමි

ලොව සොඳුරු නිමැවුමකි දියණියක් සහ පියෙක්
එහි අගය නොහඳුනා නොමඟ යයි සමහරෙක්
සැම දෙනට ලැබෙත් නම් මගේ පිය වන් අයෙක්
මෙය වේවි මනු ලොවට එහා ගිය දෙව්ලොවක්

හෝඩියේ අකුරු මදි නුඹගෙ ගුණ ගලපන්න
වසරෙ සැම දිනෙ ම මදි නුඹගෙ ගුණ මුමුණන්න
මා ලොවට හැදූ පිනෙන් නුඹත් මතු බුදුවන්න
උපදිනා මතු භවෙත් මගෙම පිය රජු වන්න

(L.H.A. අභිමානි චාතුර්යා හෙට්ටිආරච්චි
කෑ/ ශාන්ත ජෝසප් බාලිකා මහා විද්‍යාලය )

107 කුසයේ දරා ලේ කිරි කර නොපෙව්වට
අම්මා සමය සෙනෙහස හැදු දරුවන්ට
මාවත පෙන්නුවා ගුණ දම් නැණ ලබන්නට
සුවඳයි පියාණෙනි ඔබෙ ගුණ හැමදාට

දම්හි සුරකමින් විෂද පිරි මිනිසුන්ගෙන්
හරි මග පෙන්නුවා බාධක මග හරිමින්
කුල ගෙය පිය මනින තුරු දියණිය රකිමින්
නෙත් දෙක විලස ඔහු ළඟ ඇත දියණිවරුන්

**(H.R. අදීශා නිම්නාදි පතිරණ**
**කෑගලු බාලිකා විද්‍යාලය )**

## 108 පියවරුන්ගේ දිනය අදයි

දහදිය කඳුළු එක සේ සිත දරාගෙන
තරවටු කළත් අපි නැති තැන හඬාගෙන
හිතේ තියන් දරු සෙනෙහස රඳවාගෙන
මව විතරයි ද දුන්නේ කිරි තියාගෙන

හොඳ නරක ද අප හට පහදා දෙන්නේ
දහඩිය වගුර ගෙනමයි ගෙදරට එන්නෙ
ඔබේ ආදරේ අප හට නෑ පෙන්වන්නේ
මිහිපිට දෙවියෝ ඉන්නා තැන හරියන්නේ

යහපත් දැකීමයි ඔබ හැම විට පැතුවේ
වරදක් කළත් අප හට පහදා දුන්නේ
ආදරයද සඟවා දෙන හැටිමයි දන්නේ
පියා මතු දිනෙක මව සේ බුදු වන්නේ

සංසාරයේ ඔබ අප සැම පතාගෙන
ආදරයට ද මන්දා දුක තියාගෙන
ජීවිතයේ ඔබ අප රඳවා බලාගෙන
වැටෙන විට දී අප සැම එක සේ
රඳවගෙන

පියාණෙනි නුඹේ ආදරය නොවේ නිමා
ආදරයට පිටු මදි ලියා කියා
පියා වගේ වෙන කවුරුත් නොවේ කියා
මාලිගයේ රජු ඔබමයි මගේ පියා

**H.A. කාවින්ද්‍යා ගීතාංජලී විජේරත්න**
**ර / විද්‍යාකර මහා විද්‍යාලය - ඕපනායක**
**බලංගොඩ**

## 110 *පියවරුන්ගේ දිනයට*

පියවරු දිනය
සඳමෙන් බබළන
හැකිනම් තරු වන
හැඳිනගමු පියවරු දිනය

සඳ හද ලඟ
පිය පිය දින
හැකි හැකි හැමවිට
සමරමු පියවරු දිනය

හිත ගොඩ ගහගෙන
සිතු පැතු දේ ඉටුවන
කරන කියන යම් දෙයක් ම
ඉටුවෙයි පියවරු දිනයට

**D. නිලක්ෂ රසාංජලී**

**ර/බල/විද්‍යාකර ම වි බලංගොඩ**

## 111 මගේ පියාණෙනි

තාත්තා මගේ හරි හොඳයි
අපිට ආදරෙයි
අපි හොඳ ළමයින් කරන්න
ගොඩක්ම වෙහෙසෙයි

තාත්තගේ දඟ මල්ලයි මං
තාත්තගේ සුරතලියයි මං
තාත්තගේ පණ වගේ ලු මං
පණ වගේම ආදරෙයිනෙ මං

තාත්තාගේ ගුණ ගයමි
සැමවිට ගෞරව කරමි
තාත්තාට තුති පුදමි
උදේ හවස මම වඳිමි

ඩී. මනුලි සිහස්නා දොලොස්වල
ර/බල/විද්‍යාකර මහා විද්‍යාලය

# சர்வ தேச தந்தையார் தினம்

Nirmanee e-magazine

First Volume - 2022 July





S SASIKA
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade9

113

## පිය ගුණ කවි

මම ඉපදුණ දා පටන්
වෙලා මගේ ළඟට ඉඳන්
ආදරයෙන් සිප වැලඳ අරන්
මා නැළවූ මගේ පිය තුමන්

නොහැකි වුවත් හැරවීමට රුධිරය කිරට
පෙන්වා ඇත ආදර සෙනෙහස මෙමට
වෙහෙසුනි දිවා රෑ මා රැකුමට එක ලෙසට
නොදෙවෙනි වුණා එය මව් සෙනෙහසට

නින්දට යන තුරුම හිඳිමින් මගේ ළඟට
ගැයුවා මිහිරි කවි ගී පද රසට
සිතුණා මටත් මගේ ලොව ඇති දෙවියන්ට
වෙන අන්කෙනෙක් නොව මගේ පිය රජුන්ට

මා ඇඬූ විට කරේ තියන්
වෙහෙස වුණත් නොකර ගිමන්
පෙන්නා සෙනෙහස පැතුමන්
ඇවිද ගියා දුරට ගමන්

පෙන්වයි අප හට ආලේ
නිරතුරු බැඳි ආලේ
නොනිද ඉඳන් රෑ කාලේ
රකියි අපිව හැම කාලේ

**10 - B**
**මතීශා කෞශානි**
**ර/බල/විද්‍යාකර මහා විද්‍යාලය**

114

## පිය උපහාර

පුංචි කාලේ දැඩි රැකවරණය දුන්නේ
පළමු අඩිය තියන්න කියලා දුන්නේ
දියුණුවේ රන් දොරටු විවර කරලා දුන්නේ
පියාණෙනි ඔබ පා මම නමදින්නේ

නව හිරු මෙන් අපේ ජීවිත එළිය කරන්නේ
දැඩි දුක් විඳ අප ඇති දැඩි කරන්නේ
ඔබ බඩගින්නේ ඉඳ හෝ අප කුස පුරවන්නේ
පියතුමනි ඔබ පා සැමදා වඳින්නේ

**M. දැහැමි තත්සරණී**
**කෑ/ දෙහි /වළගම්බා ම.වි.**

115

## තාත්තා

දහඩිය උණු කඳුළු කරපු
අපි ගැන වෙහෙසිලා බලපු
මලක් වගේ අපිව හදපු
මගේ පියා දෝ වෙසතුරු

හිරු එන විට ගෙදරින් යන
අඳුර අරන් ගෙදරට එන
මහන්සි වී කාසි හොයන
ආදර මගෙ තාත්තා

පවුලේ සැම සමගි කරන්න
ජීවිතයට සවි අරන්
අනන්ත දුක් විඳ සතුටින්
පවුලට සැනසුම රඳවයි

නිරෝගී වේවා
සුවපත් වේ
සිත් සැනසේවා
මගේ ආදර තාත්තා

**W.P.N යසස්මා**
**Vidyakara Maha Vidyalaya**

116




**එම්.සචික දෙනුවන්**
**ර/ඇඹ/ රාහුල ජාතික පාසල**
**ගොඩකවෙල**
**4 ශ්‍රේණිය**



e නිර්මාණී MAGAZINE

## 117 පීතු පාදං නමා මහං

ගෙදර අයගෙ කුසගිනි නිවා දමන්නෙමි
උදයත් රෑකුත් නොබලා වෙහෙස වෙමි
තුන්වේලට වේලක්වත් නොකන්නෙමි
සංසාරේ බුදු වන්නෙමි පියාණෙනි

මුතු කැට මෙන් දහඩිය බිඳු බිම හෙළවේ
දෑතේ ගැටිති එන තෙක් ඔහු බිම කෙටුවේ
බඩගිනි නො තකා වැඩ කටයුතු නිම කෙරුවේ
අපි දුටු විටදී මුව අග සිනහව පෑවේ

පවුලේ සමගිය ඔහු නිතරම බැලුවෙ
එක බත එකට අනලයි අපි රස බැලුවේ
පියා සමග බත් කට කට රස බැලුවේ
දිව බොජුනක් පරදයි ඒ බොජුන් පතේ

උපන් උපන් හැම භවයෙම මගේ පියා බුදු වේවා
උපන් උපන් හැම භවයෙම මගේ පියා මගේ වේවා
කරන වැඩක් යනඑන එම මඟ හැම දෙවියන් රැකදේවා
මගෙත් ආයු ගෙන මගේ පියා ජීවත් වේවා

K.W. ගයත්‍රී චතුරංගි
ර/බල/ විද්‍යාකර විද්‍යාලය

## 118 පියවරුන්ගේ දිනය වෙනුවෙන්

උදෑසනම අවදි වී සියලු දෙයම සොයා
මල් කඩලා සුවඳ මලින් හිමි පාමුල තියා
දරුවන් හැර කිසි විටෙකත් ඒ මේ අත නොයා
වෙර දරනවා අප රැක ගන්නට ආදර මගේ
පියා

දැනුණේ නැහැ මා හට කිසි විටකදී තනිය
සමනල කන්ද සිංහරාජ මහවැලි ගඟ වැනිය
සමකළ නොහැක ඔබ හට හිමාලයේ වනය
වෙන්කළ හැකිද කිසිවිට පියවරුන්ට දිනය

දහඩිය මහන්සියෙන් හොයන සෑම මුදලක්ම
වියදම් කරන්නේ අප ජීවත් කිරීමට
මෙම මස යෙදී ඇති පියවරු දිනට
පතමි සුභ පැතුම් සියලුම පියවරුනට

ඊ. එම්. සවිඳු සුලක්ඛණ
ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය

## 119 තාත්තේ

මතකයි තාත්තේ නුඹ
සෙව්වා නිතරම මම
ගොස් වැඩට ආ විගස
ඇස් දුවයි මා වෙතට

වෙහෙස නොබලා මාව
වඩාගෙන තුරුලු කර
දුන්න හැටි රස කෑම
සිහිවෙයි එදා මෙන් අද

වචනෙන් නොකීවත් මට
නුඹේ තේජස් පෙනුම
නිතරම කීවේ මට
හොඳින් හැදෙන ලෙසට

එදා මෙන් අදත් මම
ගරු කරමි ඔබේ නමට
ආදරෙයි හැමදාම
නුඹේ දියණිය නුඹට





ඩබ්ලිව්. ඒ ශලනි පූර්ණිමා බණ්ඩාර
ර/ බල / විද්‍යාකර මහා විද්‍යාලය

120

## මගේ තාත්තේ

කුඩා කල මා තුරුලු කරගෙන
නිදි කරවූ මගේ තාත්තේ
ඔබේ කර මත තබාගෙන මා
රජෙක් කරවූ මගේ තාත්තේ......

හැම උදේකම ආදරෙන් මට
බත් කැවූ ආදර තාත්තේ
හැම දිනකම පාසැලට මා
ගොසින් ඇරලූ මගේ තාත්තේ......

යහ ගුණැති ආකල්පයෙන්
මාව පිරවූ මගේ තාත්තේ
අම්මගේ සැරවැර වලින් පොඩි
මාව ගැලවූ මගේ තාත්තේ......

රටට වටිනා දියණියක ලෙස
මාව ඇති දැඩි කළ තාත්තේ
ලබන භවයේත් මගේ පියා වී
නැවත එනවද මගේ තාත්තේ......?



එච් විනුදි සනායා සනුත්මී කුමාරසිංහ
කෑ/ඩඩ්ලි සේනානායක ම.වි
තෝලංගමුව

121

## තාත්තා

මා රැකුමට ඔබ වෙහෙසුණි තාත්තේ
මගේ ලෝකෙ රජු ඔබමයි තාත්තේ
පාරමිතා පුරන කලදී මම ඔබ ළඟ තාත්තේ
කවදා හෝ ඔබ බුදුවන මගේ ආදර තාත්තේ

ලේ කිරිකර පෙවූ නැතත් තාත්තේ
ඔබෙ තුරුලම මට සැපතකි තාත්තේ
ජීවිතයම කටු අකුලත් වුවත් මගේ තාත්තේ
පසු උපදින හැම භවයෙම ඔබ මගෙමයි තාත්තේ

ගසක දොඩම් අප ඉල්ලන විටදී පියා
අහසෙ තරු ඉල්ලූ විට දුන්නු පියා
මුහුදු දියෙන් නැවූයෙ නැතත් පියා
සතර අපායේ නොවැටී නිවන් දකින් පියා

ඉල්ලන විටදි අහරට දේ දුන්න පියා
බීමට යමක් ඉල්ලූ විට දුන්න පියා
තුන් වේලෙන් එක වේලක් කැව පියා
සැකයක් නෑ ඔබ බුදු වෙයි මගේ පියා

අචිනි පවන්යා ශ්‍රීමාලි දිසානායක
ර/බල/ විද්‍යාලෝක ම වි

122

## පිය ගුණ කවි

හේනේ පැලේ රෑවෙන තුරු පැල් රැකලා
අපි ලෙඩ උනාම අපගේ ලෙඩ දුක බලලා
අපි සැමට ආහාර හෙම ගෙනැවිත් දීලා
තාත්තා අපේ මතුවට අනේ බුදු වේවා

අකුරු තුනයි අර්ථය ඊටත් වඩා හොඳයි
නරක වැඩක් කෙරුවොත් ඔහු අවවාද දෙයි
අම්මා වගේ නැතුවට ඔහු අපට ආදරෙයි
ආදරයට අපි ඔහුට තාත්තාද කියයි

දරුවෙකුට දෙන ආදරය අම්මා දුන්නාට
පියතුමනි ඔබ පහළට වැටුණාට
මවගේ පිටුපස පියතුම හිටියාට
අපේ ආදරේ එලෙසමයි ඔබ දෙදෙනාට

රස්සාවට ගොස් එන විට රෑ වෙනවා
එන විට අපට රස ආහර ගෙනවිත් දෙනවා
සැම වේලාවකම අපෙ සැප දුක බලලා
තාත්තේ ඔබ හැම භවයක බුදු වෙනවා



පාරමී
**8-A**
ර/බල /විද්‍යාකර ම වි


Volume One - © 2022 Department of education Sabaragamuwa

123



# මගේ තාත්තා

තාත්තා හොඳයි
කරුණාවන්තයි
අපිට ආදරෙයි
අපිත් ආදරෙයි

රුහිනි නෙසංගා සමරසිංහ
ර/ කුමාර විද්‍යාලය

124




ඩිනලි ශානුදි වික්‍රමසිංහ
ර/ ඇඹි/ ජනාධිපති විද්‍යාලය
4 ශ්‍රේණිය

125

## තාත්තා....

ආදරය නිතරම පෙන්වන්නේ
නෑ.
නමුත් ඒ උතුම් හදවතේ
මහා සාගරය වගේ ආදරේ
පිරිලා තියනවා.
ඒත් ගැඹුරු මුහුද
වගේ නිහඬයි.
ඒ තමයි තාත්තාගේ ආදරය.

මතකයි තාත්තෙ නුඹ
සෙව්වා නිතරම මම
ගොස් වැඩට ආ විගස
ඇස් දුවයි මා වෙතට....

වෙහෙස නොබලා මාව
වඩාගෙන තුරුලු කර
දුන්නු හැටි රස කෑම
සිහිවෙයි එදාමෙන් අද

වචනෙන් නොකීවත් මට
නුඹේ තේජස් පෙනුම
නිතරම කීවෙ මට
හොඳින් හැදෙනා ලෙසට

සිහිවෙද්දී නුඹේ වත
උනයි කඳුළැලි නෙතට
නමුත් බෑ හඬන්නට
නුඹට දුක සිතෙනා නිසා මට

එදා මෙන් අදත් මම
ගරු කරමි ඔබෙ නමට
ආදරෙයි හැමදාම
නුඹේ දියණිය නුඹට


**ජී. කේ.භාග්‍යා සුදර්ශා කුමාරි**
**9 ශ්‍රේණිය**
**කෑ/දෙහි/වහකුල ක.වි.**


126

## ආදරණීය අප්පච්චි

ලේ කිරි කර නොපෙව්වා ට
අම්මා මෙන් නිතර හුරතල්
නොකෙරුවා ට
දහඩිය වගුරුවමින් මා
පෝෂණය කිරීමට වෙහෙස වූ
ඔබ
ගැන පියාණෙනි කෙසේ නම් මා
කියා නිමකරන්න ද ?

සෙනෙහස උතුරා යන ආදරයක්
ඔබේ හිතේ තියාගෙන මා යන
මඟ ආරක්ෂා සලසා දෙන
නිතරම මට නොපෙන්නුවාට
ඔබේ හිතේ තියෙන ආදරය
මා දන්නවා මගේ පියාණනි.

*සියක් ආයු ලැබ*
*මගෙත් ආයු ගෙන*
*මටත් වඩා කල් ඔබ ජීවත්*
*වේවා!*


**ඩී.ආර්. ලුෂ්මිකා නෙත්මි**
**9 ශ්‍රේණිය**
**කෑ/දෙහි/වහකුල ක.වි.**


127

පාසල් ගමනේ පළමු දිනේ
හැර නොයන ලෙසින් ඔබෙ කර මත
හැඬූ මම
දොළොස් වසරකට පසුවත් පතනෙමි
ඔබෙ කර මත හිඳ පාසල් ඒමට
දහඩිය දුක් ගිනි සිනහ මුවින් හිඳ
සඟවන්නට කළ ඔබෙ ඒ වෑයම
සිතා ගන්නටත් බැරි බව දැනී මම
ලොවක් අප තිදෙනගෙන් තොර
ඔබහට

දහඩිය මුතු කැට මෙන් සිඹ කරගැට
වෙව්ලන අතපය සමග වුවත් ඔබ
කාන්තාර වුව සාගර කෙරුමට
දෙවරක් නොසිතයි අප වෙනුවෙන්
ඔබ

දහසක් වූ පැතුමන් ඇත අප
වෙනුවෙන්
ඔබේ කඳුළින් පිරි ඒ නෙත් අග
දුටුවේ මම ඒ දිනයේ "නිසැකව
දොස්තරවරියක් වනවා" කී විට
සත්සයුර ම එක් කෙරුවත් දෝතට
මැන බැලුමට ඔබේ ගුණ නොහැකිය
මට

දවසක් නොව මුළු සසරත් මදි මට
දාරක ස්නේහය ඔබගේ වැනුමට
ඇත් රජුනේ ඔබෙ තේජස් පියවර
තැබුමට පාවාඩ එලනෙමි තව තව

ලබන භවෙත් හැම පතනෙමි ඔබගේ
සුළැඟිල්ලේ එල්ලී පා තැබුමට
තම පිය සුනබයකුට හිමි
කුඩුවකට සිරකරනා අඳුරු කාලයක
පලදිනවාමයි මතු දවසක රජ කිරුළක්
මාගේ පිය රජිඳා හට
දෙවොලක නොව අප අතරෙම
සිටිනා
දෙවියන් බඳු වූ අප්පච්චි හට
තුති පුද පතනෙමි සුබ පියවරුනගෙ
දිනයක් වේවා මාගේ විරු හට ! ....


**එස්. ප්‍රභාවි නෙත්මිණි ඊශා වීරසිංහ**
**ර/ෆර්ගසන් උසස් විද්‍යාලය**

# තාත්තා

කෝටියක් දුක් උසුලා අප වෙනුවෙන් කැපවෙන පියතුමා වෙත

සිත සුව කෙරූ පින් සුව ලැබූ
සෙනෙහසක් අපට දැනුණා
දා බිඟු වැහි රූ
කඳුලැලි වැතිරූ
ඔබයි ඒ උත්තරීතර චරිතය

මහා සෙනෙහසක් සේ ගිම් නිවූ
දරූ සෙනෙහේ දරා
රජ කිරුළු දරා
නව ලොවක් තනනු පෙනුනා

අප තනි නොකෙරූ
සෙනෙහසක් නොමළ විට
තාත්තේ.......
සැනසීම සිතට දැනුනා

ඇස නොමැතිව අප පෝෂණය කළේ ඔබයි
දැතෙම කරගැට දාගෙන අප වෙනුවෙන් මුළු දවසම වෙහෙසී
බඩට බත් ඇටයක්වත් නොකා අප වෙනුවෙන්ම කැප වුණා
අපේ සැනසීම ඔබයි මාගේ මව පියා වූයේ ඔබයි මගේ
තාත්තේ

කෝටියක් දුක් උසුලා යාන්තමින් සිනාසී අපට ශක්තියක් වෙන
ඔහු අපේ තාත්තා.......

බී. නිමේශා සංදීපනි
නිවිතිගල



# ආදර පියාණෙනි

අන් කිසිත් නොපතන
දරූ දියුණුව පතන
නිතරම කීවේ මට
හොඳින් හැදෙනා ලෙසට
මතු මතුත් බුදු වන
ඔබයි මා ආදර පියාණෙනි.......

මතකයි පියාණෙනි නුඹ
සෙව්වා නිතරම මම
ගොස් වැඩට ආ විගස
ඇස් දුවයි මා වෙතට

නිහඬව නිසසලව
වින්ද දුක් සාගරය
මෙලොව දන්නේ ඔබ හැර
සක්වළ දෙවිඳු පමණය

සිහි වෙද්දී නුඹේ වත
උනයි කඳුළැලි නෙතට
නමුත් බැහැ හඬන්නට
නුඹට දුක සිතෙන නිසා මට......

එදා මෙන් අදත් මම
ගරු කරමි ඔබෙ නමට
ආදරෙයි හැමදාම
නුඹේ දියණිය නුඹට........

ඩී. එම්. කවීෂා විදුමිණි
ර/නිවි/මෙත්තාලෝක විද්‍යාලය



# නුඹ කරපු හැම කැප කැපකිරීමකට ම මම සදා ණයගැතියි තාත්තේ ......

ලේ කිරිකර
වැඩෙන්නට පෝෂණය නොදුන්නත්
ජීවයක් බිහි කර
එයට
පෝෂණය හා ආරක්ෂාව දෙමින්
රැකුව ඔබ
දෙවියන් හා සමානය
දිවා රෑ
වෙහෙස නොබලා
දැතෙහි කරගැට පැමිණියද
කුසට අහර ද නොමැතිව
අප පෝෂණය කළ
ඒ මහා උත්තුංග පුරුෂයා ඔබය
වැටෙන්නට යන විට වැටෙන්නට
නොදී
යන මග සාර්ථක කර ගන්නට දිරි
දුන්
මාගේ දෙවියන් ඔබයි පියාණෙනි
මගෙ ආයුෂත් ගෙන
තවත් විරාජමාන වීමට ලැබේවා !
සුබ පිය පියවරුන්ගේ දිනයක් වේවා
ඔබට
මගේ අප්පච්චි.....

රළු වුණාට නුඹේ දැත
මං ආසයි අල්ලන්න
සුළඟිල්ලේ එල්ලිලා
කුඩා අවධියේ මෙන්
ඔයත් එක්ක ඇවිදින්න
තවමත් මම කැමතියි

මහාමේරුව තරමට නුඹ
පෙම් කරනවා නොපෙනුණාට
මම දන්නවා
ඔයාගේ පණ
හැමදාමත්
මං කියන්න
සතුටු පනම් මගෙ ලෝකෙට
අහිතක් නැතුව හැමදා
දිවි දෙවැනි කොට මා රකින්න
වෙහෙස වෙන්නේ ඔබම තමයි

මගෙ අප්පච්චි
අම්මා තරමට ආදරය
නොපෙන්නුවත්
තාත්තත් හිතින් බැඳුණේ ම
දරුවන්ටයි
සසර පුරාවට
දැනෙන දුක් උහුලගෙන
වැටුනත් කඳුළු නොපෙනෙන්න
පිහදගෙන
උදේ හවා තාත්තත් පැතුවෙ
තම දරුවන් උදෙසා
දුකක් නැති හෙට දිනක්
දන්න දා සිට
සරම, කමිසය, පාවහන් දෙක
දමා සැරසී
ඒ තරම් වග නොදැන
ලොව ම ඉල්ලා කුඩා අවධියේ හැඬු
මා
උසින් උස් වී මුහුකුරා ගොස්
අදින පලඳින ඇඳුම් මා හට සැප
වෙච්චි
නමුත්
සරම කමිසය ඇඳි
මගේ පියා
තාමත් පුරුදු ලෙස දිවි ගෙවයි

හැමදේම නැති වුණත්
මොකක්වත් නොවුන ගානට
සිනසුණේ තාත්තා.....
නොවිඳිනා දුක් ගැහැට වින්දත්
ගෙදර ඇවිත්
කෙඳිරියක් වත් ගාන්නෙ නැතිව
වේදනාව ඉවසුවේ තාත්තා....
කවුරුන් අපව හැර ගියත්
කවදාවත් අපව හැර නොගිය
එකම මනුස්සයා
තාත්තා......
තුන් වේල කෙසේ හෝ
අපේ බඩ කට පුරවන්න
තවමත් දුක්විඳින
මිහිපිට වෙසෙන එකම දෙවියා
තාත්තා......
සියලු බර උසුලා
ලෝකය ගොඩ නැගූ
අකුරු තුනක සෙනෙහෙබර
නිහඬ මිනිසා

සතුට දියකොට
සෙනෙහස මුසු කර
අපව රැකි ඔබ
**'තාත්තා'** නම් විය
දෙවැනි බුදුනට නුඹව සමානකර
රකින්නෙමි
නුඹව මගේ දිවිය ඇති තුරාවට

මතු බුදු බව පතන්නට
පැතුමක් හිතේ නැතත්
දහදිය කඳුළු වගුරවමින්
රන් කෙත් වතු අස්වද්දා
මහා නුග රුකක් මෙන්
පැළ ඉනි රැකගැනීම හේතුවෙන්
දෙව් බඹුන් පවා
නුඹේ පාද
නමස්කාර කරති
ලෝක පියවරුන්ගේ දිනය
අද සමරලා
හෙට සිට නැවත
තාත්තා භූමිදානය කරන්නා වූ
අධම මිනිසුන් ඉන්න සමාජයක
උඹේ දරුවන්
උඹ යන අඩි පාරේ යන කල්හි,
දැනේවි,
මතක් වේවි,
විඳවාවි,
පියගුණ අපූරුවට
සිතන්න
අප කෙතරම් අපේ දෙමාපියන්ට ණය ද?
ඒ ණය ගෙවන්න හැකිද?
ඒ ණය ගෙවීමට නම්
කළ යුත්තේ,
ඔවුන් අප රැක්කේ දිවි දෙවැනි කොටයි
එලෙසම අපිත් දිවි දෙවැනි කොට
ආයුෂ නිමවෙන තෙක්
අපේ යුතුකම් ඔවුන්ට
ඉටු කරමු



**කේ.ඩී.ආර්. නදීශානි තාරකා දසනායක**
**ශාන්ත ජෝසප් බාලිකා මහා විද්‍යාලය**


Volume One - © 2022 Department of education Sabaragamuwa

131

# මගේ පියා

දාඩිය කඳුළු මුතු කොට වැගුරුවේ නුඹ හිත ඇති දරුපෙම ට
දිනෙක මයෙ පුත් රජු කරවන්න පැතුමන් පුරන.....
නැත කිසි දිනෙක පෙනුමෙන් හැඬුවේ අපට පෙනෙන්නට.....
නමුත් නුඹ හඬන්නට ඇති සයුරු තෙමෙන්නට......

හවසට එනකොට ඔබ දෙසට මා දිව එන විට දී......
ආසම දෙයක් මා අත තියා වැළඳ ගනී.....
ඒ උණුසුම් ගැන කියනට මට වචන මදි....

උදයක් දවාලක් නැතිව නුඹ මා ගැන......
මවනවා මා පුත රජ වන සිහින හීසර......
මේ රජුගෙ පිය රජු කරනට මමත් වෙර දෙමි සිහින තුළ.....

මා ගොතන ලද සිහින නමැති රත්නාවලියෙහි වටිනාම
රත්නය නුඹයි මා පියාණෙනි......

දිනක බුදු වන මැන පිය රජුනි.....

## ඒ.පී. හිරුනුවනි විජේනන්ද
**11 - ශ්‍රේණිය**
**කෑ/ශාන්ත ජෝසප් බාලිකා මහා විද්‍යාලය**

132

හිතම පින් කාරයි දෑස් සතුට ඉතිරිච්චි...
කූඩුව ම දැන් පැටවුන්ගෙන් හැඩ වෙච්චි...
ආදරය, සෙනෙහස මැදින් මහ බරක් පැටවෙච්චි
දින, සති, මාස, අවුරුදු ඉක්මනින් ගත වෙච්චි
හිච්චිගෙ කනකර අලුත් වෙච්චි
පාට අරුංගල් කනේ හරි හැඩයි කෙලීගෙ හිච්චි
දැන් දැන් බර තව තව වැඩි වෙච්චි

සියොලඟම දහදිය මල් පැළ වෙච්චි
කාසි පනම් ළඟ මුලු හීනම දිය වෙච්චි
කමිසේ ඉදිකටු පාර ගැන වත් නෑ නිච්චි
බඩ පොත්ත ඇකිලිලා ගහක් වගේ ඇකි ලිච්චි
සැපක් වෙන කොයින්ද පැටවුන්ගේ බඩ පිරිච්චි

කල ටික ටික ඇදි ඇදී පහු වෙච්චි
දරුමල්ලො ටික ටික ලොකු වෙච්චි
ලොක්කිට දරු දෙන්නයි දැන් මද්දුට එක කෙල්ලයි
වෙච්චි
කාසිපනම් ඇති මුත් තවමත් ගෙදර බාල හිච්චි
පැටවුන්ගේ ජීවිත කලඑලි වෙච්චි
කඩුල්ල ළඟ තවමත්, කුඹුක්ගහ ළඟ ඒ කය දිරච්චි
වාසියට බර නොහී නිහඬ පෙම්කළ ප්‍රේමවන්තයා නුඹ
වෙච්චි.....
රැලි පිරුණු මූණ, අත, පය, දර වෙච්චි සමුදුර තැනවූ
නිල් පිනිකැට නුඹ වෙච්චි.... අප්පච්චි

**සෙනෙලිකා ආශිර්වාදිනි බෙන්තරගේ**
**ර/සීවලි මධ්‍ය මහා වි.**

133

සිරුරේ ලේ කිරි නොවුණත් මතු ඔබගේ
දහඩිය කඳුළු මුතුකැට ලෙස ඔබ හෙළුවේ
කුසගිනි දරා අපේ කුසගිණි ඔබ නිවුවේ
මගේ ලෝකයේ පෑ සඳමඬලද ඔබ වේ

දෑතේ කරගැට වලින් පිය සෙනෙහස
පෙන්වා
දරුවන් දෙස බලා ඔහු සැනසුම් ලැබුවා
නැතිබැරි කමක් අපි දිවියෙන් සැඟවූවා
දහඩිය කඳුළු හෙළමින් අපි රජ කෙරුවා

අම්මා නමට කවි ගී ලියුවත් කවුරු
පිය සෙනෙහසට තිබුණේ නෑ හෝඩියෙ
අකුරු
කොපමණ වේදනා තිබුණත් සිත රිදවූ
කිසි දිනෙක මැකුවේ නෑ ඔහු අපේ මුහුණේ
සතුටු

පිය සෙනෙහසක දරු දුක් උතුරා ගැලුවා
අම්මා වගෙම අපමණ දුක් ඔහු වින්දා
ඉල්ලූ සැණින් අප හට සුර සැප දුන්නා
පදවැල් අමුණලා මම නුඹෙ ගුණ ලීවා

**ඩී. හංසිකා ප්‍රබෝධිනී**
**කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය**
**11 ශ්‍රේණිය**

134

**“වැටීමට පෙර අල්ලා ගැනීමට අවශ්‍ය නමුත්**
**ඒ වෙනුවට ඔසවාගෙන ගොස්,**
**නැවත උත්සාහ කිරීමට ඉඩ දෙන**
**පුතෙකුගේ පළමු වීරයා,**
**දියණියක ගේ පළමු සැබෑ ආදරය**
**පියාය.**
**අප අඬන විට අපව අල්ලාගෙන සිටින,**
**නීති කඩ කරන විට අපට බනින,**
**අප සාර්ථක වූ විට,**
**ආඩම්බරයෙන් බැබළෙන**
**අප අසාර්ථක වූ විටෙක දී පවා**
**අප කෙරෙහි විශ්වාසය තබන**
**තමන්ගේම දරුවා හඳුනන**
**සැබෑ පිය සෙනෙහසක**
**අරුමය ගෙනෙන**
**ආදරණීය පියාණන් වෙත,**
**පුදමි මෙය මම”**

**එච්. විශ්මි සංකේතා**
**කුරු/ඩඩ්ලි සේනානායක මධ්‍ය වි.**



135

# පිය පදවියට උපහාර කරමු

දයාබර පියාණෙනි,
ජීවන ගමනේ පහන් ටැඹ නුඹයි.
වචනයෙන් නොකීවත් මට
නුඹේ තේජස් පෙනුම
නිතරම කීවේ මට.
හොඳින් හැදෙනා ලෙසට
දහසකුත් බාධක මැද
නොසැලී පිය නගන්නට
දිරිය දුන්නේ නුඹයි.
වැරැද්දට දඬුවම් කළත් මට
හිතින් හැඬුවා ඔබ
වැරැද්දට දඬුවම් කරන්නට
දෙපාරක් හිතන්නැ ඔබ
එහෙම කරපු හින්දා නුඹ
අද ජීවත් වෙනවා හරි විදියට මම.
දුර මෙන්ම ළඟද එක ලෙසින් බලන්නට
හුරු කළේ ඔබයි මට.
මගේ ජීවන ගමන එළිය කළ
ඉරබට තරුව නුඹයි.

**හිරුක අමරසිංහ**
**10 ශ්‍රේණිය**
**ර/බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය ම.ම.වි.**

136

# මගේ ආදර තාත්තා

ඔබේ දිවියම අපට කැප කළ
අපේ අරමුණු සඵල කරනට
සදා අප රක්ෂා කරන
මගේ ආදර පියා නුඹමය

දුකක් වූ විට ළඟම ගැවසෙන
ඔවා දී අපෙ දුක් නිවාලන
මගේ ලෝකේ රජුන් නුඹමය
මගේ ආදර තාත්තේ නුඹ

මගේ සතුටම ඔබෙත් සතුටය
මගේ දියුණුව සදා පතමින
මතු භවේදිත් එන්න ඔබ
මගෙ තාත්තා වී මගේ ළඟටම

**E.M.මිහිදිනි ශාවින්ද්‍යා එදිරිසූරිය**
**ර/ ශාන්ත ඇග්නස් බාලිකා මහා**
විද්‍යාලය
බලන්ගොඩ

137

# පියවරුන්ගේ දිනයට පුංචි මගෙන් නිසඳැසක්

දෑත් කර ගැට නැගෙන තෙක්ම
දිවා රෑ නොබලා
දහදිය වගුරා
අපව පෝෂණය කළ
අප දිවියේ පලිහ
ආදරණීය පියාණනි

දිනක් පුරාවට
අදහස් කීමත්
කියා නිමකල
නොහැකි චරිතය
ඔබයි ආදරණීය පියාණෙනි

දියණියකගේ
දිවියේ හොඳම
ආරක්ෂකයා වන්නේ ද
ඇයට සිටින හොඳම
ආදර වන්තයා ද
ඔබයි පියාණෙනි



**K.A. විනෝද්‍යා හංසමාලි**
**ර/ බල/ විද්‍යාකර මහා විද්‍යාලය**

# පිය සෙනෙහසට කව් ගී ලියැවුණා මදී

හිරු සඳු අතරින් නිවසේදී නුඹයි ඒ සඳ,
එළිය නොවැටෙන්නටත් පෙර සිය ගෙයින්,
නික්මී යන ඔබ සන්ධ්‍යා අඳුරේ
නැවත පිය නගන්නේ.....

ඒ සඳ එළිය රැගෙන
මා මව් කුස පිළිසිඳ ගත් දා පටන්,
මවට දුන් ඒ වේදනාව, ඇය හිත
තුළ ඇති කළේ,
අසීමිත ආශාවන්, හීනයන් වුවද
එදින පටන් දිවි බර දැනුණේ
නුඹටයි.....

දූ, පුතු ගැනම නිතරම සිතූ නුඹ,
වගුරපු ඒ සෑම දහඩිය බිඳුවකම
මහමෙරකටත් වඩා තිබූ දරු සෙනෙහස,
හදවතේ සිර කරගෙන ලොවට දැක්වූ
ඒ රළු පෙනුම මෘදු මලක් සේ
සියලු දරු හදවත් තුළ හැමදාම
රැඳේවී......

රෝග, වසංගත, අවලාද, අපහාස
පිරුණු රණ භූමියෙහි සටන් කර
වෙද සිසුවියන්, ඉංජිනේරුවරියන්, නීතිඥවරියන්
අතරින් හොඳ කාන්තාවක්
දැකීමට උත්සාහ කර
මවට පිටුපසින් හිඳ මා දිරිගැන්වීමට වෙරදැරූ
සැමට පළමුව ජීවිතේ මට,
අප සැමට හමුවූ මුල්ම පිරිමියා
නුඹයි.......

විටෙක තිත්ත කසායක් පැරදූ,
ඔය මුව තුළ වරදදී තිබුණු ඒ
කේන්තිය
සමාජය මට වටහා දෙන්නට දැරූ ඒ
වෑයමේ
තවත් එක් ආලයකි.
සක්විති රජුන්ගෙන් පවා වැඳුම් ලැබීමට
සමත් වන ඔය දෙපාමුල වැටෙමි
සැමදාම.....

කඳුලේදිත්, සිනාවෙදිත් ඔබේ ආසිරි ලබන්නට,
හැම සසරේම මට ඔබේ දූ වීමට
වරම් ලැබේවි.......
මව තරමටම දිවියේ වටින කෙනෙක් වේනම් ඒ ඔබමයි.
සත්තයි.

*ලෝකවාසී සියලුම පියවරුන්ට*
*උපහාරයක්ම වේවා!....*

**එල්. එල්. ඩී. සඳුනි කෞශලයා**
**ර/ෆර්ගසන් උසස් විද්‍යාලය**
**12 - C ශ්‍රේණිය**
**නො. 84, දිමියාව,**
**දම්බුලුවන, රත්නපුර.**



# යමුද සෙව්මට තරු සොයුරන්

දැනේ සිසිලක් ගතට සමගම වතට සතුටක්
හමා යයි මද නල සිහිකර කුඩා අවධිය
උරමත ගිය සැටි බලමින් තරු පිරි අහස
පිය නගමි මනසින් නැවත බැලුමට සොඳුරු අතීතය

පාසල නිම වී පැමිණ මඟ බලා සිටියෙමි ඔබ එනතුරු සමඟ රටකජු
සිටියෙමි සවන් යොමා ඇසෙන තුරු සයිකලයේ හඬ
හැඳුවා සැලසුමක් යාමට කමතට ඔබ සමගින්
බැලුමට පැමිණි දැයි අහසට මගේ සොයුරු තරුකැට

ඇසුණා දුර සිටම ඔබ එන හඬ නද කරමින් සීනුව
සැඟවුණෙමි දොර පිටුපස සිතමින් බිය ගැන්වීමට ඔබ
පැන්නෙමි ඉවතට ආ විට ඔබ අසලට
සිනාසී බිය වූවා ඔබ සැමදා පුරුදු විලසින්

ගෙන උර මතට කියමින් සුරඟනකැයි මා
අසමින් යමුද බැලුමට නිශා ගුවන
ඇත තරු සොයුරන් විසිරී අහස පුරා
නිවි නිවී දිලෙන තොරණක මෙන්

දින සති ගෙවුණේ ඊයක විලසින්
ගියෙමි දුර සිප්හලකට කෙරුමට සැබෑ ඔබේ සිහින
වූවා අවිවේක ඇත කෙරුමට බොහෝ පොත් වැඩ
හැකිද හිඳුමට එනතුරු නිමකර

වැඩුණත් සිරුරින් උස් වී ඔබේ උසටම
හැකි නොවුණත් ගැනීමට උර මතට ඔසවා
යමුද සෙවුමට කොයිදැයි තරු සොයුරන්
චූටි දෝණි සහ අප්පච්චි පෙර සේ

සය වසරක අතීතාවර්ජනය

**B. G. N. M. වීරවර්ධන**
**ර/ සීවලි ජාතික පාසල**



# මගේ ලෝකයේ වීරයා තාත්තා

හැම කෙනෙක්ගෙම ජීවිතේ වීරයා
අද ළඟ හිටියත් නැතත් ඒ වීරයාගේ තැන
වෙන කාටවත් ගන්න බෑ
ඒ මොකද ඒ චරිතයට සමාන කරන්න කවුරුත් නෑ
කරගැට එනකන් වැඩ කරලා
දාඩියට ෂර්ට් පෙඟෙනකන් මහන්සි වෙලා
අපි දිනද්දී සතුටු කඳුළු ඇස් වල හංගාගෙන පපුවට
තුරුල්කරන්
පිටට තට්ටු කරලා සුභ පැතුවේ තාත්තා
අපි වැටෙද්දී අපිටත් හොරෙන් හැංගිලා අඬලා
ඒ රතු ඇස් හංගාගෙන ආයෙම නැගිටින්න වාරු දුන්නේ
තාත්තා
අම්මා කඳුළු හෙළද්දී ප්‍රශ්නවලදී දුර්වල වෙද්දී
පවුරක් වගේ හැමෝවම රැක්කේ තාත්තා
තාත්තා කරපු දේවල් කරන්න පුළුවන් තවත්
තාත්තා කෙනෙක්ට ම විතරමයි

අව්ව වැස්ස දෙක නොබලා
වෙහෙසී දහඩිය සලලා
මා රැක ගත් මගේ තාත්තාට
වඳිමි නළල බිම තියලා

**ඊ. කේ. සංජනා හසිනි සඳනෙත්මි**
**කෑ/රාජකීය විද්‍යාලය**
**10 ශ්‍රේණිය**



*එකම එක දවසක මට හමු වුණා දීප්තිමත් තරුවක්*
*ඒ තරුව ලබන්න තරම් මම හරිම වාසනාවන්තයි*
*ඒ තරුව මට ගොඩාක් දේවල් කියලා දුන්නා*
*මේ තරුව තමයි මගේ ජීවිතේ හැරවුම් ලක්ෂය*
*මේ තරුව එක දවසක් මට මෙහෙම දෙයක් කිව්වා*

*පුතේ ඔයා කවදාවත් ජීවිතේ පරදින්න එපා*
*ඔයා කවදාහරි ජීවිතේ පැරදුණොත් ඒක පිළිගන්න එපා*
*ඒ ජීවිතේ දිනන්න උත්සාහ කරන්න කියලා*

*එදා මට දුන්න ඒ උපදෙස කවදාවත්ම මම මග හරින්නෙ*
*නෑ කියලා ඒ තරුවට මම පොරොන්දු වුණා*

*මම කවදාවත් මේ දීප්තිමත් තරුව නැති කරගන්නේ නෑ*

*ඒ වටිනා දීප්තිමත් තරුව ආයෙමත් මට ම ලැබේවා!*
*කියලා මම ප්‍රාර්ථනා කරනවා.*

**K. R. ඉනූෂා මිහිරංගනී**
**කෑගලු බාලිකා විද්‍යාලය**






**S.H. Kavindi Savithma Nelumdeniya**
**KE/Dudly Senanayaka Central College**
**Grade 3**

e නිර්මාණී MAGAZINE

142

## ආදරයේ උල්පත වූ පියාණන්

ලේ කිරිකර නොපෙව්වට
ඔබයි ලොවේ උතුම් ගත
දරු ලොවේ වීරයා වුණෙත්
නුඹ
ආදරේ උල්පත නිසා බව
දනිමි පියාණෙනි
ආදර...
දැනෙන්නට ආදරේ නොකළට
නුඹේ ආදරේ දැණුනා
මට
අග හිඟ කම් තිබුණ ද
දැනෙන්නට හැරියේ නැත
ඔබ....
ඔබයි සැමදා ලොවේ උතුම් මා
හට
පියාණෙනි ආදර...
පියාණෙනි ආදර...

කේ. තසුනි වර්ෂා පෙරේරා
**8 ශ්‍රේණිය E**
**කැගලු බාලිකා විද්‍යාලය.**

143

## හිරු ද සඳු ද ඔබමය මට

*පුංචි මගේ ලෝකයේ*
*ඔබට තියන ආදරේ*
*ලියන්න මදි වචනවලින්*
*හිතේ තියන ආදරේ*
*හිරු නුඹයි*
*සඳුත් නුඹයි*
*එළිය කරන ලොව මගේ.....*

J.A. සුභාර්තා සිතුමිණි ජයවික්‍රම
**ර/මිහිඳු විද්‍යාලය**
**2 ශ්‍රේණිය**

144



**කේ. ඒ. ඩී. විදුනි ගිහන්සා ධර්මවර්ධන**
**ර/මිහිඳු විද්‍යාලය**
**2 ශ්‍රේණිය**

145

# පිය සෙනෙහස

ගගන තලය තාත්තාය
සඳ හිරු තරු දරා ඉන්න
මුළු ලෝකය පුදුම කරන
සත් සමුදුර තාත්තාය
සමනල කඳු මුදුනෙ ඉඳන්
සිව් දිග සිව් අතට ගලන
හැම දෙනාට ජීවය දෙන
මහා ගඟුලැල් තාත්තාය
ගෙදර බුදුන් නොවුණත් නුඹ
අපේ බුදුන් තාත්තාය
මගේ ලෝකේ රජ්ජුරුවෝ
සැමදාමත් තාත්තාය

ජී. ජී. දිනේත්‍රා හංසනී
කෑ/දෙහි/වහකුල ක. වි.
9 ශ්‍රේණිය

146

# තාත්තා

උල්පතක් වූ ආදර සාගරයක්
හද තුළ කැකැරෙමින් දෝරෙ ගලන
කැඩපතක් නොවූ මග තුළින්
සෙනෙහසේ ඉඟියක් හෝ නොපෙනුන

ජීවිතයේ නැමැති මහා සිත්තම
වර්ණ ගන්වන මහා සිත්තරෙක්ය,
"ඔනි" යන ද්විත්ව අකුරු
කිසිදා වරකට වඩා නොඇසුව

යථාවාදී තථාකාරී
සියසින් දුටු මහා පෞරුෂත්වය
දිනයක් නොව කල්ප කාලයක්
ලෝකයේ අමරණීය ප්‍රණායේ ස්වරය,
"තාත්තා"

යූ. සඳුනි දිලංකා උඩවත්ත
ර/ ෆර්ගසන් උසස් විද්‍යාලය

# ආදර තාත්තා

147

හදවතේ රුවාගෙන
මහමෙරක් සෙනෙහසද
නෙතින් නොහඬා ම නුඹ
හදවතින් ඉකි ගසන
ගතින් ගලනා දහඩිය
දෙඅතින්ම පිසදාන
දිවා රෑ වෙහෙසෙන්නේ
අපෙ දිවිය රැක ගන්න
මහා දුක් කම්කටොළු
දෝතින්ම තුරුලු කර
අපට ජීවය දුන්නු
ඔබ අපේ විරුවා ය

ජී. ජී. දිනේත්‍රා හංසනී
Kg/Dehi/ Wahakula k.v.
9 ශ්‍රේණිය

148

**ගලා හැළෙන ගඟක් තරම් සුන්දරය**
**මගේ සවිය නුඹයි ආදර තාත්තේ**
**පියා නමට නොහැක සමාන කළ හැකි**
**දෙය මිහි මඬලේ මෙතුවක් කල් නුඹයි**
**මගේ තාත්තේ**

ඊ.එම්. සවිඳු සුලක්ඛණ
ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය



149

# අසමසම ය සැමදා නුඹ මගේ ම වේ

කාලය ගෙවීයයි
කරදර බොහෝ පැමිණේ
දුක් කම්කටොළු සිතේ අපමණය
ගතේ සවිය උපරිමයක් නො මැතිව
වෙහෙස වෙයි
ඒ ඔබගේ සැප පිණිස නොව
දිවිමඟ සරු කරන්නට
අනාගතය සරු කරන්නට
තමාගේ කුමර කුමරියන්ගේ
නැත ලොව කිසිවෙකු මොහුට සමකළ හැකි
ඔහු **ශක්තිසම්පන්න එඩිතර පුරුෂයෙකි,**
**වීරවරයෙකි,**
කිසිදා අන් අය අනුකරණය නො කරන
**කඩවසම් තරුණයෙකි,**
සිතෙන් මෙන්ම හැඩරුවෙනුත්,
විටෙක දරුණු වන අයෙකි
නමුදු කිසිත් විනාශ නො කරන,
තවත් විටෙක අහිංසකය,
සැමදා එලෙස අහිංසක බව නො පෙන්වන,
**පඬිවරයෙකි.**
ලොව ඇති සියල්ලම මනා ලෙස දන්නා
**ගුරුවරයෙකි.**
ලොව කා හටත් සම කළ නො හැකි
දැනුම ඇති
අමිල අපහට
සැමදා අත්හරින්නට නො හැකි ලෙස
**රජෙකි.**

150

අධිරාජ්‍යයන් පාලනය කරන
විටෙක හැඟුම්බරය
එය කිසිදා නො පෙන්වන
**වෛද්‍යවරයෙකි**
නිසි ලෙස අවශ්‍ය වේලාවට ප්‍රතිකාර කරන
මෙපමණ කීමට ඇත්තේ කා ගැනද?
වෙන කිසිවෙක් නොව
ලොවට ම සිටිනා එකම කෙනා වේ
ඔහුගේ රාජධානියේ කුමරිය දුවයි.
ඒ මහා අධිරාජ්‍යයක් හිමි වූ කෙනා
එහි අධිරාජ්‍යයේ, රජතුමා වේ
වෙන කවුරුද ඒ මගේ තාත්තා' යි
තාත්තා යනු ජීවිතයේ සදාකාලික වීරයායි
ඉතිං
පතන්නම් සසරින් සසර නිවන් දකිනා තුරා
වෙන කිසිවෙකුගේවත්ම නොවී මගේම තාත්තා
වෙන්න
ලියන්නෙමි බොහෝ දෑ
කල්ප ගණනක් වුවද නුඹ ගැන
**සසරින් සසර නුඹ ඉපදෙන්න මගේම වී....**
**ආදර තාත්තේ...**

**පී.කේ. බුද්ධිනී දීපශිකා සේනාරත්න**
**ර /කලවාන ජාතික පාසල.**




Volume One - © 2022 Department of education Sabaragamuwa

151

# උපන් දා සිට

ඔබ මා අසල ම රැඳී සිටියා
කතාව කොතරම් අඩු වුවත්,
අප දෙදෙනා අතර,
රැකවරණය නො අඩුව ලැබුණා

යම් වරදක් කළත් මා .....
එයට ඔබ තරවටු කළේ මට
යම් දිනෙක හොඳින් හැදෙන ලෙස
දුක සිතී හදවතට .....
කතා නො කර සිටියත් මා සමඟ ......
රාත්‍රී නින්දෙන් එය හමාර විය හැම දිනෙක ....

දන්නව ද තාත්තේ නුඹ .....
වචනෙකින් නො කීවත්,
නුඹට එය නො පෙනුණත්,
ආදරෙයි මගෙ මුළු හදවතින් ම
මම නුඹට .....
එ පමණක් නොව ....
යන එන හැම ගමනකදීම ....
යෝධ සෙවණැල්ලකි ඔබ මට ....
මා මෙතෙක් ලැබූ සෑම ජයග්‍රහණයක් ම
සැබෑ හිමිකරුය ඔබ ....
කප්පරක් පැතුම් පොදි බැඳ ....
ක්‍රියා කරන්නම් මා ...
ඔබ මා වෙනුවෙන් කළ .....
සෑම කැප කිරීමක් වෙනුවෙන් ම ....
මගේ යුතුකම් මැනවින් ඉටු කිරීමට

කේ. සෙනාලි ලියරා සිල්වා
ර/ ෆර්ගසන් උසස් විද්‍යාලය

152

# මගේ තාත්තා

උපන් දා සිට ම මම...
රැකවරණය ලැබුණි මට...
මගේ මවට දෙවැනි නොව...
රජෙකි මට මහ මෙරට...

පෙර පාසලේ සිට ම...
මේ මොහොත දක්වාම...
අත නො හැර රැගෙන මම..
නැණ නුවණ දුන්නු ඔබ...

වෙහෙස කොතරම් තිබුණා....
නො පෙන්නා කිසි දිනෙක...
දුන්නු හැටි රස කෑම....
මතකයි මට පෙර සේම...

සිහි වෙද්දී නුඹේ වත...
නුඹේ තේජස් පෙනුම...
ආදරෙයි මහ මෙරට...
සදා මගෙ ළඟ ඉන්න...

එදා මෙන් අදත් මම....
ගරු කරමි ඔබෙ නමට....
ආදරෙයි හැමදාම....
එකම දියණිය නුඹට....

කේ. සෙනාලි ලියරා සිල්වා
ර/ ෆර්ගසන් උසස් විද්‍යාලය

153





Nirmanee e-magazine

G.M.D.Sithija Sithumina
R/Royal college
Grade-6

# පියාණනි

155

කරදඹු රිදෙනකම් ඔබ වැඩ කළේය
වෙහෙස මහන්සිය ඔබ හට සුළු දෙයක්ය
උදේ පටන් ඔබ වැඩ කළේය
මතු බුදු වේ ඔබ මගෙ පියාය

පියෙක් යනු මතු දින බුදු වෙනවාම යි
තාත්තේ හඬනු එපා
මගේ සිත රිදෙන නිසා
ඔබ වැඩ කළා තමා හොඳට
ඔබට ගොඩක් පිං දෙනවා ඔබගේ දියණි
මම

සචිනි ධනංජනා
ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය

156

ගතේ සවිය
හිතේ විරිය
එක්තැන් කර
දහඩිය වැගිරූ
නුඹ ...

ඔබේ හද රැඳි දුක
ලෝකයෙන් සඟවා
ජීවිතය දිනන්නට
අපේ මාවත
විවර කළ නුඹට
සියලු දුක් නිවා
ජීවිතය නුඹේ
ලස්සන වේවා
තාත්තේ ....

ටී.ආර්. සිහාරා සෙව්මිණි
ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය

157

වෙහෙස වී වැඩ කරන
ලැබෙන දෙයින් අපව පෝෂණය
කරන
පියාණෙනි....
ඔබ මට මහමෙරක් වැනිය!
ඔබ මට මහත් ශක්තියක් ද වේ
අප රජ කරවීමට
ඔබ දරනා වෙහෙසට
මා හට ණය ගෙවා නිම කළ නො
හැක
පියාණෙනි ......
උපදින හැම සසර භවයකදී ම
ඔබ මගෙ ම පියාණන් වේවා!

O.B. චමුදි දෙව්දිකා
ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය

# තවමත් ඔබේ පුංචි දොණි යි මා

158

පුංචි කාලේ මා ලුණුකරේ
ගෙනියාපු, ඔන්චිලි පද්දවා
සෙල්ලම් කරවාපු,
රසබත් ගුලි කවා උරහිසේ
නිදි කරවාපු, චූටි දෝණිම'යි මා
ඒ කාලේ දඟ කරපු...
මිනිසුන් මේ වගෙයි කියාදී හැමදේම
ජීවිතේ එළිය කළ හිරු කිරණ නුඹයි
මට ....
ඉවරයක් නැත මගේ කන් කරච්චලේ
අසා
වුවද අදත් නුඹ සිනාසෙයි කිසි
තරහක්
නැතිව,
කුමාරයෙක් හම්බුණත් මට කියා
මතුදාක, මගේ ලෝකේ රජ්ජුරුවෝ
තාත්තයි හැමදාම .....

ඩී.තනුෂා තේෂාණි වීරසිංහ
කෑ/ ශාන්ත ජෝශප් බාලිකා මහා විද්‍යාලය

159



J.K.W.L Jayaweera
R/St. Luke's College



eනිර්මාණී MAGAZINE

P.R.Manushi Nehansa Damsarani
Kg/St. Joseph's Balika Maha Vidyalaya
Grade -2



161

මතකයි තාත්තේ නුඹ
සෙව්වා නිතර ම මාව
වැඩට ගොස්ආ විගස
ඇස් දුවයි ඔබ වෙතට...

වෙහෙස නොබලා ඔබේ
වඩා ගෙන තුරුලු කර
දුන්න හැටි රස කැම
සිහිවෙයි එදා මෙන් අද...

වෙහෙස නො කීවත් මට
නුඹේ තේජස් පෙනුම
නිතරම කීවේ මට
හොඳින් හැදෙන ලෙසට...

සිහි වෙද්දි නුඹේ රුව
උණු කඳුළු ගලා යයි නො දැනීම
නමුත් බැහැ හඬන්නට
ඔබ හැඩුවා හැමදාම
මට නො දැනෙන්න ....

එදා මෙන් අදත් මම
ගරු කරමි ඔබේ නමට
ආදරෙයි හැමදා
නුඹේ පුතු නුඹට ....

**K.B.A. ජයශාන් සදරු**
**ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය**

163

මගේ පියාණනී...//
මා මෙලොවට උපත ලැබූ දින සිට
මා ඇති දැඩි කළ පියාණනී
පොළොවට පය තබා ඇවිදින ට
උදව් කරපු මගේ පියාණනී
පොඩි කාලෙම වැරදි සදා
හොඳ මිනිහෙක් කෙරූ
මගේ පියාණනී ....//
නුඹගේ දෙපා නැමද ලා
මා යන සැම තැන යන විට නුඹගේ
ආශීර්වාදය මට ලැබ දෙන්නා
දහඩිය මහන්සි වී මා ඇති දැඩි කළ
මගේ පියාණනී...//

**W.G.** හෂාන්
ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය

164

*හැම කෙනාගෙම ජීවිතේ වීරයා*
*අද ළඟ හිටියත් නැතත්*
*ඒ වීරයාගේ තැන වෙන කාටවත් ගන්න බෑ*
*මොකද ඒ චරිතෙට සමාන කරන්න කවුරුත් නෑ*
*මෙහෙවරක් තරම් ආදරේ හිත අස්සේ හංගාගෙන*
*ආදරේ කරන්න පුළුවන්ද කෙනෙක්ට*
*ඔව් පුළුවන්*
*හැමෝම කියවනා අම්මා නැති ජීවිතේ අඩුවක්ලු ඔව්...*
*ඇත්ත ඒත් එහෙම කෙනෙක්ගෙන් අහලා බලන්න*
*තාත්තා දුන්නු ආදරේ රැකවරණේ එක්ක අම්මා නැති*
*අඩුව දැනුණද කියලා*
*උත්තරේ නෑ*
*අප ඉපදුණ දවසේ ඉඳන් අපේ හැම අඩු පාඩුවක්ම*
*පිරිමහන*
*තාත්තාට අම්මා නැති අඩුව පිරිමහගන්න බැරිද?*
*කරගැට එනකන් වැඩ කරලා දාඩියට ෂර්ට් එක*
*පොඟලා*
*මහන්සි වෙනවා*
*ඒ අපි වෙනුවෙන්* .....

එච්.ජී.කේ. නෙත්මි කෞෂලයා
ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය , ඕපනායක

165

*මා ආදර පියාණනි...*

*මා ඉපිද දා පටන්*
*වෙහෙස වී වැඩ කරනා*
*මා ආදර පියාණනි...*
*මගේ කුස පුරවා ආදරයෙන්*
*සෙනෙහසින් රැකවරණය දෙන*
*මා ආදර පියාණනි...*
*ඔබ වන් පියකු ලබන්නට*
*මගේ පින්බලය අපමණය*
*මට සිතුණි.*
*ඔබේ ගුණ කඳ මෙසේ*
*පත්තිරු අතර සනිටුහන්*
*කරමි......*

ආර්.බී. සිනෙති විහංසා
ර/බල/ විද්‍යාකර මහා විද්‍යාලය

166



K.M.Yumeth Binuwara Nethvidu Konara
Grade 2 R/Ferguson High School

167

## ආදරයේ උල්පත වූ පියාණන්

ලේ කිරි කර නොා පෙව්වට
ඔබයි ලොවේ උතුම් ගත
දරු ලොවේ වීරයා වුණෙත්
නුඹ
ආදරෙ උල්පත නිසා බව
දනිමි පියාණෙනි
ආදර...
දැනෙන්ට ආදරෙ නො කළට
නුඹේ ආදරෙ දැනුණා
මට
අග හිඟ කම් තිබුණද
දැනෙන්නට හැරියෙ නැත
ඔබ...
ඔබයි සැමදා ලොවෙ උතුම්
මා හට
පියාණෙනි ආදර...
පියාණෙනි ආදර...

කේ. තසුනි වර්ෂා පෙරේරා
8 ශ්‍රේණිය E
කෑගලු බාලිකා විද්‍යාලය

## තාත්තා

168

කුඩා කල සිට ම මා ළඟ ඔබ සිටින
ලෙඩක් දුකක් හැදුනාමත් ළඟ සිටින
මා සතුටින් තබන්නට ඔබ වෙහෙස විය
මගේ ලොවේ රජ්ජුරුවෝ පියා විය.

යහපත් අයහපත් දේ මට කියා දෙන
ඉගෙන ගැනීමට ඔවදන් ලබා දෙන
හොඳ මිතුරන් ඇසුර මා හට කියා
දෙන
මට ඇති එකම සම්පත පියතුමනි ඔබ.

මාගේ ඉගෙනීම වෙනුවෙන් වෙහෙස
වෙන
පාසැල් පොත් උපකරණ මා හට
ගෙනත් දෙන
පාසැල් වැඩ කිරීමට මට උදව් දෙන
පියාණෙනි ඔබයි මගේ ලොව බබළවන.

H.G.P. හෙට්ටිආරච්චි
ර/සීවලී ජාතික පාසල

නි
ර්
මා
ණී

169

එකම එක දවසක මට හම්බුණා
දීප්තිමත් තරුවක්
ඒ තරුව ලබන්න තරම් මම හරිම
වාසනාවන්තයි
ඒ තරුව මට ගොඩක් දේවල් කියලා
දුන්නා
මේ තරුව තමයි මගේ ජීවිතේ
හැරවුම් ලක්ෂය
මේ තරුව එක දවසක් මට මෙහෙම
දෙයක් කිව්වා

පුතේ ඔයා කවදාවත් ජීවිතේ පරදින්න
එපා
ඔයා කවදාහරි ජීවිතේ පැරදුණොත්
ඒක පිළිගන්න එපා
ඒ ජීවිතේ දිනන්න උත්සාහ කරන්න.

එදා මට දුන්න ඒ උපදෙස කවදාවත්
ම මම මගහරින්නේ නෑ
කියලා ඒ තරුවට මම පොරොන්දු
වුණා.
මම කවදාවත් මේ දීප්තිමත් තරුව
නැති කර ගන්නේ නෑ
ඒ වටිනා දීප්තිමත් තරුව ආයෙමත්
මට ම ලැබේවා !
කියලා මම ප්‍රාර්ථනා කරනවා.

කේ. ආර්. ඉනුෂා මිහිරංගි
7 ශ්‍රේණිය
කෑගලු බාලිකා විද්‍යාලය

170



171

සිදුහත් කුමරු
ලොව අනියත බව කීවා...
පියාණනේ ඔබ
මිනිසුන් ගැන කීවා...
අප ලෙඩ උන විටදි පියතුම
ඔබ හැඹුවා...
අප දුටුවේ නැතත් පපු තුළ
දුක තිබුණා...//

නෙළුම් මලක් වන් නුඹගේ
ඔය මුහුණ...
අප වෙනුවෙන්ම වෙහෙසී
පරවෙලා ඇත...
මා හට තිබෙන වටිනා
මැණිකත් නුඹය...
පියාණනේ නුඹ මාගේ
පණ සේ ය...//

මාගේ දක්ෂතා දැක ඔහු
සතුටු වුණා...
දිනකදි ඔබයි මගෙ ලොව සිත
ජය ගන්නා...
ඔහුගේ එකම සිහිනය
මගෙ ජය කියලා...
ඔහු පැවසුවා කරුණා
හදවතින් සදා//

දහදිය වගුරවා අප
උස් මහත් කළ...
පියාණනේ මා ජය
ගන්නා විටක...
සිතට හැඩෙයි දුක කඳුළම
දෙමුසු කර...
පියාණනේ මතු බුදු වන
මැණික නුඹ...//

නුඹගේ පිය ගුණය වචනෙන්
කිව නො හැක...
මා ඇති දැඩි කළේ
ජීවය පරදු කොට...
භවයෙන් භවේ මගේ ම
පිය රජු වන්න...
කියලා පද පේළි නවතාලමි
මෙ මම...//

කේ.ඩී.කවින්දි නෙත්සරණි
ර/නිවි/මෙත්තාලෝක විද්‍යාලය
11 ශ්‍රේණිය
පහළ වතුපිටිය, උඩ කරවිට.



172
J.K.W.L.Jayaweera
R/St.Luke's College, Ratnapura.


173
K. Senali Iyara Silva
Ferguson high school
Grade - 6

K. සෙනලි ඉයාරා සිල්වා
Ferguson High School
Grade 07




J.K.W.L. Jayaweera
St. Luke's College, Rathnapura




අතුරලියගේ ඉෂානි හංසමාලි ජයලත්

රත්නපුර ශාන්ත ලූක්ස් විද්‍යාලය



M.P.Nethmi Akarsha
Graded 8- Kegalu Balika V.




H.R ටිනුක මෙත්නිල පීරිස්
ර/ කිරි ඇල්ල ශ්‍රී දේවරක්ඛිත ප්‍රාථමික විද්‍යාලය
2-ශ්‍රේණිය

178

அம்மாவின் பாசம்

கருணையில் தெரியும்

அப்பாவின் பாசம்

அவரது கடமையில்

புரியும்

பூமியின் மீது பாதம் பதியும் முன் தன்

நெஞ்சில் என் பாதத்தை பதித்தவர்……

அவர்கண்ட உலகை விட அதிகம்

காண்பதற்கு தன் தோளில் சுமந்தவர்…..

மீண்டும் ஒரு ஜென்மம் என்றால்

உங்களை நெஞ்சிலும் தோளிலும் சுமக்க

ஆசைப்படுகிறேன்.

**U THAKSHIKA**

**R/NIVI/HOUPE TAMIL VIDYALAYA**

179

அன்னைக்கு ஈடாக ஆளாக்கும் தந்தை
தாயென்று சொல்ல
கருவறை மட்டும்தான் உனக்கில்லை
அப்பா….

தன்னை மறப்பாய்
உறக்கம் தொலைப்பாய்
தன் வயிற்றிலே
சுமக்காது விட்டாலும்
தன் நெஞ்சிலே
காலமெல்லாம் சுமப்பாய்
பாடுபட்டே உழைப்பாய்
பங்கு போட்டுக் கொடுப்பாய்

சோதனைகள் வேதனைகள்
எது வந்தபோதும் தோள் கொடுக்கும்
தோழன்
நீயல்லவா……
வாழ்க்கையெனும் சக்கரத்தில்
வசதியாய் வாழ்வதற்கு
ஓயாமல் சுழலும்
அன்புச் சக்கரம்
நீதானே அப்பா….

மழலையில் கரம் பிடித்து
என் கனவுகளை சுமந்து
வாழ்க்கை பாதைக்கு
அழைத்துச் செல்வதும்
கனிவான கண்டிப்பும்
மறைமுக பாசமும்
கொடுத்திடும் உறவே
நீ தானே அப்பா…

வாழ்வோடு கலந்த
தந்தையின் பாசமும்
தரணியெங்கும் பேசும் மழலையின் சிரிப்பில்
மனதை தொலைத்து
வாழ்க்கையை பிள்ளைக்காய்
அர்ப்பணிக்கும் நேசமும் கொண்டவன்
நீதானே அப்பா………
இவ் வையகத்தில்
தன் குடும்பத்திற்காக
தியாகங்கள் பல செய்து வாழ்ந்து
கொண்டிருக்கும்
அன்புள்ள அப்பாக்கள் அனைவருக்கும்
வளமுடனும், நலமுடனும் வாழ்ந்திடவே ………
இனிய உலக தந்தையர் தின
நல்வாழ்த்துக்கள்



**Mrs. Nadeera Wasook**
**Kg/Mw/Thalgaspitiya Muslim M.V,**
**Aranayaka**


Volume One - © 2022 Department of education Sabaragamuwa

180

பெண்களுக்கு ஆயிரம்
உறவுகள் கிடைத்தாலும்
வாழ்நாள் முழுதும் தன் அப்பாவின்
உறவைப் போன்று ஒரு உறவை
பெறவே முடியாது கடவுள் கொடுத்த
வரம் கிடைக்கவில்லை எனக்கு கடவுளே
கிடைத்தார் வரமாக
அப்பா...............

DHANUSKA PRIYANKI
R/NIVI/HOUPE TAMIL VIDYALAYA

182

தான் தடுமாறி இருக்கும் இடத்தில்
நான் தவறிக் கூட விழக்கூடாது
என்று நினைப்பவர்
என் அப்பா......
என் அம்மா என்னை
பெற்றெடுக்கும் அந்த
நொடி மட்டுமே வருந்தினாள்.....
ஆனால்......... என் அப்பா
என்னை வளர்ப்பதற்கு
நொடிக்கு நொடி வருந்தினார் ..................
நான் உனக்கு தினம் தினம் கொடுத்த
காயங்கள்
எண்ணிப் பார்த்தால்......
உனக்கு என்னை பிடிக்கவே
பிடிக்காது......... அப்பா........
ஆனால் நான் என்ன தான் உனக்கு
காயங்களைக் கொடுத்தாலும்......
என்னைத் தவிர உனக்கு ......
வேறு யாரையும் பிடிக்காது .......
என்னை உன் வயிற்றில்
சுமக்கும் பாக்கியம் கிடைக்கவில்லை...
என்பதற்காக.......
தினம் தினம் உன் நெஞ்சில்
என்னை சுமக்கும்...!
என் மற்றொரு தாய்..
நீயே என் அப்பா...
என் ஆயுள் முழுவதும் உன்
உறவு....... நீடிக்க வேண்டும்...
இல்லையென்றால்.... உன் உறவு..
உள்ளவரை என் ஆயுள்
நீடிக்க வேண்டும்.......
என் அப்பா..................

K. ASTHIKA - R/NIVI/HOUPE TAMIL VIDYALAYA

181

நாட்கள்
உறங்காத நாட்கள்
உண்டு
ஆனால் அப்பாவை நினைக்காத
நாட்கள் இல்லை

மரணம்
மரணமே வந்தாலும்
உன்னை மறவாத இதயம்
வேண்டும்
இன்னொரு ஜென்மம் ஒன்று
இருந்தால்
நானே உங்களுக்கு மகளாக பிறக்க
வேண்டும்....

நினைவு
இமைக்கும் என் கண்கள்
அப்பாவை பார்க்காமல் இருக்கலாம்
துடிக்கும் என் இதயம் அப்பாவை
மட்டும் நினைத்துக் கொண்டு
இருக்கும் ..........

C. BIRUNTHA
R/NIVI/HOUPE TAMIL VIDYALAYA

183

இறைவனுக்கும்
அப்பாவுக்கும்
சிறு வித்தியாசம் தான்
இறைவன்
நாம் காணாத கடவுள்
அப்பா
நாம் தினம் காணும்
கடவுள்

G MATHIWADHANI
R/NIVI/HOUPE TAMIL VIDYALAYA



*என்னவென்று சொல்வது என் அப்பாவைப் பற்றி தேவையான இடத்தில் கண்டிப்பாகவும் பாசமான தருணத்தில் தோழனாகவும் குழப்பமான நேரத்தில் ஆசானாகவும் தாரை வார்த்துக் கொடுக்கும் போது - குழந்தையாகவும் இப்படி பல கோணங்களில் பார்த்து இருக்கின்றேன் நான் என் அப்பாவை நான் குறும்பு செய்த நேரமெல்லாம் என்னை அடிக்க கையோங்கிய என் சிரிப்பினில் சொக்கிப் போய் அடிக்காமல் போனீரே அன்பையும் சிறு அதட்டலோடு வெளிப்படுத்தும் என் அப்பா*
*உன் அனுபவத்தை எனக்கு அறிவுரையாக்கிய அப்பா*
*அடிபடும் போதெல்லாம் அம்மா என கத்திய நான் நிம்மதி பெருமூச்சு விடும் போதெல்லாம் அப்பாடா என்று தானே சொல்கிறேன் அது ஏனோ இன்னும் புரியாத புதிர் எனக்கு... இடுப்பிலே எனை வைத்து இமையாக காத்தவள் என்னம்மா*
*தோள் மேல் உயர்த்தி தொலைதூரம் காட்டியவர் என்னப்பா*
*நீர் என்னை என் மகன் என்று கூறும் கனங்களில் எல்லாம் எதையோ சாதித்தவை போல் உணர்கிறேன் நான் எந்தன் தந்தை நீரென்பதைவிட உந்தன் மகன் நான் என்பதில் பெருமை எனக்கு.....*
*உங்களை வர்ணிக்க வார்த்தைகள் போதாது எழுதி தீர்ப்பதென்றால் என் வாழ்நாளும் காணாது மறுபிறவி என்று இருந்தால் பிறப்போம் மீண்டும்*

R. SATHIS RAVI WARMAN(TEACHER STUDENT)
R/NIVI/HOUPE TAMIL VIDYALAYA 184

185

அன்புள்ள அப்பா ...........
மெழுகுவர்த்தியைப் போல் உருகி
எம்மை இளவரசியாக வாழ
வைக்கும்
இவ்வுலகில் மாபெரும் விந்தை
எங்கள் அப்பாவாகிய நீங்களே
எனக்கு உலகத்தை அறிமுகம்
செய்யும் தாயைப் போலவே
எம்மை உலகமே அறியச் செய்த
அப்பாக்களும் ஓர் உன்னதப்
படைப்பே
எம் கனவுகள் நெஞ்சில் சுமந்து
எம்மை வெற்றியடையச்
செய்யும்
ஒவ்வொரு தெய்வங்களுக்கும் ,
இனிய தந்தையர் தின
வாழ்த்துக்கள்

M. N. F. Nafla.
Kg/Dehi/ Thaldhuwa Muslim Maha
Vidhyalaya

186

அ என்ற சொல்லுக்கு அர்த்தமும் நீயே
நான் சிறுமியாக இருக்கும்போது என்னை கரம்
பிடித்து நடக்க வைத்ததும் நீயே
நான் அழுதால் என் முன் சேட்டைகள் செய்வதும்
நீயே என் கடவுளும் நீயே
என் பாசமுள்ள நல்ல தந்தையும் நீயே
என் வாழ்வின் முழுமையும் நீயே
அப்பா ................

அப்பா என் முதல் உருவம் நீயே
என் முதல் நண்பனும் நீயே
எனக்காக வேர்வை சிந்தி உழைத்தவனும் நீயே
என் உயிரும் நீயே
என் ஜீவனும் நீயே
என் ஆருயிர் அப்பா ..........

R. KISHANTHANI
R/NIVI/HOUPE TAMIL VIDYALAYA

187

அன்னைக்கு ஈடாக ஆளாக்கும் தந்தை
தாயென்று சொல்ல
கருவறை மட்டும்தான் உனக்கில்லை அப்பா....

தன்னை மறப்பாய்
உறக்கம் தொலைப்பாய்
தன் வயிற்றிலே
சுமக்காது விட்டாலும்
தன் நெஞ்சிலே
காலமெல்லாம் சுமப்பாய்
பாடுபட்டே உழைப்பாய்
பங்கு போட்டுக் கொடுப்பாய்

சோதனைகள் வேதனைகள்
எது வந்தபோதும் தோள் கொடுக்கும் தோழன்
நீயல்லவா......
வாழ்க்கையெனும் சக்கரத்தில்
வசதியாய் வாழ்வதற்கு
ஓயாமல் சுழலும்
அன்புச் சக்கரம்
நீதானே அப்பா....



மழலையில் கரம் பிடித்து
என் கனவுகளை சுமந்து
வாழ்க்கை பாதைக்கு
அழைத்துச் செல்வதும்
கனிவான கண்டிப்பும்
மறைமுக பாசமும்
கொடுத்திடும் உறவே
நீ தானே அப்பா...

வாழ்வோடு கலந்த
தந்தையின் பாசமும்
தரணியெங்கும் பேசும் மழலையின் சிரிப்பில்
மனதை தொலைத்து
வாழ்க்கையை பிள்ளைக்காய்
அர்ப்பணிக்கும் நேசமும் கொண்டவன்
நீதானே அப்பா.........
இவ் வையகத்தில்
தன் குடும்பத்திற்காக
தியாகங்கள் பல செய்து வாழ்ந்து கொண்டிருக்கும்
அன்புள்ள அப்பாக்கள் அனைவருக்கும்
வளமுடனும், நலமுடனும் வாழ்ந்திடவே ........
இனிய உலக தந்தையர் தின நல்வாழ்த்துக்கள்

**Mrs. Nadeera Wasook**
**Kg/Mw/Thalgaspitiya Muslim M.V,**
**Aranayaka**

188

*கருவறை உதிரம், பால்...*
*என்று தன் பங்கிற்கு*
*என்னை தயாரித்தவள் தாய்*
*என்றால்...*
*உயிர்மட்டும் ஊற்றப்பட்ட*
*உடல் ஒன்றில் உணர்வுகள்*
*என்னும் உரம் சேர்த்து*
*வளர்த்துவிட்டவன் நீ...*

*தான் கரம் பிடித்த மனைவியையும்,*
*தான் உரம் இட்ட சேய்களையும்,*
*தன் கனவுகள் கரைத்தேனும்*
*கடைசிவரை கரை சேர்ப்பவன் நீ...*

*நான் எதுவாக ஆக நினைத்தேனோ...*
*அதை நோக்கி*
*மெதுவாக போக முனைகிறேன்...*

*நான் விழுகின்ற பொழுதெல்லாம்...*
*நான் விழும்வரை பார்த்திருப்பாய்....*
*விழுந்ததன் விளக்கத்தை*
*விளக்கியபின்பே*
*என்னை தூக்கிவிடுவாய்...*
*வடுக்கள் மட்டுமே என்னை*
*செதுக்கும் என்பதால்...*

*நான் தடுமாறும் போதெல்லாம்*
*என் வெற்றி நோக்கிய தடம்*
*மாறாமல் தாங்கிப் பிடிப்பாய்...*

*நான் மண்ணாகிப் போகமுன்*
*உன் கண்ணாகி நான் என்னை*
*பார்க்கவேண்டும்...*
*நீ எப்படி என்னை பார்த்துப் பார்த்து*
*வளர்க்கிறாய் என்று...*
*என் பிள்ளைக்கும்*
*எனக்குக் கிடைத்த தந்தைபோல*
*என்னை தயாராக்க வேண்டும்...*

*இந்த தந்தையர் தினத்தில்*
*நீ இட்ட பிச்சையில் பூத்த*
*என் புன்னகைப் பூக்கள் சிலதை*
*கொத்தாக அள்ளி...*
*உன் எதிர்பார்ப்பாகிய*
*என் வாழ்வின் வெற்றிப் பக்கங்களில்*
*சிலதைக் கிழித்து*
*வடிவாக சுற்றி...*
*உன் கரங்களில் திணிக்கிறேன்...*
*உன் கன்னத்தில் என் கண்கள்*
*பனித்தபடி சில முத்தங்களும்*
*பதிக்கிறேன்...*
*"தந்தையர் தின வாழ்த்துக்கள்"*
*சொன்னபடி.....*

**S. M. F. Hamdha**
**Kg/Mw/Thalgaspitiya Muslim Maha**
**Vidyalaya, Aranayake**

# இனிய தந்தையர் தின வாழ்த்துக்கள்

சிறு வயதில் ஆசானாய் வாலிப வயதில் தோழனாய் வாழ்வில் அங்கம் வகித்து தன்னுயிரை விடவும் போற்றிக்காக்கும் இனிதான உறவே> நம் தந்தை. ஒரு தாய் பத்து மாதம் கருவரையில் சுமப்பவராவர் ..

ஆனால் ஒரு தந்தை தன் கல்லறை வரை சுமப்பவராவர். ஒரு பிள்ளை பிறக்கும் போது அம்மாக்களுக்கு இருக்கும் எதிர்பார்ப்பை விட அப்பாக்களுக்கு ஆயிரம் மடங்கு அதிகம்..

தான் தோளில் ஏற்றி தான் பார்க்காத உலகத்தை நமக்கு காட்டுவார். தந்தையின் அன்பானது தெய்வங்கள் அனைத்தை விடவும் அதிகமாகும். அம்மாக்கள்> பெண்கள் தங்களுடைய கஷ்டத்தை வெளியே சொல்லி அழுவார்கள்.ஆனால் ஆண் மகனாகிய தந்தை தன் மனதிற்குள்ளே பூட்டி வைத்து விடுவார்கள்.கோபத்தையும்> கண்டிப்பையும் வெளித் தோற்றமாகக் காட்டி அன்பு எனும் நதியை உள்ளே வைத்து மிதக்கும் அனைத்து தந்தையர்களுக்கும் தந்தையர் தின வாழ்த்துக்கள்

அன்புக்கு இலக்கணம் தாய் என்றால் அறிவுக்கு இலக்கணம் தந்தை ஆவார்.தன்னுடைய சிறு வயதில் குடும்ப வறுமை பிரச்சினையால் தான் அடைய முடியாத இலச்சியத்தை தம் பிள்ளைகள் அடைய ஒவ்வொன்றையும் பார்த்துப் பார்த்துச் செய்து மகிழ்ச்சியடைவார்> எத்தனை செல்வங்கள் வந்தாலும் தந்தையின் விரல் தான் ஆதாரம்> தலைக்கு மேல் உட்கார வைத்து அழகு பார்க்கும் அப்பாவை நாம் ஒரு நாளும் தலை குனிய விடக் கூடாது>பத்து மாதம் தான் தாய் வயிற்றில் ஆயுளுக்கும் தந்தையின் சுண்டு விரலே >தான் பட்ட கஷ்டம் >வேதனை >அவமானம் என்பவற்றை தன் பிள்ளை படக்கூடாது என நமக்காக உழைப்பவர். வார்த்தையால் வர்ணிக்க முடியாத வரலாறாகவே காணப்படுகின்றார்

ஒரு ஆண் எந்த நிலையிலும் பயப்படாதவனாலும் தன் குழந்தையின் முதல் அழுகை கேட்டு நிச்சயம் பயப்படுவான்> ஒரு ஆணினுடைய வாழ்க்கையை முழுமைப்படுத்துவதே தந்தை என்ற உறவாகும் > தந்தையர்களுக்கு பெண் பிள்ளைகள் என்றால் அதிக செல்வம் என்பார்கள். அதுவும் ஒரு வகை உண்மை தான் ஆனால் யதார்த்தமாகப் பார்த்தால் தன் பிள்ளை அனைவரையும் தன் உலகமாக எண்ணி வாழ்பவர் தான் தந்தை.. தோள் அமர்ந்து சுண்டு விரலைப் பிடித்து நடக்கும் போது அது எவ்வளவு பெரிதாக நமக்கு தெரியாது. ஆனால் வளர்ந்து பெரியவர்களானதும் அது பெரிய பொக்கிஷமாக காணப்படும். விலை கொடுத்து வாங்க முடியாத தாயின் அன்பு போலவே தந்தையின் அன்பையும் விலை கொடுத்து வாங்கவும் முடியாது. விலை குறிப்பிட்டு மதிப்பிடவும் முடியாது..

தனக்காக துடிக்காத இதயம்> தனக்காக ஓடாத கால்கள்> தனக்காக உழைக்காத கைகள்> தனக்காய் சேர்க்காத வங்கி இவை அனைத்திற்கும் சொந்தக்காரர் கடவுளின் மறு பிறப்பே தந்தை என்பவர்> தன்னுடைய சந்தோஷத்தை பெரிதும் நினையாமல் தன்னுடைய குடும்பத்திற்காகவும் தன்னுடைய பிள்ளைக்காகவும் தன் வாழ்க்கையை தியாகம் செய்பவர் தந்தை என்ற புனித உறவு> தோளில் அமர்ந்து சுண்டு விரலை பிடித்து நடந்து வந்த காலம் போய் என்றாவது ஒரு நாள் தன்னுடைய தந்தையிடம் பேசும் அளவிற்கு மாறி விட்டது இன்றைய சமுதாயம் நமக்காக நம்முடைய சந்தோஷத்திற்காக தன் வாழ்க்கையையே தியாகம் செய்யும் தந்தைகளின் ஓரிரு ஆசைகளைக் கூட நம்மால் நிறைவேற்ற முடியவில்லை என்றால் நமக்குத் தான் அவமானம்> அவர்களுக்கு வயதான காலத்தில் அவன்களுடன் பேச வில்லை என்றால் கூட பரவாயில்லை.அவர்களுக்கு ஏற்ற நேரத்தில் அவர்களுடைய தேவைகளை நிறைவேற்றினால் போதும். அவர்கள் நம்மை குழந்தையாக இருக்கையில் எவ்வாறு கவனித்தார்களோ அதே போல் அவரை நாம் குழந்தையாக பார்த்துக் கொள்ள வேண்டும்> தெய்வங்கள் எல்லாம் தோற்றே போகும் தந்தை அன்பின் முன்னே.....

அனைத்து தந்தையர்களுக்கும் இது சமர்ப்பணம்.................

S JEMIMA ANGEL
R/NIVI/HOUPE TAMIL VIDYALAYA



MAGAZINE

190


Adheesha yasas Sri samarathunga
Grade 2 - Kg/kegalu vidyalaya

191


ආර් . එම් . ලිසාරා තුලනි රත්නායක
ර/ කිරිඇල්ල ශ්‍රී දේවරක්ඛිත ප්‍රාථමික විද්‍යාලය
5 - ශ්‍රේණිය




**U.I. Mohottiarachchi**
**St. Luke's College**




K. Pushpanjali
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade -10

# W.G.Sethumi Minsara Sooriyabandara
## St.Josephs balika maha vidyalaya Kegalle

194




195
Shanuk Kawya Wickramasinghe
Ra/Emb/presidents college
Grade-2


196
W K Jinuki Amaya Weerasekara
Grade 3-R/Ferguson High School

197



A.V.Sandaru Hasantha Aluthwaththa
R/Nivi/Kalawana primary school
Grade-3

198



L.ESANDU AKASH JAYAWICKRAMA
Grade 1 -R/BATUHENA MAHA VIDYALAYA

199



L.MINAYA JAYAWICKRAMA
Grade 4 R/BATUHENA MAHA VIDYALAYA

Fathima Nuha Grade 08
KG/Dehi/ Thalduwa Muslim MV

200



201




ඩබ්.එම් රෂේන්‍යා සඳුෂි වීරසේකර

St. Joseph Balika Vidyalaya

Grade-1



T. KALAICHCHELVI
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade-7

203




නිර්මාණී e-magazine

204



Senuli Dinethma – Grade 2
St. Joseph Girl's College, Kegalle




R.Aaysha hudh
Kg/Mw/Al azhar M.M.V
Grade-8

206


J NILUKSHI
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade-9

207


HAPPY FATHERS DAY
M.B Sanithu Nethul
R/ Vidyakara Primary Sch.
Grade -2

208


FUTURE
DARKNESS
FATHER
FATHER'S SACRIFICE IS ALWAYS GREATEST
වයි.එස්.වයි පියාරා මුණසිංහ
කෑ/දෙහි/වෙලන්ගල්ල ක.වි
7 - ශ්‍රේණිය

209


Nithini Methma
R/Mahinda Vidyalaya
Grade 6

210




P.S. Ravindu Lakshan Premathilaka
Grade 8
R/Nivi/Meththaloka Vidyalaya




GV Himashi Upadya Kulathunga
Kg/Mw/Parakrama Maha Vidyalaya
Grade - 6




Y. HAMSHIKA
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade - 5




S SASIKA
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade9



අපේ ජීවිතයේ ශක්තිය ඔබයි,
ප්‍රීතිමත් පියවරුනෝගේ
දිනයක් වේවා.....

දසිනි මෙත්දාරා කුමාරසිංහ
කෑ, රංවල මහානාග ම.වි.
6-ශ්‍රේණිය

215



මිනුදි යුහස්නා වික්‍රමරත්න
ර/ගල්ලැල්ල මහා විද්‍යාලය
3-ශ්‍රේණිය

216



ආර්.ලංකේෂා නිම්සරණී රාජපක්ෂ

ආර්.ලංකේෂා නිම්සරණී රාජපක්ෂ
කෑ/බණ්ඩාරනායක ජාතික පාසල
7-ශ්‍රේණිය




K THIVAN
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade - 7




**K.V.Sadaru Rashmika Thilakarathna**
**Grade 5- K/Dehi/Imbulana Sri Sena M.V.**


219
අසෙලි සසෙනායා අබේකෝන්
ශාන්ත ජෝෂප් බාලිකා මහා විද්‍යාලය (ප්‍රාථමික අංශය)
1-ශ්‍රේණිය


220
Abdullah Risvi
Grade 8 kg/Mw/Baduriya National school
June-19
Happy fathers' Day.

221




G LINGESWARAN
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade-7

222



Raneesha Tharumini
R/Gallella M.V.
Grade4




S. SIVANI
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade-9


224
S. NAYOMI PRAVEENA
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade-9
இனிய
தந்தையர்
தின
வாழ்த்துக்கள்
கை தட்டி நான்
அழைக்க கட்டி முத்தம்
தருவாயே .. கை விரல்
பிடிக்கும் நொடியில் என்
உலகை முழுதாய்
கண்டேனே...
S.நயோமி பிரவினா
இ/நிவி/ஹவுப்பே தமிழ்
வித்தியாலயம்
09



K.K. Sonuthi Sonalya Kandege.
K / St. Joseph's Balika M.V.
Grade - 1

M.N.Mariyam
Sulaimaniya Central College
Grade-7




L. SANJANA JAYAWICKRAMA
R/BATUHENA MAHA VIDYALAYA




S. SPEJANI
R/NIVI/HOUPE TAMIL VIDYALAYA
Grade-9

# FAQ

**නිර්මාණී ඉදිරි කලාප වෙත නිර්මාණ යොමුකළ හැක්කේ කෙසේ ද?**

**071 994 8853/ 071 952 2894 /071 817 9565**

මෙම දුරකථන අංක වෙත whatsapp පණිවිඩයක් යොමු කර නිර්මාණී ලේඛක මණ්ඩල සමූහයට එක්වන්න

**නිර්මාණ යොමු කළ හැක්කේ සබරගමු පළාතේ නිර්මාණකරුවන්ට පමණ ද?**

නැත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඕනෑම අයෙකුට නිර්මාණ එවිය හැක

**ඒ ඒ කලාපයන් හී තේමාව දැනගන්නේ කෙසේ ද?**

www.enenapiyasa.lk වෙබ් අඩවියට පිවිසෙන්න එසේම සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිල සමාජ ජාල මාධ්‍ය හා සම්බන්ධ වන්න

**නිර්මාණී යනු කාව්‍ය නිර්මාණ සංග්‍රහයක් ද?**

නැහැ , තේමාවට අදාළ ඕනෑම නිර්මාණයක් එවිය හැකි ය




All rights reserved - 2022
Sabaragamuwa Provincial Deparatment of Education